

වාර්ෂික වාර්තාව

2019



ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

පටුන

- සම්බන්ධීකරණ තොරතුරු..... 01
- දැක්ම සහ මෙහෙවර 02
- සංස්ථාමය තොරතුරු 03-07
- සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව..... 08-37
- මූල්‍ය වාර්තා 38-41
    - මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....38
    - ආදායම පිළිබඳ ගිණුම් ප්‍රකාශය..... 39
    - ස්කන්ධය මත වෙනස්වීම් පිළිබඳ ගිණුම් ප්‍රකාශය..... 40
    - මුදල් ප්‍රවාහ ප්‍රකාශය..... 41
- ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්..... 42-58
- විගණකාධිපති වාර්තාව..... 59-78
- විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ආයතන ගත් ක්‍රියාමාර්ග.....79-92



ප්‍රධාන කාර්යාලය
අංක 21, මීරානියා වීදිය (බීසීසී පරිශ්‍රය)
කොළඹ 12, ශ්‍රී ලංකාව
දුරකථන: 011 5757539
ෆැක්ස් : 011 2438635
විද්‍යුත් තැපෑල : slspc@sltnet.lk
වෙබ් අඩවිය : www.slspc.lk

ප්‍රාදේශීය කාර්යාලය
ප්‍රාදේශීය කාර්යාලය
ගල්පිහිල්ල, පන්විල.

දුරකථන: 081 5634903
ෆැක්ස්: 081 5634902
විද්‍යුත් තැපෑල regionalofficegp@gmail.com

විගණනකරුවන්
විගණකාධිපති
306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.


දැක්ම සහ මෙහෙවර
දැක්ම
වැවිලි ක්ෂේත්‍රයේ රජය සතු
ප්‍රබලතම වාණිජ
ව්‍යවසායකත්ව ආයතනය
බවට පත්වීම
මෙහෙවර
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වත්කම් සේවක සහභාගිත්වයෙන් නිසි
කළමනාකරණය කරමින් රටේ දළ දේශීය නිෂ්පාදිතයට සහ වතු සේවක
පවුල්වල සහ අසල්වැසි ගම්මානයන්හි යහ සාධනය ඇති කිරීමට උපරිම
දායකත්වයක් ලබාදීම

අධ්‍යක්ෂ මණ්ඩලය **2019**

නම	**තනතුර**
• එම්. ජී. ජී. තිලකසිරි මයා	සභාපති/ප්‍රධාන විධායක නිලධාරි
• පෙරුමාල් රමේෂ් මයා	මණ්ඩල සාමාජික / ක්‍රියාකාරී අධ්‍යක්ෂ
• ඒ.ජේ.එම්.ඩී.පී.බී අවිරුප්පොල මයා	මණ්ඩල සාමාජික/ (2019 පෙබරවාරි සිට දෙසැම්බර්)
• එච්. ජී. ටී. ප්‍රසංගිකා මිය	භාණ්ඩාගාර සාමාජිකා (2019 මැයි සිට දෙසැම්බර් දක්වා)
• ඒ.ලක්කදාස් මයා	අමාත්‍යාංශයේ නිරීක්ෂක (2019 ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා)
• ඩී.ආර්.බී රත්නායක මයා	මණ්ඩල සාමාජික (2019 අගෝස්තු සිට දෙසැම්බර්)
• එස්. රාජරත්නම් මයා	මණ්ඩල සාමාජික (2019 අගෝස්තු සිට දෙසැම්බර්)
• ඊ්.එම්.ඩී.ඩබ්.ඒ.එස්.කේ අමුණුගම මයා	මණ්ඩල සාමාජික ((2019 අගෝස්තු සිට දෙසැම්බර්)
• ඩී.වී.ජී. ප්‍රයංකර මයා	මණ්ඩල සාමාජික (2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)
• ඩබ්ලිව්.කේ.එම්.එම්. කැළුම් සංජීව මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)

විගණන කමිටුව - 2019

නම	**තනතුර**
• එච්. ජී. ටී. ප්‍රසංගිකා මිය	කමිටු සභාපති, මහා භාණ්ඩාගාරය
• ඒ.ජේ.එම්. ඩී.පී.බී අවිරුප්පොල මයා	කාරක සභික
• ඊ්.එම්. ඩී.ඩබ්.ඒ.එස්.කේ අමුණුගම මයා	කාරක සභික
• කේ.ඒ.සී ශාමන්ත පෙරේරා මයා	අභ්‍යන්තර විගණක/කමිටු සාමාජික (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශය)
• පී.ඩී මනෝජ් පී කුමාර මයා	විගණන අධීක්ෂක / නිරීක්ෂණ නිලධාරි (විගණකාධිපති දෙපාර්තමේන්තුව)
• එච්. එන්.පී ජිනසේන මයා	සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
• එස්.අයි. එම්. හසන් මයා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය), ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
• ඊ්.ආර්.අයි.බී.එස් සම්පත් බණ්ඩාර මයා	අභ්‍යන්තර විගණක, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

කළමනාකරණය - ප්‍රධාන කාර්යාලය -2019

නම	තනතුර
• එම්. ජී. ජී. තිලකසිරි මයා	සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
• එච්.එන්.පී.ජිනසේන මයා	සාමාන්‍යාධිකාරී
• ජේ. එච්. අයි. ජයසුන්දර මයා	වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -පරිපාලන
• එස්. අයි. එම්. හසන් මයා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය
• කේ.ඒ.එච්. ඩී පෙරේරා මිය	කළමනාකාරිය - සාමාන්‍යාධිකාරී අංශය (08/07/2018-01/07/2019)
• කේ. මුණසිංහ මයා	කළමනාකරු-නීති
• කේ.ඒ.එච්. ඩී පෙරේරා මිය	කළමනාකාරිය - ප්‍රසම්පාදන (01/07/2019 සිට)
• ඩබ්ලිව්.ඩී.ඩබ්ලිව්.කීර්ති මයා	කළමනාකරු- අලෙවිකරණය
• ඊ.ආර්.අයි.බී.එස්.එස් බණ්ඩාර මයා	අභ්‍යන්තර විගණක (2018.08.01 සිට)
• ගයාන් යාපා මයා	සහකාර කළමනාකරු - ප්‍රවාහන
• ජී.ඩී.එස්.සී සුදසිංහ මෙනවිය	සහකාර කළමනාකරු (පරිපාලන / මානව සම්පත් - කොන්ත්‍රාත්)
• පී. වී. ප්‍රදීප් මයා	සහකාර කළමනාකරු- ඉඩම්
• එච්.එම්.එස්.එන් හේරත් මිය	සහකාර කළමනාකරු (අලෙවි)
• ආර්.ජී.එස්.එච්. ගුණතිලක මයා	ගණකාධිකාරී
• පී.සී.ජේ. පනාගොඩ මයා	සහකාර ගණකාධිකාරී
• කුරුප්පු මහතා මයා	විගණන නිලධාරී
• එල්.ඩබ්ලිව්. සිරිරත්න මයා	වැඩ බලන විගණන නිලධාරී
• එන්.එස්. අනුරාධනායක මිය	නීති නිලධාරී (01/10/2019-20/12/2019)
• ජේ.බී.සී. ෆොන්සේකා මයා	පරිපාලන නිලධාරී

කළමනාකරණය - වැවිලි 2019

නම	තනතුර
• එස්.ද කොස්තා මයා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැවිලි - කොන්ත්‍රාත්)
• ආර්.සී. කහවිට මයා	කළමනාකරු (වැවිලි)
• ඩබ්ලිව්.ඒ.ඩී.පී.විජේසිංහ මයා	වැඩබලන කළමනාකරු (වන)
• ටී.මොරහැල මිය	සහකාර ගණකාධිකාරී
• වයි. ඒ. ටී. බී. වඩුගොඩපිටිය මයා	අධිකාරි - අලකොල රාජ්‍ය වතුයාය
• එස්.වයි. ලියනගේ මයා	අධිකාරී - කොටගහ රාජ්‍ය වතුයාය
• ටී. එම්. පී. ජී. අයි. තෙන්නකෝන් මයා	අධිකාරි - ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය
• ආර්. ඒ. එම්. දයාරත්න මයා	අධිකාරි - ගෝමර රාජ්‍ය වතුයාය
• ජී. ඩබ්. ජී. විජේරත්න මයා	අධිකාරි - ඕපල්ගල රාජ්‍ය වතුයාය
• ටී. ආර්. එච්. හේවගේ මයා	අධිකාරි - හාගල රාජ්‍ය වතුයාය
• කේ.ඩී.එම්.පි වීරසිංහ මයා	අධිකාරි - හෙයාර්පාක් රාජ්‍ය වතුයාය
• ආර්. ඒ. ආර්. එම්. රණවක මයා	අධිකාරි - හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය
• පී. අයි. එල්. පෙරේරා මයා	අධිකාරි - කැලැබොක්ක රාජ්‍ය වතුයාය
• ඩබ්. ටී. කේ. සමරතුංග මයා	අධිකාරි - මිඩ්ලන්ඩ්ස් රාජ්‍ය වතුයාය
• ඒ. සී. අබේවර්ණ මයා	අධිකාරි - රංගල රාජ්‍ය වතුයාය
• අයි.ඩබ්ලිව්.ආර් ජයවර්ධන මයා	වලහන්දුව රාජ්‍ය වතුයාය
• ඩී .ඩබ්ලිව්.ටී. සී දන්තසිංහ මයා	අධිකාරි - වෛතලාව රාජ්‍ය වතුයාය
• එම්.එම්.එම්.සී.බී ඇහැලමල්පේ මයා	අධිකාරි - වුඩ්සයිඩ් රාජ්‍ය වතුයාය
• සී.එස්.එස්.එම්.දිසානායක මයා	අධිකාරි - නිකොලොය රාජ්‍ය වතුයාය
• සී.ජේ දසනායක මයා	අධිකාරි (විදේශ නිවාඩු)
• සී.එච්.එච්.කේ.ජී. ලක්රුවිර මයා	ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී (කුඩාඔය රාජ්‍ය වතුයාය)
• ජී.කේ.ආර්.බී. කිරිඇල්ල මයා	අධිකාරි (විහාරගල රාජ්‍ය වතුයාය- නීඩ්වුඩ් කොට්ඨාසය)

සංවිධාන ව්‍යුහය

රූපය 01 – සංවිධාන ව්‍යුහය



ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාලය සහ වතුයායන්හි කාර්යමණ්ඩලය		
HM 2-1	සාමාන්‍යාධිකාරී	1
HM 1-1	නි.සාමාන්‍යාධිකාරී - මූල්‍ය, පාලන	3
MM 1-1	කළමනාකරු -නීති, පාලන, ඉඩම, වැවිලි, අලෙවිකරණ, ප්‍රසම්පාදන, අභ්‍යන්තර විගණක,ගණකාධිකාරී, වතු අධිකාරී	21
JM 1-1	විගණන නිලධාරී, සහකාර ගණකාධිකාරී, සහකාර කළමණාකරු - ප්‍රවාහන, අලෙවිකරණ, පාලන, සහකාර වතු අධිකාරිවරු, පරිපාලන සහකාර	24
MA 5-2	පුද්ගලික සහකාර-සභාපති සහ පුද්ගලික සහකාර-සාමාන්‍යාධිකාරී	2
MA 1-1	කළමණාකරණ සහකාර	30
PL 3	රියදුරු	5
PL 1	ආයතන සහකාර	3
එකතුව		89

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු ශ්‍රී ලංකාවේ තේ වතු ව්‍යාප්තිය

රූපය 02- ශ්‍රී ලංකාවේ තේ වතු ව්‍යාප්තිය



සභාපතිතුමාගේ සමාලෝචනය



2020 වර්ෂයේ පෙබරවාරි මස, මා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපති ධුරයේ වැඩ භාර ගන්නා විට 2016 වර්ෂය දක්වා පමණක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබූ අතර, 2017, 2018 හා 2019 යන වර්ෂයන්හි, අවසන් ගිණුම් සකස්කර නොතිබුණි. ඒ අනුව, එම වර්ෂයන්හි වාර්ෂික වාර්තා පිළියෙල කිරීම කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් මා විසින් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2018 වර්ෂයේ අලාභය රුපියල් මිලියන 147.7 ක් වන අතර, 2019 වර්ෂයේදී අලාභය රුපියල් මිලියන 329.8 ක් බවට පත් වී ඇත. වාර්ෂික ඇස්තමේන්තුවට අනුව රුපියල් මිලියන 261.1 ක ලාභයක් අපේක්ෂා කර ඇත. පෙර වර්ෂයට වඩා 123.29% ප්‍රමාණයකින් අලාභ තත්ත්වය වැඩිවී ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2018 වසරේ දී කිලෝග්‍රෑම් 572,318 ක් වූ මුළු තේ නිෂ්පාදනය 2019 වසර තුළ දී කිලෝග්‍රෑම් 539,672ක් දක්වා 5.7% කින් අඩු වී ඇත. එලෙසම 2018 වසරේ දී නිමි තේ කිලෝග්‍රෑම් 01 ක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය රු.583.1 ක් වන අතර 2019 වසරේ දී රු 676.9 ක් වේ.

වතුවල අඩු ඵලදායීතාව, අලෙවි අලාභ, කර්මාන්තශාලාවල ඉහළ නිෂ්පාදන පිරිවැය, සංස්ථාවේ මූල්‍ය අස්ථායීතාව කෙරෙහි හේතු වී ඇත. මේ අතර, පරිපාලනමය ,ප්‍රසම්පාදන ගැටළු සහ වන කළමනාකරණ සැලැස්මට අනුව දැව හෙලීම සඳහා අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම යනාදී කරුණු හේතු කොට ගෙන දැව සඳහා ගස් විකිණීම පහත වැටී ඇත. ප්‍රමාණවත් ආදායමක් හා ප්‍රතිපාදන උත්පාදනය කර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන්, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අවශ්‍ය යෙදවුම් ප්‍රමාණවත් පරිදි සැපයීමට නොහැකි වී ඇති අතර, තේ කර්මාන්තශාලා නිරන්තරව නඩත්තු කිරීමට සහ නවීකරණ කටයුතු කිරීමට අපොහොසත් වී ඇත. ඒ හේතුවෙන් පසුගිය වසර කිහිපය මුළුල්ලේම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අලාභ තත්ත්වයක් වාර්තා කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන් ලෝක උරුමයක් වන නකල්ස් රක්ෂිතය වටා පිහිටා ඇති බැවින් ඉතා සුන්දර ස්ථාන රාශියක් අප වතුයායන් තුළ පිහිටා ඇත. රිවර්ස්ටන් පිවිසුම් මාර්ගය, දන්කන්ද වැව හා කඳවුරු භූමිය, 360^0 දර්ශන පථය, තැලිය වැටුන ඇල්ල, ජෝඩු ඇල්ල, සාරි ඇල්ල, වැවතැන්න කඳවුරු භූමිය හා ජලාශය ඇතුළු අලංකාර භූ දර්ශන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන් තුළ පිහිටා ඇත. දැනට මෙම ස්ථාන නැරඹීමට දේශීය හා විදේශීය සංචාරකයන් විශාල පිරිසක් පැමිණෙන අතර, ඔවුන්ට අවශ්‍ය ඉතා සීමිත පහසුකම් සැපයීමෙන් දැනට යම් ආදායමක් සංස්ථාව ලබන අතර, වඩාත් හොඳ සේවා පහසුකම් සැපයීම මඟින් ඉහළ ආදායමක් ලබා ගත හැකි බව මාගේ නිරීක්ෂණයයි.

2020 වසරේ සැප්තැම්බර් 30 දිනට පෙර නිමකළ යුතු වූ 2019 වසරේ වාර්ෂික වාර්තාව වසර ගණනාවක සිට නියමිත දිනට වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීමට නොහැකිවීම මත වසර දෙකක් ප්‍රමාද විය. 2021 වසර වන විට නියමිත දිනට වාර්ෂික ගිණුම් අවසන් කර 2019 වසරේ වාර්ෂික වාර්තාව සකස්කළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වත්මන් කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පිරිනමමි.

ඒ අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

නීතිඥ ශ්‍රීමාල් විජේසේකර
සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

සංස්ථාපිත පසුබිම

නීතිමය පිහිටුවීම

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 1958 දී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත අංක 4 යටතේ පිහිටුවන ලද අතර පසුව 1962 අංක 12 සහ 1979 අංක 49 දරන පනත් මගින් සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ඓතිහාසික පසුබිම

1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවා ඇති අතර, ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පවරා දෙනු ලැබූ වතුයායන් සහ රජය සතු වගාකල බිම් සංවර්ධනය කර නගාසිටුවීමත්, වගාව මනා ලෙස කළමනාකරණය කිරීමත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ විය. තවද, ඉඩම් කොමසාරිස් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්තුමා විසින් පවරා ගන්නා ලද වතුයායන් කළමනාකරණය කර පවත්වාගෙන යාමට පවරාදීමද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ තවත් අරමුණක් විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ආරම්භයේ සිටම ක්‍රියාත්මක වූයේ රජයට පවරා ඇති වතු කිහිපයක් සමඟ බැවින්, සංස්ථාව පිහිටුවීමේ අරමුණ ඉතා හොඳින් ක්‍රියාත්මක විය. එබැවින් කෙටි කාලයක් තුළ හෙක්ටයාර 15,000 ක පමණ වතු මිලදී ගැනීමට හැකි විය. ශක්තිමත් පනතක් මගින් ස්ථාපිත කිරීම සහ ඒ අනුව නිසි කළමනාකරණය මෙම වර්ධනයට හේතු විය.

1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ සහ 1975 සංශෝධිත පනත යටතේ ජනසතු කරන ලද වතුවලින් වතු 250ක් පමණ සහ පවතින භාරයන් අවලංගු කිරීම නිසා අත්පත් කරගත් වතුවලින් වතු 250ක් පමණ එතෙක් හිමිව තිබූ වතු 25ක් පමණ පවත්වාගෙන ගිය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සංවර්ධනය හා නගාසිටුවීමේ අරමුණ පෙරදැරිව හිමිකර දෙන ලදි. එලෙසම අත්පත් කරගත් අනෙකුත් වතු ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පිහිටුවීමෙන් පසු එය වෙත පවරාදී ඇත.

විශාල වශයෙන් පුළුල් කළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වැඩිදියුණු කිරීමට කළමනාකරණ ව්‍යුහය වෙනස් කිරීමට අවශ්‍ය විය. එමනිසා වතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා 1977 දී බලයට පත් රජය විසින් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ඇත. ඒ අනුව වතු පරිපාලනය විමධ්‍යගත විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත 1979 අංක 4 දරන පනත මගින් සංශෝධනය කර ඇත. එම පනතේ 2 වැනි වගන්තියට අනුව ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යන නම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ලෙස සංශෝධනය විය.

තවද, 1979 අංක 49 (සංශෝධිත) පනතේ අංක 6 වැනි වගන්තියට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගමේ අරමුණු පහත පරිදි පුළුල් වී ඇත.

අ) නිසි කෘෂිකාර්මික කළමනාකරණයකින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා වතු ඉඩම් ප්‍රවර්ධනය කිරීම.

ආ) ඉඩම්වල පවතින වගාවන් ප්‍රතිසංස්කරණය කිරීමෙන් නිසි කළමනාකරණයක් සහ සම්බන්ධීකරණයක් ඇතිව කෘෂිකාර්මික වගාවන් විවිධාංගීකරණය කිරීම.

ඇ) කෘෂිකාර්මික නිෂ්පාදන සැකසීම සහ විකිණීම.

ඈ) වතුවල සත්ව පාලනය සංවර්ධනය.

ඉ) වතුවල කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණ ස්ථාපිත කිරීම සහ හොඳින් නඩත්තු කිරීම.

ඊ) වැවිලි සංස්ථාවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සහ කළමනාකරණය සඳහා අවශ්‍ය සියලුම ක්‍රියා පටිපාටි සහ ක්‍රියාකාරකම් සිදු කිරීම.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතු කළමනාකරණය සහ විමධ්‍යගත ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා 1980 වර්ෂය තුළ බොහෝ පියවර ගන්නා ලදී. ඒ අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතට පත්ව ඇත. 1980 පෙබරවාරි මාසයේදී ප්‍රාදේශීය කාර්යාලවල කාර්යසාධනය වැඩි කිරීම සඳහා වැඩි බලතල සහිත ප්‍රාදේශීය මණ්ඩල හතරක් පිහිටුවන ලදී. ඒවා SLSPC I, II, III සහ IV ලෙස නම් කර ඇත. 1984 දී මෙම ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කරමින් බලංගොඩ සහ මාතලේ අවට වතු නිසිලෙස කළමනාකරණය කිරීම සඳහා SLSPC V සහ VI ලෙස නම් කරමින් තවත් මණ්ඩල දෙකක් ස්ථාපිතකර ඇත. මේ ආකාරයට වතු කළමනාකරණය විමධ්‍යගත කළද ප්‍රතිපත්ති සම්පාදනය, අලෙවිකරණය, ගබඩාකරණය සහ මූල්‍ය කටයුතු කොළඹ පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි නීතිගත සංස්ථාවේ මධ්‍යම මණ්ඩලය මගින් සිදු කරන ලදී.

මෙම ප්‍රතිසංස්කරණවල අකාර්යක්ෂමතාවය සහ අඩු ඵලදායිතාව අවබෝධ කර ගැනීමෙන් පසුව රජය 1992 දී රාජ්‍ය සංස්ථා සහ දේපළ පෞද්ගලික සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ වැවිලි සමාගම් 22ක් පිහිටුවන ලදී. එම ප්‍රාදේශීය වැවිලි සමාගම් 22 වෙත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ලාභදායී සහ ඉහළ කෘෂිකාර්මික ඵලදායිතාවයක් සහිත වතු 402 දිගුකාලීන බදු පදනම යටතේ පවරා දී ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ඉතිරිව තිබුණේ දිගුකාලීන පාඩු ලබන උඩරට සහ පහතරට තේ වල ඇති ලාක්ෂණික ගුණාංග නොමැතිකම හේතුවෙන් අඩු විකුණුම් මිලක් සහිත මැදරට තේ නිෂ්පාදනය කරන වතුයායන් 55ක් පමණි. මෙම වතු 55 න් වතු 32 ක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් විය. මෙම වතු 32 න් වතු 11 ක් 1993 දී සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමට පවරා දී ඇත. ඒ අනුව, ඉතිරි වතු 11 ක් ඒකාබද්ධ කර වතු 16 ක් පිහිටුවා ඒවා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට යටත් කර ඇත. මෙම වතුවල විශාල ප්‍රදේශයක් පැරණි බීජ තේ වලින් සමන්විත වන අතර මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල නකල්ස් කඳුවැටිය අවට ඉඩම් දුර්වල පස් තට්ටුවකින් සමන්විත වේ. එම නිසා මෙම මැදරට වතුවල ස්වභාවිකව කොළ පැහැති දළු අස්වැන්න ඉතා අඩු මට්ටමක පවතී. වෙළෙඳ පොළ මිල පහළ මට්ටමක පැවතීම සහ අස්වැන්න අඩු මට්ටමක පවතින බැවින් මෙම වතු දිගුකාලීන පාඩු සහිත වතු ලෙස සැලකේ.

එසේම 1992 වර්ෂයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සියලුම කාර්ය මණ්ඩලයම විශ්‍රාම ගැන්වීමෙන් සියලු කටයුතු නවතා දමා තිබුණි. 1994 දී නව කාර්ය මණ්ඩලයක් බඳවා ගනිමින් මෙහෙයුම් නැවත ආරම්භ කර ඇත. එදා සිට 2006 වර්ෂය දක්වා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ද රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථයට යටත් කර තිබුණි. 2001 සිට 2004 දක්වා කාලය තුළ පාඩු ලබන මෙම සංස්ථාව රජයට බරක් ලෙස සැලකේ. එබැවින් රජයට බරක් වීම අවම කර ගැනීමේ අරමුණින් සමහර වතු සහ වත්කම් දිගුකාලීන බදු පදනම මත ලබා දී ඇත.

ආයෝජන මණ්ඩලයේ නිර්දේශය යටතේ ඇතැම් ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයට බදු දී තිබූ වෛතලාව, වුඩ්සයිඩ්, හෙයාර්පාර්ක්, කොටගහ කර්මාන්තශාලාව වැනි වතු එම ව්‍යාපෘති අසාර්ථක වීම නිසා බදු දුන් පාර්ශව විසින් අත්හැර දමා ඇත. පසුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හෙයාර්පාර්ක් වත්ත සහ කොටගහ කර්මාන්තශාලාව වගකීම් රැසක් සමඟ පවරා ගැනීමට සිදු විය. අයහපත් කළමනාකරණය හේතුවෙන් අනවසර අත්පත් කර ගැනීම් සහ නඩත්තු නොකිරීම හේතුවෙන් වතුයාය වඩ වඩාත් පාඩු ලබන ආකාරය අත්හැර දැමූ හෙයාර්පාර්ක් වත්තෙන් මනාව පිළිබිඹු විය. පසුව වෛතලාව සහ වුඩ්සයිඩ් වතු වෙනත් පෞද්ගලික සමාගමකට පවරා දුන් අතර නිසි කළමනාකාරීත්වය නොමැතිකම හේතුවෙන් එම සමාගම වුඩ්සයිඩ් වත්ත අතහැර වෛතලාව වත්ත පමණක් තම පාලනය යටතේ තබාගෙන ඇත.

2006 දී රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් කර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව රාජ්‍ය ව්‍යවසායක ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථයෙන් බැහැර කර උපාය මාර්ගික ව්‍යවසායකයින්ගේ ආයතනයේ විෂය පථයට යටත් කරමින් රජයේ උපායමාර්ගික සංවිධානයක් ලෙස කළමනාකරණය කිරීමට නව ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. කළමනාකරණය. උපාය මාර්ගික ව්‍යවසායක කළමනාකරණ ආයතනයේ මැදිහත්වීම යටතේ තේ වගාවන් වෙනස් වූවා සේම මෙම වතු පරිපාලනය කිරීමේ ක්‍රමවේදයද වෙනස් විය. ඒ අනුව වතුයායේ වත්කම් කළමනාකරණය පිළිබඳ නව සංකල්පයක් හඳුන්වා දී ඇත. සංස්ථාවේ විවිධ වත්කම් එනම්, දැව සම්පත රු. මිලියන 3000ක් වන අතර, කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉදිකිරීමට ශක්‍යතාවක් ඇති ස්ථාන, කාබන් තිරකිරීම ගණනය කිරීම මගින් අලෙවි කිරීම සහ පාඩු ලබන වතුවල බෝග විවිධාංගීකරණය කිරීම මෙම නව සංකල්පය යටතේ හඳුනාගෙන ඇත.

2007 වසරේ නකල්ස් ලෝක උරුම ගැසට් පත්‍රය සමඟින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත්ව තිබූ ඉඩම් ප්‍රමාණයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මෙම ලෝක උරුමයට නතුවිය. ඒ අනුව වාණිජ වනවගාව, එනසාල් වගාව ඇති ඉඩම් මෙන්ම තේ වගාව ඇති ඉඩම් ද නකල්ස් රක්ෂිතය යටතට පත්ව ඇත. කෙසේවෙතත්, ඉඩම් ප්‍රමාණය රක්ෂිතය යටතට පත් වූ නිසාත් මායිම් අවිනිශ්චිත වූ නිසාත් වතු කළමනාකරණය මෙන්ම රක්ෂිතය කළමනාකරණය කිරීම ගැටලු සහගත විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වඩාත් ආකර්ෂණීය ස්ථාන

කැලෑබොක්ක 360^0 දර්ශන පථය (වීව් පොයින්ට්)





කැලෑබොක්ක 360^0 වීව් පොයින්ට් (උස: මීටර් 1,175) ප්‍රවනතා ගමනාන්තයක් බවට පත් විය. කඳු මුදුන මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල මායිමේ පිහිටා ඇති අතර හත්ලේ කුඩා ලෝකාන්තය සහ හුන්නස්ගිරිය කන්ද සෑදෙන එකම කඳු මුදුන බෙදා ගනී. කඳුවැටිය උතුරට විහිදෙන අතර නකල්ස්හි බටහිර ස්කන්ධය සමඟ සම්බන්ධ වේ. පැහැදිලි දිනයක, නරඹන්නන්ට මධ්‍යම කඳුකරය, මහනුවර නගරය, සෙම්බුවත්ත වැව සහ නකල්ස් කඳුකරය නිරීක්ෂණය කළහැකි ආකර්ෂණීය ස්ථානයකි.

අමුත්තන්ට නවාතැන් ගැනීමට කඳවුරු බිමක් සහ වතු බංගලා 02ක් ඇත. පැතලි කඳු මුදුනේ මැද භාගයේ නිම කරන ලද හින්දු සිද්ධස්ථානයක් සහ දර්ශන භුක්ති විඳීමට කුරු භාවිතයෙන් සාදන ලද පැල්පතක් ඇත. දහවල් කාලයේදී ප්‍රදේශය ආවරණය වන පරිදි මීදුම නිසා බාධාවකින් තොරව දර්ශන භුක්ති විඳීමට උදෑසන සංචාරය කිරීම වඩා යෝග්‍ය වේ.

බර්න්සයිඩ්





මහනුවර පිහිටා ඇති, බර්න්සයිඩ් බංගලාව රංගල පොල්ගොල්ල ජලාශයේ සී ප්ලේන් ගුවන් තොටුපළේ සිට සැතපුම් 13 ක් දුරින් පිහිටා ඇති ආකර්ෂණීය ස්ථානයකි.

<u>දන්කන්ද වැව - මීඩ්ලන්ඩ්ස්</u>





දර්ශනීය දන්කන්ද වැව මධ්‍යම පළාතේ ජලාශයක් වන අතර එහි උස මීටර් 957 කි. මෙම දන්කන්ද වැව, කිරිමැටියාරන්දට සහ දංකන්ද වත්තට ආසන්නව සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මීඩ්ලන්ඩ්ස් වතුයායට නුදුරින් පිහිටා ඇත.

<u>හුන්නස්ගිරිය</u>





මහනුවර නගරයේ සිට කිලෝමීටර 22ක දුරින් හා මාතලේ දිස්ත්‍රික්කයේ ඇල්කඩුව ගම්මානයට ආසන්නයේ පිහිටි නකල්ස් කඳු පංතියත් හුන්නස්ෆෝල්ස් දිය ඇල්ලත් දෙස් විදෙස් සංචාරකයින්ගේ සිත්ගත් ආකර්ෂණීය ස්ථානයකි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය මඟින් මෙම දිය ඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයින් සඳහා පහසුකම් සලසා දී ඇත.

වැවතැන්න - වූඩ්සයිඩ්







වැවතැන්න කඳවුරු භූමිය, මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයෙහි මැදමහනුවර ප්‍රදේශයේ පිහිටා ඇති වූඩ්සයිඩ් රාජ්‍ය වතුයායෙහි පිහිටා ඇති අතර මහනුවර නගරයේ සිට කිලෝමීටර 37.9ක දුරින් පිහිටා ඇත. මෙම සුන්දර කඳවුරු භූමියවෙත යන මාවත තරමක් දුෂ්කර වුව ද එය ඉතා සුන්දර අත්දැකීම් බහුල ගමනකි. මහනුවර සිට වැවතැන්න දක්වා යන අතරමහදී විස්මිත සහ ලෝක ප්‍රසිද්ධ වික්ටෝරියා වේල්ල (ඩෑම්) හමුවීම ද තවත් අපූර්වත්වයකි.

සම්බන්ධීකරණ තොරතුරු

සම්බන්ධීකරණ නිලධාරි : අමිල ජයවර්ධන මහතා
සම්බන්ධීකරණ මධ්‍යස්ථානය : ප්‍රාදේශීය කාර්යාලය
ලිපිනය : ප්‍රාදේශීය කාර්යාලය,
ගල්පිහිල්ල, පන්විල.
දුරකථන අංකය : 081-5634903
ෆැක්ස් අංකය : 081-5634902
විද්‍යුත් තැපෑල : regionalofficegp@gmail.com

2019 වර්ෂය තුළ රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් පාලනය වන වතුයායන්හි තත්ත්වය

2019 ආරම්භයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි කළමනාකරණය යටතේ වතු 15 ක් තිබූ අතර ඉන් වැවිලි 14 ක් මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති අතර, වලහන්දුව වතුයාය ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

වගුව 01- වතුයායන්හි විස්තර

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

අංකය	වතුයායේ නම	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මුළු විශාලත්වය (හෙක්.)
1	අලකොල	මහනුවර	පන්විල	819.86
2	කොටගහ	මහනුවර	මැදදුම්බර	1,059.81
3	ගල්පිහිල්ල	මහනුවර	පන්විල/ කුණ්ඩසාලේ	761.24
4	ගෝමර	මහනුවර	පන්විල	731.13
5	හාගල	මහනුවර	පන්විල	449.49
6	හෙයාපාර්ක්	මහනුවර	උඩුකුඹුර	976.75
7	හුන්නස්ගිරිය	මහනුවර	උකුවෙල	739.72
8	කැලැබොක්ක	මහනුවර	පන්විල	1,370.36
9	කුඩාඔය	මාතලේ	රත්තොට	36.00
10	මිඩිලන්ඩිස්	මාතලේ	රත්තොට	1,221.31
11	නිකොළය	මාතලේ	පල්ලේතැන්න	332.41
12	ඔපල්ගල	මහනුවර	මැදදුම්බර	723.10
13	රංගල	මහනුවර	මැදදුම්බර	630.60
14	වෙතලාව	මහනුවර	මැදදුම්බර	551.05
15	විහාරගල	බදුල්ල	හල්දුම්මුල්ල	41.90
16	වුඩ්සයිඩ්	මහනුවර	මැදදුම්බර	472.75
17	වලහන්දුව	ගාල්ල		96.22
	එකතුව			**11,013.70**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන් පිළිබඳ සාරාංශය

වගුව 02 - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මිල දී ගෙන ඇති වතුයායන්

වතුයාය	මිල දී ගත් දිනය	භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
හපුගස්තැන්න	1/1/1972	1709.31
අළුපොළ	1/1/1972	1228.74
ගලබොඩ	1/1/1972	376.92
හල්ගොල්ල	1/1/1972	1006.88
රාස්සගල	1/1/1972	776.49
විකිලිය	1/1/1972	805.67
තිස්පනේ	1/1/1972	384.62
මැද්දේකන්ද	1/1/1972	676.11
සොගම	1/1/1972	476.11
මතුරට	15/05/1975	278.54
ඔඩුවෙල	1/6/1973	659.51
අයිස්ලැබ්	26/11/1973	382.59
වෙදමුල්ල	1/9/1973	484.62
රම්බොඩ	1/9/1973	765.18
ග්‍රේට්වැලි	1/1/1974	320.24
දකුණු මැදදුම්බර	1/2/1974	505.26
කැරොලිනා	1/7/1974	1063.56
ගල්ලේබොද්ද	1/7/1974	752.63
ගෙතන්ටි	1/7/1974	203.24
සෙනට් හේලියර්	1/7/1974	172.87
රොහැමප්ටන්	15/3/1974	100.61
නන්පේරියල්	11/4/1974	203.64
උඩපොළ	27/5/1975	278.54
ඩෙල්කිත්	19/5/1975	1223.38
ඇල්පිටිය	1/6/1975	785.02
ගලහ-සිලික් ප්‍රොජෙක්ට්	1/7/1975	694.33
හොටිවිල්	1/7/1975	412.15
කැම්පියන්	1/7/1975	848.99
ඇහැලියගොඩ	1/8/1975	410.93
සපුමල්කන්ද	1/8/1975	646.96
දියදාව		280.57
එකතුව		18914.21

වගුව 03 - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ගැසට්පත්‍ර මඟින් ලැබුණු ඉඩම්

ගැසට් අංකය	දිනය	ලැබුණු ආකාරය	වතුයායන් ගණන		නාමික වටිනාකම
			ප්‍රාදේශීය වැවිලි සමාගම්	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	
150/12	7/24/1981	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	38	0	නැත
181/12	2/27/1989		55	25	නැත
815/10	4/21/1994		122	1	123
195/6	5/31/1982		6	8	123
569/14	8/2/1989		3	0	123
571/14	8/14/1989		1	0	123
206/15	8/20/1982		0	1	123
230/12	2/2/1983		1	0	123
937/2	8/19/1996		8	0	123
157/13	4/3/1975	රජය	5	0	123
439/18	2/6/1987		0	1	123
එකතුව			239	36	

වගුව 04- රජයේ විවිධ ආයතන හරහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ලැබුණු ඉඩම්

වතුයාය	ලැබුණු ආකාරය	ලැබුණු දිනය	භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
හිග්ගොඩ	ඉඩම් කොමසාරිස්	1/10/1960	319.81
රදෙල්ල	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	633.60
යටවත්ත	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	522.67
නෙලිඋල	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	337.65
පල්ලේකැලේ	ඉඩම් කොමසාරිස්	1/1/1968	1270.04
එකතුව			3083.77

වතුයායන්හි භූමි පරිභෝජනය 2019

වගුව 05- වතුයායන්හි භූමි පරිභෝජනය 2019

හෙක්ටයාර ප්‍රකාශය , ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව -2019

වතුයාය	තේ වගා කළ ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)						රබර් (හෙක්ටයාර)		සුළු අපනයන බෝග (හෙක්ටයාර)	දැව වගාව (හෙක්ටයාර)		තණකොළ (හෙක්ටයාර)	කුඹුරු (හෙක්ටයාර)	වෙනත් (හෙක්ටයාර)	මුළු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)
	ආදායම සහිත තේ		කොන්ත්‍රාත් පදනම මත දළු නෙලීමට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය		තේ තවාන්	නැවත වගාව	පැරණි රබර් වගාව	රබර් නැවත වගාව		වාණිජ දැව	ඉන්ධන දැව				
	ඇට තේ	රිකිළි තේ	ඇට තේ	රිකිළි තේ											
අලකොළ	161.75	114.95	115.50	-	1.00	12.00	-	-	68.60	24.00	55.38	-		266.68	**819.86**
කොටගහ	261.46	34.42	144.31	-	0.40	3.00	-	-	53.69	-	24.14	-		538.39	**1,059.81**
ගල්පිල්ල	71.28	165.01	-	-	2.21	7.04	-	-	5.85	-	70.21	-		444.29	**765.89**
ගෝමර	104.85	116.73	128.61	-	-	9.00	-	-	74.80	37.90	1.60	-		257.64	**731.13**
හාඟල	101.80	77.78	84.66	-	0.42	7.00	-	-	-	-	89.62	-		88.21	**449.49**
හෙයාර්පාර්ක්	164.50	-	183.50	-	-	-	-	-	55.00	-	-	-		573.75	**976.75**
හුන්නස්ගිරි	153.14	37.78	34.21	-	0.60	2.00	-	-	30.37	5.00	2.00	-		474.62	**739.72**
කැලෑබොක්ක	188.97	304.24	190.43	-	1.21	32.50	-	-	148.31	335.46	15.00	14.00	17.67	122.57	**1,370.36**
මිඩ්ලන්ඩ්	104.42	117.41	57.17	-	1.34	15.00	-	-	266.79	-	208.84	-	2.00	448.34	**1,221.31**
නිකොළොය	-	47.14	2.43	-	-	26.50	-	-	65.64	-	18.00	-		172.70	**332.41**
ඔපල්ගල	36.10	48.90	55.90	-	1.80	-	54.00	-	169.50	-	68.00	-		331.80	**766.00**
රංගල	109.10	85.44	130.20	-	2.00	5.00	-	-	7.50	-	-	-		291.36	**630.60**
වෛතලාව	34.00	39.20	74.69	-	-	-	-	-	61.06	-	47.39	-		294.71	**551.05**
වලහන්දුව	2.05	-	-	-	-	1.00	65.47	5.00	7.40	-		-		14.30	**95.22**
වුඩ්සයිඩ්	-	15.00	190.33	-	0.20	5.00	-	-	35.61	240.09	157.50	-		73.81	**717.54**
එකතුව	**1,493.42**	**1,204.00**	**1,391.94**	**-**	**11.18**	**125.04**	**119.47**	**5.00**	**1,050.12**	**642.45**	**757.68**	**14.00**	**19.67**	**4,393.17**	**11,227.14**

වතුයාන්හි ප්‍රධාන ආදායම් හෝගය වන තේ හා රබර් අස්වැන්න පසුගිය වසර 10ක් සමග සංසන්දනාත්මකව

වගුව 06- වතුයාන්හි ප්‍රධාන ආදායම් හෝගය වන තේ හා රබර් අස්වැන්න පසුගිය වසර 10ක් සමග සංසන්දනාත්මකව

වතුයාය	තේ -අමු දළු (කිලෝග්‍රෑම්)									
	2010	**2011**	**2012**	**2013**	**2014**	**2015**	**2016**	**2017**	**2018**	**2019**
අලකොළ	1,065,220	1,077,059	952,633	880,458	769,499	787,217	705,364	759,745	734,923	617,413
කොටගහ	352,166	312,648	370,453	258,308	194,663	216,383	170,940	205,002	293,452	253,262
ගල්පිල්ල	1,003,481	971,105	879,545	880,379	665,646	690,856	675,717	775,779	790,235	681,020
ගෝමර	602,682	647,939	566,360	574,639	486,583	547,711	667,328	764,337	743,270	706,865
හාගල	981,330	985,357	843,579	774,142	682,702	682,097	429,360	482,980	547,672	412,474
හෙයාර්පාර්ක්	543,660	455,650	399,609	463,485	375,497	298,837	229,330	252,911	298,088	252,867
හුන්නස්ගිරිය	651,682	370,875		520,190	431,449	578,320	515,374	528,226	496,959	487,032
කැලෑබොක්ක	1,943,439	2,153,655	2,006,814	1,762,933	1,331,815	1,608,769	1,373,408	1,382,689	1,468,809	1,435,669
කුඩාඔය	-	-	-	-	-	-	-	-	-	2,581
මිඩ්ලන්ඩ්	1,145,480	998,500	669,558	730,241	395,511	586,442	438,614	503,015	586,207	494,211
නිකොළොය****					458	1,122	1,550	2,979	159,993	138,379
ඔපල්ගල	421,186	369,534	369,158	430,719	297,287	301,755	247,751	305,494	354,023	263,246
රංගල	1,024,601	948,550	739,211	658,274	521,922	678,266	604,332	492,346	606,262	579,595
වෛතලාව***									228,362	157,356
විහාරගල	-	-	-	-	-	-	-	-	-	9,267
වුඩ්සයිඩ්**									22,153	44,463
එකතුව	**9,734,927**	**9,290,872**	**7,796,920**	**7,933,768**	**6,153,032**	**6,977,775**	**6,059,068**	**6,455,503**	**7,330,409**	**6,535,701**

වතුයාය	*රබර් - ලේටෙක්ස් (කිලොග්‍රෑම්)									
	2010	**2011**	**2012**	**2013**	**2014**	**2015**	**2016**	**2017**	**2018**	**2019**
වලහන්දුව	50,163	49,332	39,218	44,861	40,140	36,809	37,522	42,470	33,395	28,122

****	නිකොළොය රාජ්‍ය වතුයාය 2010-2013 සිට මිඩ්ලන්ඩ්ස් සමග ඒකාබද්ධ කෙරිණි
***	වෛතලාව රාජ්‍ය වතුයාය 2008-2017 සිට මරුති සමාගම විසින් කළමනාකරණය කෙරේ
**	2018 වර්ෂයට පෙර, වුඩ්සයිඩ් වතුයාය පිටතට පවරා දී තිබුණි
*	රබර් කිරිවල DRC අගය කිලෝග්‍රෑම් වලට පරිවර්තනය කර ඇත (Dry Rubber Content)

රූපය 03 - තේ අස්වැන්න පසුගිය වසර 10ක් සමග සංසන්දනාත්මකව



රූපය 04 - රබර් අස්වැන්න පසුගිය වසර 10ක් සමග සංසන්දනාත්මකව



වතුයායන්හි හෙක්ටයාර එකකට ලබාගත් අමුදළු හා රබර් අස්වැන්න වර්ෂ 2009 - 2019

වගුව 07- වතුයායන්හි හෙක්ටයාර එකකට ලබා ගත් අමු දළු හා රබර් අස්වැන්න 2009-2019

වතුයාය	අමු තේ දළු ප්‍රමාණය - හෙක්ටයාරයට කිලෝග්‍රෑම්										
	2009	**2010**	**2011**	**2012**	**2013**	**2014**	**2015**	**2016**	**2017**	**2018**	**2019**
අලකොළ	2,328	2,828	3,070	2,856	2,660	2,321	2,293	2,121	2,479	2,367	2032.05
කොටගහ	1,494	1,523	1,353	1,316	1,400	1,060	860	819	935	930	809.1
ගල්පිහිල්ල	3,696	4,228	5,088	4,009	3,819	2,926	2,981	2,916	3,656	3,901	3361.95
ගෝමර	2,746	2,958	3,772	3,474	3,363	3,121	3,363	3,084	3,451	3,139	3027.15
හාගල	2,454	2,781	2,851	3,595	3,223	2,772	2,716	2,447	2,781	2,883	2241.3
හෙයාපාර්ක්	1,823	1,807	1,633	1,274	1,633	1,274	995	674	795	1,260	1102.05
හුන්නස්ගිරිය	2,651	3,242	3,474	3,321	2,828	2,181	2,744	2,749	2,823	2,599	2548.2
කැලැබොක්ක	2,414	2,791	3,795	3,479	3,079	2,353	2,828	2,888	2,777	2,651	2552.85
කුඩාඔය	0	0	0	0	0	0	0	0	0	0	69.75
මිඩ්ලන්ඩ්	2,736	3,088	2,851	2,498	2,460	2,084	2,167	1,995	2,293	2,585	2204.1
නිකොළොය	2,410	-	-	-		1,772	1,702	2,544	2,884	3,218	2859.75
ඔපල්ගල	3,339	3,791	3,228	3,619	3,972	2,944	2,814	2,309	2,940	4,013	2999.25
රංගල	3,072	3,456	367	3,772	3,256	2,553	3,247	2,916	2,316	2,581	2659.8
වෛතලාව				-	-	-	-	-	-	2,688	2092.5
විහාරගල	-	-	-	-	-	-	-	-	-	-	223.2
එකතුව	**31,162**	**32,493**	**31,484**	**33,214**	**31,693**	**27,363**	**28,712**	**27,463**	**30,130**	**34,815**	**30,560**

වතුයාය	රබර් (ලේටෙක්ස්) - හෙක්ටයාරයට කිලෝග්‍රෑම්										
	2009	**2010**	**2011**	**2012**	**2013**	**2014**	**2015**	**2016**	**2017**	**2018**	**2019**
වලහන්දුව	821	776	763	603	690	618	566	577	649	510	430

රූපය 05 -හෙක්ටයාර එකකට අමු තේ දළු අස්වැන්න (2009-2019)



රූපය 06: හෙක්ටයාර එකකට රබර් අස්වැන්න (2009-2019)



බටහිර මැදරට කලාපයේ 2019 වසරේ වාර්ෂික වර්ෂාපතනය

වගුව - 08 – බටහිර මැදරට කලාපයේ 2019 වසරේ වාර්ෂික වර්ෂාපතනය

මාසික වර්ෂාපතනය - 2019	
වතුයාය	වර්ෂාපතනය (මි.මී)
අලකොළ	1560.00
කොටගහ	2289.00
ගල්පිහිල්ල	1343.00
ගෝමර	2348.00
හාගල	2148.00
හෙයාපාර්ක්	2808.00
හුන්නස්ගිරිය	946.00
කැලැබොක්ක	2278.00
මිඩ්ලන්ඩ්	2946.00
නිකොලොය	1730.00
ඔපල්ගල	2508.00
රංගල	3776.00
වෛතලාව	1733.00

ඉහත විස්තර වලට අනුව, 2019 වර්ෂය පුරාවටම බටහිර මැද රට කලාපයට හොඳ වර්ෂාපතනයක් ලැබී තිබුණි.

පසුගිය වර්ෂ 03 සඳහා පොහොර භාවිතය

සමස්තයක් ලෙස සැලකිය යුතු මූල්‍ය සහනයන් ලැබී ඇත. එහෙත් කළමනාකරණය විසින් කෘෂිකාර්මික අවශ්‍යතාවක් ලෙස පොහොර හා වල්නාශක නිසි පරිදි ලබාදීමට අපොහොසත් වී ඇති බව පෙනී යයි.

වගුව - 09 – පසුගිය වර්ෂ 03 සඳහා පොහොර භාවිතය

වර්ෂය	භාවිතා කළ පොහොර ප්‍රමාණය (මෙ.ටොන්)	පොහෙරෙ පිරිවැය (රු.)	භාවිත කළ වල් නාශක ප්‍රමාණය (ලීටර/කිග්‍රෑ)	වල් නාශක පිරිවැය (රු.)
2017	306	15,918,300.00	400 kg 1628 l	7,352,984.00
2018	229	7,530,941.60	3347 l	14,308,425.00
2019	215	4,794,652.50	3207 l	14,431,500.00

2019 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් නිෂ්පාදනය කරනු ලැබූ අමු දළු කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල රුපියල් 76.74 වූ අතර බටහිර මධ්‍යම කලාපයේ අමු දළු කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල රුපියල් 68.58ක් විය. ඒ අනුව, 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ විකුණුම් අනුපාතය, බටහිර මධ්‍යම කලාපයේ විකුණුම් අනුපාතයට වඩා 8.16 කින් වැඩි අගයක පවත්වා ගෙන ඇත.

පහත වගුව මගින් පසුගිය වසර 03ක සංස්ථාවේ අමු දළු කිලෝ එකක නිෂ්පාදන වියදම සංසන්දනාත්මකව නිරූපනය කරයි

වගුව - 10– පසුගිය වසර 03ක කාලය තුළ සංස්ථාවේ අමු දළු කිලෝ එකක සංසන්දනාත්මක නිෂ්පාදන පිරිවැය

වර්ෂය	අමු තේ දළු කිලෝග්‍රෑමයකට නිෂ්පාදන පිරිවැය (රුපියල්)					
	දළු නෙලීම	ක්ෂේත්‍ර වැඩ	පොහොර	වල්නාශක	පොදු වියදම්	එකතුව
2017	31.16	12.31	3.64	6.08	49.45	**102.64**
2018	32.44	13.24	2.59	7.84	45.96	**102.07**
2019	45.34	18.34	2.15	12.34	44.19	**122.36**

රූපය 07 – පසුගිය වසර 03ක කාලය තුළ සංස්ථාවේ අමු දළු කිලෝ එකක සංසන්දනාත්මක නිෂ්පාදන පිරිවැය



ඒ අනුව අමු දළු කිලෝග්‍රෑම් එකක සමස්ත නිෂ්පාදන වියදමෙන් පොහොර පිරිවැය ඉතා අඩුය. නිෂ්පාදන පිරිවැයේ විශාල පංගුවක් ගන්නා අමු දළු නෙලීමේ සහ පොදු වියදම් කළමනාකරණය නොකර පොහොර පිරිවැය පාලනය කර ඇති බැවින් අපේක්ෂිත අස්වැන්න අඩු වී ඇත. පාලන අධිකාරියට සහ කළමනාකාරීත්වයට මේ තත්ත්වය වටහා නොගැනීම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පවතින දිගුකාලීන පාඩුවට එය එක් හේතුවක් වී ඇත.

තේ නිෂ්පාදනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව දැනට තේ නිෂ්පාදන කර්මාන්තශාලා දහයක් ඇති අතර එයින් සී.ටී.සී තේ කර්මාන්තශාලා තුනක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. කැලැබොක්ක, මිඩ්ලන්ඩ්ස් සහ රංගල තේ කර්මාන්තශාලා තුන මගින් අපගේ වතුයායන් කිහිපයකින් ලබා ගන්නා අමු දළුවලින් තේ නිෂ්පාදනය කරයි. පහත වගුවෙන් එම තේ නිෂ්පාදනය නිරූපනය කරයි.

වගුව - 11– තේ නිෂ්පාදනය

කර්මාන්තශාලාව	අමු තේ දළු (කි.ග්‍රෑම්)		නිමි තේ (කි.ග්‍රෑම්)		නිපදවූ නිමි තේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස		නිෂ්පාදන පිරිවැය- කිලෝග්‍රෑම් එකකට රුපියල්		ශුද්ධ විකුණුම් සාමාන්‍ය - කිලෝග්‍රෑම් එකකට රුපියල්	
	2018	2019	2018	2019	2018	2019	2018	2019	2018	2019
කැලැබොක්ක	1,468,809.45	1,435,669.00	315,873.00	308,746.00	22.89	22.79	569.36	710.28	385.39	362.11
මිඩ්ලන්ඩ්	586,206.90	494,211.00	126,066.00	106,282.00	23.21	23.40	560.09	659.94	428.20	414.87
රංගල	606,262.35	579,595.00	130,379.00	124,644.00	21.82	23.22	592.84	660.02	412.44	358.71
එකතුව	**2,661,278.70**	**2,509,475.00**	**572,318.00**	**539,672.00**						

රූපය - 08– නිමි තේ නිෂ්පාදනය



රූපය - 09– අමු තේ දළු ප්‍රමාණය නිෂ්පාදනය



වගුව 12- කර්මාන්තශාලා පිළිබඳ විස්තර

කර්මාන්තශාලාව	පිහිටි දිස්ත්‍රික්කය	නිෂ්පාදනය කරන තේ වර්ගය	ධාරිතාවය (කිලෝග්‍රෑම්)		වර්තමාන තත්ත්වය
			පෙරීම (Sifting)	මැළවීම (Withering)	
කොටගහ	මහනුවර	ඔතඩොක්ස්	1,290	6,000	අක්‍රිය
ගෝමර	මහනුවර	ඔතඩොක්ස්	8000 (සමස්ත ධාරිතාවය)		අක්‍රිය
හාගල	මහනුවර	ඔතඩොක්ස්	1,419	6,600	අක්‍රිය
හුන්නස්ගිරිය	මාතලේ	සිටිසි	1,720	8,000	අක්‍රිය
කැලැබොක්ක	මහනුවර	සිටිසි	12,000 (සමස්ත ධාරිතාවය)		ක්‍රියාත්මකයි
මිඩිලන්ඩ්	මාතලේ	සිටිසි	1,400	10,224	ක්‍රියාත්මකයි
දන්කන්ද	මාතලේ	ඔතඩොක්ස්	860	4,000	අක්‍රිය
නිකොළොය	මාතලේ	ඔතඩොක්ස්	645	3,000	අක්‍රිය
රංගල	මහනුවර	සිටිසි	1,500	7,000	ක්‍රියාත්මකයි

අපගේ කර්මාන්තශාලාවල නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ මට්ටමක පැවතීම සහ අපගේ නිෂ්පාදන සඳහා අලෙවි වන ඉතා අඩු මිල යන හේතු මත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දී තිබේ.

මනා පළපුරුදු සහ පුහුණු කළමනාකාරීත්වයක් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලයක් සිටින ශ්‍රී ලංකා වැවිලි රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන අමු දළු සහ තේ සඳහා මැදරට සාමාන්‍ය මිලට වඩා අඩු මිලක් ලැබීම කණගාටුදායක තත්ත්වයකි.

මිඩිලන්ඩිස් තේ කර්මාන්තශාලාව මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි එකම සී.ටී.සී තේ කර්මාන්තශාලාවයි. කැලැබොක්ක සහ රංගල තේ කර්මාන්තශාලා මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

කැලෑබොක්ක තේ කර්මාන්තශාලාව



රංගල තේ කර්මාන්තශාලාව



මිඩ්ලන්ඩස් තේ කර්මාන්තශාලාව



සංස්ථා තේ

දේශීය වෙළඳපොළට සංස්ථා තේ ලබා දීම තුළින් සංස්ථා තේ මිල, තේ වෙන්දේසිය තුළ උච්චාවචනය වීමෙන් ඇතිවන තාවකාලික මූල්‍ය අර්බුදයන්ට සහනයක් ලබා දීම පිණිස 2016 වර්ෂයේ නොවැම්බර් මස "සංස්ථා තේ" නිෂ්පාදනය ආරම්භ කරන ලදී.



වගුව 13: සංස්ථා තේ අලෙවිය - ප්‍රමාණාත්මක සංසන්දනය (2018-2019)

මාසය	අළෙවි වූ තේ පුමාණය (කිලෝග්‍රෑම්)	
	2018	2019
ජනවාරි	2,539.70	2,602.35
පෙබරවාරි	2,079.50	4,635.50
මාර්තු	3,947.65	2,789.00
අප්‍රේල්	2,156.45	939.40
මැයි	3,369.60	2,474.70
ජුනි	3,502.15	1,133.70
ජුලි	3,379.45	3,270.10
අගෝස්තු	4,036.70	2,683.40
සැප්තැම්බර්	3,663.70	3,158.50
ඔක්තෝම්බර්	2,507.20	3,043.40
නොවැම්බර්	2,919.30	4,313.00
දෙසැම්බර්	3,493.80	3,031.70
එකතුව	37,595.20	34,074.75

රූපය 10: සංස්ථාගේ අලෙවිය - ප්‍රමාණාත්මක සංසන්දනය (2018-2019)



වගුව 14: සංස්ථා තේ අලෙවි ආදායම (2018-2019)

මාසය	සංස්ථා තේ අලෙවි ආදායම (රුපියල්)	
	2018	**2019**
ජනවාරි	1,717,815.75	1,948,165.75
පෙබරවාරි	1,488,562.75	3,210,598.25
මාර්තු	2,812,306.69	2,117,156.80
අප්‍රේල්	1,602,650.75	747,592.50
මැයි	2,418,044.32	1,661,434.00
ජූනි	2,609,889.00	939,404.50
ජූලි	3,098,106.25	2,490,900.70
අගෝස්තු	3,141,931.85	2,080,812.75
සැප්තැම්බර්	2,900,447.15	2,261,769.50
ඔක්තෝම්බර්	1,934,503.70	2,139,277.25
නොවැම්බර්	2,354,412.15	3,112,667.00
දෙසැම්බර්	2,877,599.25	2,345,363.50
එකතුව	**28,956,269.61**	**25,055,142.50**

රූපය 11: සංස්ථා තේ අලෙවි ආදායම (2018-2019)



රබර් නිෂ්පාදනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව පවතිනුයේ එක් රබර් වතුයායක් පමණි. එය ගාල්ල දිස්ත්‍රික්කයේ වලහන්දුව ප්‍රදේශයේ පිහිටා ඇත. වර්ෂ තුනක් සඳහා මුළු රබර් කිරි නිෂ්පාදනය පහත වගුවෙන් නිරූපණය වේ.

වගුව 15- වර්ෂ තුනක් සඳහා මුළු රබර් නිෂ්පාදනය

වර්ෂය	ලේටෙක්ස් (කි.ග්‍රෑ.)	මුළු වියදම (රු.)	ලාභය/(අලාභය) (රු.)	ශුද්ධ විකිණුම් අගය (රු.)	නිෂ්පාදන පිරිවැය කිලොග්‍රෑම් එකකට (රු.)	කිලෝග්‍රෑමයකට ලාභය/(අලාභය) (රු.)
2019	28,122.00	14,686,995.72	(7,806,787.00)	300.00	522.26	(222.26)
2018	4,318	1,347,734.16	(397,747)	220.00	312.12	(92.12)
2017	42,470	5,617,931.60	(3,350,208)	123.85	132.28	(8.43)

රූපය 12-රබර් නිෂ්පාදනය (2016-2018)



භාණ්ඩාගාර ප්‍රතිපාදන

මෙම වසරේ මෙන්ම පෙර වසරවල වැටුප් හා එදිනෙදා වියදම් කළමනාකරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 222 ක මුලා ප්‍රතිපාදන සපයා ඇත.

වගුව - 16– භාණ්ඩාගාර ප්‍රතිපාදන

ලැබුණු භාණ්ඩාගාර ප්‍රදාන (සියලු මුදල් රු මිලියන වලින් දක්වා ඇත)

	2015	2016	2017	2018	2019
මෙහෙයුම් වියදම් (කම්කරු වේතන සහ කාර්ය මණ්ඩල වැටුප්)	104	100	130	68	222
ව්‍යවස්ථාපිත ගෙවීම් (සේෂා/සේනිහාඅ/පාරිතෝෂික)	100	0	134	90	0
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සංවර්ධන කටයුතු	0	0	0	0	0
මුළු ලැබීම් (රු.මි)	204	100	264	158	222

2019 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව සහ 2019 වර්ෂයේ ගිණුම් ප්‍රකාශය අනුව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පහත පරිදි නිරූපණය වේ

වගුව 17 – 2019 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව සහ 2019 වර්ෂයේ ගිණුම් ප්‍රකාශය අනුව කාර්යසාධනය

විස්තරය	2019 ඇස්තමේන්තුව	වාර්ෂික ගිණුම් - 2019	කාර්යසාධනය		2018 ඇස්තමේන්තුව	වාර්ෂික ගිණුම් - 2018	කාර්යසාධනය
සැකසූ තේ - නිෂ්පාදන පිරිවැය (C.O.P.)	460.55	549.50	119.31		425.88	445.58	104.63
- ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A	436.12	373.70	85.69		450.94	371.22	82.32
රබර් - නිෂ්පාදන පිරිවැය (C.O.P.)	287.72	429.52	149.28		299.24	420.59	140.55
- ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A	300.00	246.61	82.20		350.00	244.25	69.79
ඇස්තමේන්තුගත නිෂ්පාදනය - සැකසූ තේ (කිලෝ	2,057,042	1,409,509	68.52		2,367,400	1,585,483	66.97
ඇස්තමේන්තුගත නිෂ්පාදනය - රබර් (කිලෝ)	45,500	28,122	61.81		45,500	33,395	73.40
ආදායම	රු:	රු:	රු:		රු:	රු:	රු:
සැකසූ තේ සහ තේ දළු	897,108,237	526,735,834	58.71		1,067,555,575	588,555,635.00	55.13
රබර් -ලේටෙක්ස්	13,650,000	6,935,151	50.81		15,925,000	8,156,688.00	51.22
මුළු ආදායම	910,758,237	533,670,985	58.60		1,083,480,575	596,712,323.00	55.07
අඩු කළා: නිෂ්පාදන පිරිවැය							
සැකසූ තේ සහ තේ දළු	947,367,672	774,529,082	81.76		1,008,236,601	706,455,462.00	70.07
රබර්	13,091,117	12,078,825	92.27		13,615,324	14,045,649.00	103.16
මුළු නිෂ්පාදන පිරිවැය	960,458,789	786,607,907	81.90		1,021,851,925	720,501,111.00	70.51
දළ ලාභය/(පාඩුව) - වතුයාය	(49,700,551)	(252,936,922)	508.92		61,628,650	(123,788,787.00)	-200.86
එක් කළා: වෙනත් ආදායම්							
වෙනත් ආදායම් - වතුයාය	432,961,589	52,160,715	12.05		336,320,599	74,648,845.00	22.20
වෙනත් ආදායම් - ප්‍රධාන කාර්යාලය	55,630,000	57,076,072	102.60		88,371,690	42,098,097.00	47.64
මුළු වෙනත් ආදායම් - වතු සහ ප්‍රධාන කාර්යාලය	488,591,589	109,236,787	22.36		424,692,289	116,746,942.00	27.49
මුළු ආදායම	438,891,038	(143,700,135)	-32.74		486,320,939	(7,041,846.00)	-1.45
අඩු කළා: වියදම්							
පරිපාලන වියදම් - වතුයාය	62,536,441	73,625,149	117.73		82,871,726	47,584,324.00	57.42
-ප්‍රධාන කාර්යාලය	39,938,603	39,371,623	98.58		26,170,569	35,189,377.00	134.46
විකුණුම් වියදම්- සංස්ථා තේ සහ මදුරු කුරු					25,440,000		
පුද්ගල වියදම් - ප්‍රධාන කාර්යාලය	55,783,280	52,477,079	94.07		44,681,990	45,892,546.00	102.71
මූල්‍ය ගාස්තු - වතුයාය	7,301,793	5,049,882	69.16		6,826,282	4,694,004.00	68.76
-ප්‍රධාන කාර්යාලය	12,200,000	15,660,522	128.36		9,900,000	7,396,411.00	74.71
මුළු වියදම්	177,760,116	186,184,255	104.74		195,890,568	140,756,662.00	71.85
ලාභය/(පාඩුව) - වතු සහ ප්‍රධාන කාර්යාලය	**261,130,922**	**(329,884,390)**	**-126.33**		**290,430,371**	**(147,798,507.00)**	**-50.89**

පහත වගුව සහ ප්‍රස්තාරය පසුගිය වසර 05 තුළ සංස්ථාවේ ලාභ/අලාභය නිරූපණය කරයි

රූපය- 13– පසුගිය වසර 5 මත පදනම්ව ලාභ හා අලාභ සංසන්දනය කිරීම



ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මානව සම්පත්

2019 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකරණ, අධීක්ෂණ සහ නිෂ්පාදන කාර්ය මණ්ඩලය පහත වගුවෙන් නියෝජනය වේ.

වගුව - 18– රාජ්‍ය වැවිලි සංස්ථාවේ සතු මානව සම්පත්

වතුයාය	වතු අධිකාරිවරුන් ගණන	සහකාර වතු අධිකාරිවරුන් ගණන	කාර්යය මණ්ඩලය		කම්කරුවන්			එකතුව
			ස්ථිර	කොන්ත්‍රාත්	ස්ථිර	අනියම්		
අලකොළ	1	2	13	0	294	0		310
කොටගහ	1	1	13	0	200	0		215
ගල්පිල්ල	1	2	19	0	184	20		206
ගෝමර	1	2	17	2	280	0		302
හාගල	1	1	11	0	206	0		219
හෙයාර්පාර්ක්	1	1	11	1	149	2		163
හුන්නස්ගිරිය	1	2	16	0	207	13		226
කැලැබොක්ක	1	4	34	2	723	49		764
මිඩිලන්ඩ	1	2	24	1	330	13		358
නිකොළොය	1	0	6	0	68	0		75
ඔපල්ගල	1	2	10	1	89	0		103
රංගල	1	2	22	1	227	42		253
වලහන්දුව	1	1	3	1	65	57		71
වෛතලාව	1	1	3	0	0	0		5
වූඩ්සයිඩ්	1	0	2	1	50	6		54
ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාලය	0	0	58	2	3	0		63
								-
එකතුව	**15**	**23**	**262**	**12**	**3075**	**202**		**3,387**

2018 වසර අවසන් වන විට ප්‍රධාන කාර්යාලයෙන් වැටුප් ලබා ගත් ප්‍රධාන කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල කාර්ය මණ්ඩල සංඛ්‍යාව 66ක් වූ අතර එය 2019 වර්ෂයේදී 67 දක්වා වැඩි වී ඇත. 2018 වසර ආරම්භයේදී මෙම සංඛ්‍යාව 60කි. රුපියල් මිලියන 39.7ක් 2018 වර්ෂයේදී මෙම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම සඳහා වැය කර ඇති අතර 2019 වර්ෂයේදී රු . මිලියන 46.4 ක් වැය කර ඇත. 2018 ට සාපේක්ෂව 2019 දී රු.මිලියන 6.7 ක් එනම්, 16.9% කින් මෙය වැඩි කර ඇත.

2018 වසර අවසන් වන විට වතු අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් ඇතුළු කාර්යාල කාර්ය මණ්ඩලය සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය 249ක් වූ අතර 2019 වර්ෂයේදී එය 249ක් ලෙස සමාන ගණනක් වාර්තා කර ඇත. 2018 වසර ආරම්භයේදී මෙම සංඛ්‍යාව 286කි. රුපියල් මිලියන 89.7ක් 2018 වර්ෂයේදී මෙම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම සඳහා වැය කර ඇති අතර 2019 වර්ෂයේදී රු. මිලියන 103.2 ක් වැයකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සහ විගණන කමිටු රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් එකොළහක් පවත්වා ඇති අතර(රැස්වීම් අංක 7 සහ 8 යනුවෙන් කිසිදු රැස්වීමක් පවත්වා නොමැත) විගණන කමිටු රැස්වීම් හතරක් ද පවත්වා ඇත.

වගුව - 19– අධ්‍යක්ෂ මණ්ඩලය සහ විගණන කමිටු රැස්වීම්

අංකය	රැස්වීමේ නම	රැස්වීම් දිනය	රැස්වීම් අංකය
1	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	2019.02.19	1
		2019.03.21	2
		2019.05.14	03 - I
		2019.05.23	03 - II
		2019.06.03	හදිසි රැස්වීමකි
		2019.06.24	4
		2019.07.15	5
		2019.07.30	6
		2019.08.29	9
		2019.09.26	10
		2019.10.31	11
2	විගණන කමිටු රැස්වීම්	2019.03.07	1
		2019.04.09	2
		2019.07.05	3
		2019.10.14	4

2019 වැවිලි සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශනයට පවා රජයේ විගණකාධිපතිවරයා අහිතකර මතයක් ලබාදී ඇත. දීර්ඝ කාලයක් තිස්සේ වැවිලි සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අයහපත් අදහස් ලැබී ඇති අතර, එය නිවැරදි කර ගැනීමට නොහැකි වී ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල්වලින්.

දෙසැම්බර් 31 දිනට	**සටහන්**	**2019**	**2018**
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	8	752,391,710	756,206,267
ජීවවිද්‍යාත්මක වත්කම්	9	3,483,783,882	3,466,853,617
ආයෝජන දේපළ	10	1,611,520,641	1,611,520,641
ස්ථාවර තැන්පතු		8,863,799	8,532,777
විලම්බිත වත්කම්		781,064	781,064
මුළු ජංගම නොවන වත්කම්		**5,857,341,096**	**5,843,894,366**
ජංගම වත්කම්			
තොග	11	62,502,640	48,241,155
වෙළඳ හා වෙනත් ලැබීම්	12	175,209,745	115,551,243
මුදල් හා මුදල් හා සමාන දෑ	13	37,713,613	53,812,300
මුළු ජංගම වත්කම්		**275,425,998**	**217,604,698**
මුළු වත්කම්		**6,132,767,094**	**6,061,499,064**
ස්කන්ධය හා වගකීම්			
ප්‍රාග්ධන හා සංචිත			
දායකත්ව ප්‍රාග්ධනය	14	5,879,852,850	5,657,852,850
රඳවාගත් ආදායම්		(1,570,849,043)	(1,067,273,122)
මුළු ස්කන්ධය		**4,309,003,807**	**4,590,579,728**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ වගකීම්	15	417,639,183	339,598,126
මුළු ජංගම නොවන වගකීම්		**417,639,183**	**339,598,126**
ජංගම වගකීම්			
වෙළඳ හා වෙනත් ලැබීම්	16	1,318,555,797	1,091,072,027
බැංකු අයිරාව		87,568,307	40,249,182
මුළු ජංගම වගකීම්		**1,406,124,104**	**1,131,321,209**
මුළු වගකීම්		**1,823,763,287**	**1,470,919,336**
මුළු ස්කන්ධය හා වගකීම්		**6,132,767,094**	**6,061,499,063**

පිටු 25 සිට 42 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බව යටින් අත්සන් කර ඇති අය විසින් සහතික කරනු ලබයි.

එස්.අයි.එම්. හසන් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

ආර්.ජී.එච්.එස්.ගුණතිලක මයා
ගණකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ,

ශ්‍රීමාල් විජේසේකර මයා
සභාපති/ප්‍රධාන විධායක නිළධාරී

එස්.එම්.සී.එස්. සිරිවර්ධන මයා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඩී.ආර්.එස්.සේනාරත්න මයා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2020 දෙසැම්බර් මස 22 වන දින, කොළඹ දීය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ආදායම් ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල්වලින්.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන්	2019	2018
ආදායම	17	**535,933,037**	**597,950,423**
විකුණුම් පිරිවැය		(786,607,907)	(720,501,111)
දළ ලාභය / (පාඩුව)		**(250,674,870)**	**(122,550,687)**
වෙනත් ආදායම්	18	106,974,735	115,508,842
පරිපාලන වියදම්	19	(165,473,851)	(128,666,247)
මෙහෙයුම් ලාභය / (පාඩුව)		**(309,173,987)**	**(135,708,092)**
මූල්‍ය වියදම්	20	(20,710,404)	(12,090,415)
කාලසීමාව සඳහා ලාභය (පාඩුව)		**(329,884,391)**	**(147,798,507)**

පිටු අංක 25 සිට 42 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය — ශ්‍රී ලංකා රුපියල්වලින්.

2019 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා

	ප්‍රාග්ධනය	ඉඩම් දායකත්වය	සමුච්චිත ලාභය/(පාඩුව)	එකතුව
	රු.	රු.	රු.	රු.
2018 ජනවාරි 01 දිනට ශේෂය	3,279,250,925	2,220,601,926	(918,393,477)	4,581,459,374
භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන	158,000,000	-	-	158,000,000
වසරෙහි පාඩුව	-	-	(147,798,507)	(147,798,507)
පෙර වසරෙහි ගැළපීම් (සටහන 26)	-	-	(1,081,138)	(1,081,138)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,437,250,925**	**2,220,601,926**	**(1,067,273,122)**	**4,590,579,729**
2019 ජනවාරි 01 දිනට ශේෂය	3,437,250,925	2,220,601,926	(1,067,273,122)	4,590,579,729
භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන	222,000,000	-	-	222,000,000
වසරෙහි පාඩුව	-	-	(329,884,391)	(329,884,391)
පෙර වසරෙහි ගැළපීම් (සටහන 26)	-	-	(173,691,530)	(173,691,530)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,659,250,925**	**2,220,601,926**	**(1,570,849,043)**	**4,309,003,808**

පිටු අංක 25 සිට 42 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල්වලින්.

2019 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා	සටහන්	**2019**	**2018**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
බදුකරණයට පෙර ශුද්ධ ලාභය (පාඩුව)		**(329,884,391)**	**(147,798,507)**
ගැළපීම් :			
ජීවවිද්‍යාත්මක වත්කම් ක්ෂයවීම්	9.2	3,910,779	3,333,614
වත්කම් ක්ෂයවීම්	8	8,804,754	8,453,297
මූල්‍ය වියදම්	21	19,110,404	10,490,415
පාරිතෝෂික වෙන්කිරීම්	16	33,828,923	25,853,232
විගණන ගාස්තු වෙන්කිරීම්		-	208,000
රක්ෂණ වෙන්කිරීම්		-	204,055
පෙර වර්ෂයේ ගැළපීම්	25	(173,691,530)	(1,240,487)
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර ලාභය		**(437,921,061)**	**(100,496,382)**
කාරක ප්‍රාග්ධන වෙනස්කම්			
තොග (වැඩිවීම්)/ අඩුවීම්		(14,261,485)	(23,058,701)
වෙළඳ හා වෙනත් ලැබීම් (වැඩිවීම්)/ අඩුවීම්		(59,658,502)	(9,158,581)
වෙනත් තැන්පතු (වැඩිවීම්)/ අඩුවීම්		-	1,935,020
ජංගම වගකීම් (වැඩිවීම්)/ අඩුවීම්		286,080,832	(65,771,625)
මෙහෙයුම්වලින් උත්පාදනය කරන ලද මුදල්		**212,160,845**	**(96,053,887)**
වෙළඳ හා වෙනත් ලැබීම්			
පාරිතෝෂික ගෙවීම්		(14,384,929)	(9,024,774)
මූල්‍ය පිරිවැය ගෙවීම්		(19,110,404)	(10,490,415)
භාණ්ඩාගාර ප්‍රදාන ලැබීම්		222,000,000	158,000,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්		**188,504,667**	**138,484,811**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහයන්			
දේපළ, පිරියත හා උපකරණවලට වන එකතුකිරීම්	8	(4,990,197)	(13,913,013)
ජීවවිද්‍යාත්මක වත්කම්වලට වන එකතුකිරීම්	9.2	(20,841,044)	(11,013,089)
විලම්භිත වත්කම්		-	347,867
ක්‍රියාත්මක වන ප්‍රාග්ධන වැඩ සඳහා ආයෝජන		-	335,347
ස්ථාවර තැන්පතුවල ආයෝජන		(331,022)	(343,785)
ආයෝජන ක්‍රියාකාරකම්හි යොදවන ලද ශුද්ධ මුදල්		**(26,162,263)**	**(24,586,674)**
මුදල් හා මුදල් හා සමාන දෑ හි වැඩිවීම් /(අඩුවීම්)		**(63,417,812)**	**(82,652,131)**
මුදල් හා මුදල් හා සමාන දෑ හි වෙනස්වීම්			
කාලසීමාව ආරම්භයේදී		13,563,118	96,215,249
වසරෙහි වැඩිවීම/ (අඩුවීම)		(63,417,812)	(82,652,131)
වසර අවසානයේදී මුදල් හා මුදල් හා සමාන දෑ		**(49,854,694)**	**13,563,118**

1. ආයතනික තොරතුරු

සාමාන්‍ය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, 1958 අංක 4 දරන පනත යටතේ සංස්ථාපනය කරන ලදුව, ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයකි. එය කොළඹ 12, මිරානියා විදිය, අංක 21 දරන ස්ථානයෙහි පිහිටා ඇති රජයේ සංස්ථාවකි.

සංස්ථාව විසින් දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස දොළහක කාලසීමාවක් සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම මූල්‍ය ප්‍රකාශ බලාත්මක කරයි.

ප්‍රධාන ක්‍රියාකාරකම්

තේ නිෂ්පාදනය කිරීම හා තේ වෙන්දේසි කිරීම මගින් සකස් කරන ලද තේ අලෙවි කිරීම, රබර් කිරි හා සුළු හෝ අපනයන භෝග (කරාබුනැටි, ගම්මිරිස්, කරඳමුංගු හා කුරුඳු යනාදිය) විකිණීම සහ සංස්ථාව මගින් වාණිජමය දැව වගා කිරීම හා අලෙවි කිරීම.

2. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

සාධාරණ වටිනාකමට අගයන ලද ජීව විද්‍යාත්මක වත්කම් හැර, ඓතිහාසික පිරිවැය පදනමක් මත මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

3. සුවිශේෂි ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

3.1.1 සුවිශේෂි ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී සංස්ථාව විසින් පහත සඳහන් සුවිශේෂි ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගනී.

3.1.2 දේපල, පිරියත හා උපකරණ

සමුච්චිත ක්ෂය කිරීම් හා සමුච්චිත හායන පාඩු ඇත්නම්, එවැනි හායන පාඩුවල ශුද්ධ පිරිවැයට දේපල, පිරියත හා උපකරණ දක්වා ඇත. එවැනි පිරිවැයක් තුල දේපල, පිරියත හා උපකරණවල ආංශික කොටස් ආදේශ කිරීමේ පිරිවැය සහ හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, දිගුකාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැය ඇතුලත් වේ. දේපල, පිරියත හා උපකරණවල සුවිශේෂි කොටස් අන්තරයක් සහිතව ආදේශ කිරීමට අවශ්‍ය වන්නේ නම්, සංස්ථාව එසේ ආදේශ කරන ලද කොටස හඳුනාගැනීමෙන් තොරව බැහැර කරන අතර, ඊට අදාල ප්‍රයෝජ්‍ය ආයුකාලයක් සහිත, ක්‍රමක්ෂය කළ හැකි නව කොටසක් හඳුනාගැනීමට ලක් කරයි. මේ හා සමානව, යම් ප්‍රධානපෙලේ විමර්ශනය කිරීමක් සිදුකළහොත්, හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, එහි පිරිවැය, ආදේශකයක් ලෙස එම පිරියතේ හා

උපකරණයෙහි ඉදිරියට ගෙන යනු ලබන වටිනාකම තුල හඳුනාගැනේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය හටගත් පිරිවැය ලෙස මූල්‍ය ප්‍රකාශ තුල හඳුනාගැනේ.

3.1.3 ක්ෂය කිරීම

මිලදීගත් දිනයේ සිට බැහැර කරන දිනය දක්වා වර්ෂය තුල අත්පත්කරගත් හා බැහැර කරන ලද දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය කිරීම් සිදු කෙරේ.

ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය සහ දේපල, පිරියත හා උපකරණවල ක්ෂය කිරීමේ අනුපාත පහත සඳහන් පරිදි වේ:

අයිතමය	ප්‍රයෝජ්‍ය ආයුකාලය	අනුපාතය
ගොඩනැඟිලි	අවුරුදු 20	5%
මෝටර් රථ	අවුරුදු 4	25%
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	අවුරුදු 8	12.5%
කාර්යාල උපකරණ	අවුරුදු 8	12.5%
යන්ත්‍ර	අවුරුදු 8	12.5%
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	අවුරුදු 3	33.33%

3.1.4 ජීවවිද්‍යාත්මක වත්කම්

ජීවවිද්‍යාත්මක වත්කම් යම් ජීවී සත්ත්වයෙකුට හෝ පැළෑටියකට අදාල වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41ට අනුව, ජීවවිද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් යම් පොදු ලක්ෂණ කිහිපයක් ඇත, එනම්, (අ) වෙනස් වීමට ඇති හැකියාව (ජීවවිද්‍යාත්මක ලෙස පරිවර්තනයවීමේ හැකියාව) (ආ) වෙනස්වීම කළමනාකරණය කරගැනීම (එම ක්‍රියාවලිය සිදුවීම සඳහා අවශ්‍ය තත්ත්වයන් වැඩිදියුණුකිරීමෙන් ජීවවිද්‍යාත්මක පරිවර්තනය වීම සඳහා කළමනාකරණය මගින් පහසුකම් සලසයි. එවැනි කළමනාකරණයක් මගින් කෘෂිකාර්මික කටයුතු වෙනත් කටයුතුවලින් වෙන් කර දක්වයි. උදාහරණයක් ලෙස, කළමනාකරණය නොකරන ලද මූලාශ්‍ර මගින් අස්වැන්න ලබාගැනීම) සහ (ඇ) වෙනස්වීම ගණනය කිරීම (ජීවවිද්‍යාත්මක ලෙස පරිවර්තනය වීමේ හෝ එමගින් ඇති වූ වෙනස දෛනික කළමනාකරණ කාර්යයක් ලෙස ගණනය කර, අධීක්ෂණය කෙරේ.)

ජීවවිද්‍යාත්මක වත්කම්, ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් (bearer biological assets) සහ පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් (consumable biological assets) ලෙස දෙවැදෑරුම් වේ.

3.1.4.1 ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් (Bearer Biological Assets)

පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් හැර අන් වත්කම් ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් වන අතර, සංස්ථාවට අදාලව තේ පඳුරු, රබර් ගස් හා ඕනෑම ක්ෂේත්‍ර වගාවක් වැනි ප්‍රධාන පෙලේ වැවිලි කටයුත්තක් ඊට අයත් විය හැකිය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් ලබා දී ඇති විකල්පය පරිදි යම් සමුච්චිත ක්ෂය කිරීමක් හා යම් සමුච්චිත හායන පාඩුවක් අඩු කර ලැබෙන පිරිවැයට මෙහි අගය ඉදිරියට ගෙන යනු ලැබේ.

ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය පහත සඳහන් පරිදි වේ:

පොල්	අවුරුදු 25	කොකෝවා	අවුරුදු 20
ගම්මිරිස්	අවුරුදු 15	කුරුඳු	අවුරුදු 25
රබර්	අවුරුදු 35	සාදික්කා	අවුරුදු 30
		නැවත වන වගාකිරීම	අවුරුදු 25
කරාබුනැටි	අවුරුදු 50		
කෝපි	අවුරුදු 25	ඉඟුරු	එක් වසරයි
පුවක්	අවුරුදු 40		

3.1.4.2 පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම්

කෘෂිකාර්මික නිෂ්පාදිතයක් ලෙස අස්වැන්න ලබාගත හැකි හෝ ජීවවිද්‍යාත්මක වත්කම් ලෙස අලෙවි කළ හැකි වත්කම් පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් වන අතර, ඊට දැව ඇතුලත් වේ. කෘෂිකාර්මික නිෂ්පාදිත වෙළඳපොලය රැගෙන යාම සඳහා අවශ්‍ය පිරිවැය සහ ඇස්තමේන්තුගත අලෙවි පිරිවැය අඩු කර ලැබෙන සාධාරණ වටිනාකමට මෙකී නිෂ්පාදිත අගය කෙරේ. ඇගයීම මත යම් ලාභයක් හෝ පාඩුවක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනාගැනේ.

3.1.4.3 කල් තබන ලද වත්කම්

කල් තබන ලද වත්කම් වාර්ෂිකව 10%ක අනුපාතයට ක්‍රමක්ෂය කෙරේ.

3.1.5 ආයෝජන දේපල

ප්‍රාග්ධන ඇගයීම සඳහා සහ/හෝ කුලී ආදායම් ඉපැයීම සඳහා තබාගත් දේපල ආයෝජන දේපල තුල අන්තර්ගත වේ. අදාල ගණුදෙණු පිරිවැය හා ඉන් අනතුරුව යම් දේපලකට එකතු කිරීම, යම් දේපලක් ආදේශ කිරීම හෝ අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් හටගත් පිරිවැය ඇතුලු පිරිවැයට මෙම දේපල මූලික වශයෙන් ගණනය කෙරේ. ඉන්පසුව සිදු කෙරෙන ගණනය කිරීම් ද සමුච්චිත ක්‍රමක්ෂය කිරීමෙන් අඩු කර ලැබෙන පිරිවැයට සිදු කෙරේ.

3.1.6 දැනට සිදු කරගෙන යන ප්‍රාග්ධන කාර්යයන් (Capital work in progress)

වර්ෂය තුල හට ගත්, එහෙත් ශේෂ පත්‍රය සකස් කරන දිනට ප්‍රාග්ධනීයකරණය නොකරන ලද ප්‍රාග්ධන වියදම්, දැනට සිදු කෙරෙන ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුල ප්‍රාග්ධනීයකරණය කරන ලද සහ භාවිත කළ ප්‍රාග්ධන වත්කම්, දේපල, පිරියත හා උපකරණවලට මාරු කර ඇත.

3.1.7 කල්බදු පහසුකම්

යම් පහසුකම් සැලසීමක් කල්බදු පහසුකමක් හෝ ඊට කල්බදු පහසුකමක් ඇතුලත් වන්නේද යන්න තීරණය කිරීම, එකී පහසුකමේ අන්තර්ගතය මත පදනම් වන අතර, එම පහසුකම් සැලසීම සපුරාලීම, යම් නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිත කිරීම මත සහ එමගින් වත්කම භාවිත කිරීමට අයිතිය ලබාදෙන්නේද යන්න මත රඳා පවතී.

මූල්‍ය කල්බදු පහසුකම්

වත්කම්හි අයිතියට ආනුශංගික වන, එහෙත් අත්‍යවශ්‍යයෙන් නීතිමය හිමිකම් නොවන සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු අන්දමින් ප්‍රතිපාර්ශ්වයන් වෙත මාරු කරන ගිවිසුම්, මූල්‍ය කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ.

සංස්ථාව මූල්‍ය කල්බදු පහසුකම් යටතේ කල්බදුපහසුකම ලබාගන්නා බවට පත්වන විට, කල්බදු පහසුකමට යටත් වත්කම් ප්‍රාග්ධනීයකරණය කර, 'දේපල, පිරියත හා උපකරණ' තුල ඇතුලත් කරන අතර, කල්බදු පහසුකම් සපයන්නා හට ඇති කෙරෙන වගකීමේ බැඳීම 'කල්බදු ණයහිමිකරුවන්' තුල ඇතුලත් කෙරේ. වත්කමේ සාධාරණ වටිනාකමට හෝ වටිනාකම අඩු මට්ටමක පවතී නම්, අවම කල්බදු ගෙවීම්වල වත්මන් වටිනාකමට මූල්‍ය කල්බදු පහසුකමක් හා ඊට අදාල වගකීම මූලික වශයෙන් හඳුනාගැනේ. වගකීමේ ශේෂය මත ස්ථිර පොලී අනුපාතයක් ලබා දිය හැකි පරිදි කල්බදු පහසුකම තුල සැඟවුණු පොලී අනුපාතය මත පදනම්ව කල්බදු කාලසීමාව තුල 'ශුද්ධ පොලී ආදායම' තුල ගෙවිය යුතු මූල්‍ය ගාස්තු හඳුනාගැනේ.

මෙහෙයුම් කල්බදු

අනෙකුත් සියලුම කල්බදු පහසුකම් මෙහෙයුම් කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ. සංස්ථාව කල්බදු පහසුකම ලබාදෙන්නා බවට පත්වන විට, කල්බදු දී ඇති වත්කම් ශේෂ පත්‍රය තුල හඳුනා නොගැනේ. කල්බදු කාලසීමාවන් තුල මෙහෙයුම් කල්බදු යටතේ ගෙවිය යුතු හා ලැබිය යුතු කුලී ගාස්තු සෘජු රේඛීය පදනම මත ගිණුම්ගත කෙරෙන අතර, පිළිවෙලින් **'පරිපාලන වියදම්'** සහ **'වෙනත් මෙහෙයුම් ආදායම්'**හි ඇතුලත් කෙරේ.

3.2.1 තොග/භාණ්ඩ ලේඛන

පෙර පිවිසි පෙර නිකුත්(First in first out) පදනම මත අගයන ලද, යල්පැන ඇති හා සෙමින් ක්‍රියාකරන අයිතමයන් සඳහා දීමනා ලබාදීමෙන් අනතුරුව, පිරිවැයට හා නිෂ්කාශනය කළ හැකි ශුද්ධ වටිනාකමට (Net Realizable Value) හෝ මින් කවර හෝ අඩු අගයකට භාණ්ඩ ලේඛන හඳුනාගැනේ.

භාණ්ඩ ලේඛන ගණනය කිරීම

3.2.2 භාණ්ඩ ලේඛනවල පිරිවැය

අමුද්‍රව්‍ය

යම් ආනුශංගික වියදමක් ද සහිතව මිලදීගැනීම්වල පිරිවැය.

දැනට සිදු කරගෙන යන කාර්යයන්

අමුද්‍රව්‍ය පිරිවැය හා විචලනය වන මුළු නිෂ්පාදන වියදම්.

නිම කර ඇති භාණ්ඩ

අමුද්‍රව්‍ය පිරිවැය හා විචලනය වන මුළු නිෂ්පාදන වියදම්.

3.2.3 මුදල් හා මුදල් සමානයන්

මුදල් හා මුදල් සමානයන් තුල අතේ හා බැංකුවේ ඇති මුදල්, ස්ථාවර තැන්පතු ආයෝජන, අතිශයින් ඉහළ ද්‍රවශීලතාවකින් යුතු, මාස හයකින් හෝ ඊට අඩු කාලයකින් නියම ලෙස කල් පිරෙන වෙනත් කෙටි කාලීන ආයෝජන ඇතුලත් වේ. ශේෂ පත්‍රයේ ජංගම වගකීම්හි ණය ගැනීම් තුල බැංකු අයිරා පෙන්නුම් කෙරේ.

3.2.4 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබාගැනීමේ අරමුණින් සිදු කරන පර්යේෂණ කටයුතු සඳහා දරන වියදම්, ඒවා හටගැනීමේදී ලාභාලාභ තුල හඳුනාගැනේ.

4. වගකීම් හා ප්‍රතිපාදන

4.1 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්

4.1.1 අර්ථනිරූපිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාමික පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, සංස්ථාව පාරිතෝෂික ගෙවීමට බැඳී සිටියි. සංස්ථාව සමඟ අඛණ්ඩ වසර පහක කාලසීමාවක් සම්පූර්ණ කිරීම මත පමණක් යම් සේවකයෙකු හට පාරිතෝෂික පිළිබඳ වගකීමක් ඇති කෙරේ. මෙම වගකීම සපුරාලීම පිණිස, ශේෂ පත්‍රය තුල යම් ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යයි. වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදන හා වර්ෂය අවසානයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර වෙනස ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ.

මෙම වගකීම සඳහා බාහිර වශයෙන් අරමුදල් නොසැපයේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් යටතේ වර්ග කෙරේ.

4.1.2 අර්ථනිරූපිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල

සංස්ථාව මගින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට දායකත්ව මුදල් සපයනු ලැබේ. අදාල රෙගුලාසිය හා සමගාමීව, අදාල දායකත්ව අරමුදල් මගින් මෙම දායකත්ව මුදල් ආවරණය කෙරේ. සේවකයින් ආවරණය කරනු ලබන සැලසුම් සඳහා දායකත්වය ලබාදීමේ වගකීම ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනේ.

සේවක අර්ථසාධක අරමුදල, වතු සේවක අර්ථසාධක අරමුදල, ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය

සංස්ථාව හා සේවකයින් විසින් මූලික වැටුප මත ඔවුන් තෝරාගත් ක්‍රමයක් මත සේවක අර්ථසාධක අරමුදල /වතු සේවක අර්ථසාධක අරමුදල / ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමයට 12%ක් සංස්ථාවෙන්ද, 10%ක් සේවකයින්ගෙන්ද දායක මුදලක් ලබා දෙයි.

සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල

සංස්ථාව විසින් මූලික වැටුප මත සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට 3%ක දායක මුදලක් ලබා දෙයි.

5. ආදායම් ප්‍රකාශය

මෙම ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය වෙනුවෙන්, වියදම් ක්‍රමවේදය මගින් සාධාරණ ලෙස සංස්ථාවේ කාර්යාසාධනයේ අංග නිරූපණය වන හෙයින්, එකී ක්‍රමවේදයේ කාර්යයන් සඳහා අනුගත වේ.

5.1.1 ආදායම් හඳුනාගැනීම

සංස්ථාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාව සහිත මට්ටම දක්වා ආදායම් හඳුනාගැනෙන අතර, ගෙවීම සිදු කෙරෙන අවස්ථාව නොසලකා හරිමින් සාධාරණ ලෙස ආදායම් ගණනය කළ හැකිය. ගිවිසුම්ගත ආකාරයෙන් අර්ථනිරූපිත ගෙවීම් නියමයන් සැලකිල්ලට ගනිමින්, ලද හෝ ලැබිය යුතු මුදලේ සාධාරණ වටිනාකමට ආදායම් ගණනය කෙරේ.

ආදායම් හඳුනාගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනාගැනීමේ පරිපාටිය ද සපුරාලිය යුතුය:

භාණ්ඩ අලෙවි කිරීම

සාමාන්‍යයෙන් භාණ්ඩ බෙදාහැරීම මත භාණ්ඩවල අයිතියේ සුවිශේෂී අවදානම් හා ප්‍රතිලාභ ගැණුම්කරු වෙත විතැන් වන විටදී, භාණ්ඩ අලෙවියෙන් ලද ආදායම් හඳුනාගැනේ.

සේවා සැපයීම

සේවා සපයන ලද හෝ ඉටු කරන ලද ගිණුම්කරණ කාලසීමාවේ සපයනු ලබන සේවාවන්ගෙන් ලද ආදායම් හඳුනා ගැනේ.

වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගැනේ. මීට ප්‍රධාන වශයෙන් ආදායම් කළමනාකරණය කිරීම, ලියාපදිංචි ගාස්තු, ගස් සම්බන්ධ ටෙන්ඩර්වලින් ලද ආදායම් හා කල්බදු කුලී ආදායම් අයත් වේ.

5.1.2 වියදම්

ව්‍යාපාරය මෙහෙයවීමේදී හටගන්නා සියලුම වියදම් වර්ෂය සඳහා ලාභයට අයත්වන ආදායම් තුල අන්තර්ගත කෙරේ. අලුත්වැඩියා කිරීම් හා නවීකරණය කිරීම්, එම වියදම් හටගන්නා වර්ෂයේ ලාභාලාභ තුල අන්තර්ගත කෙරේ.

5.1.3 මූල්‍ය වියදම්

යම් වත්කමක් අපේක්ෂිත ලෙස භාවිත කිරීමට හෝ අලෙවි කිරීමට හෝ සූදානම් කරන තෙක් සැලකිය යුතු කාලසීමාවක් අත්‍යවශ්‍යයෙන්ම වැය වන එකී වත්කම අත්පත්කරගැනීමට, ඉදි කිරීමට හෝ නිෂ්පාදනය කිරීමට සෘජුවම දායක වන ණයට ගැනීමේ පිරිවැය, අදාල වත්කම්හි පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීයකරණය කෙරේ. අනෙකුත් සියලුම ණයගැනීමේ පිරිවැය එම පිරිවැය හටගන්නා කාලසීමාව තුල

වියදම් සේ සැලකේ. සංස්ථාවේ මූල්‍ය වියදම් අයිරාව මත පොලිය, මුදල් මත කොමිස් ගාස්තු, ණය පොලී (බැංකු හා වෙනත්) හා තැරැව්කරුවන්ගේ පොලී යනාදියෙන් සමන්විත වේ.

6. මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම සහ පසුකාලීන ගණනය කිරීම්

6.1 මූල්‍ය වත්කම්

6.1.1 මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39හි විෂය පථය තුල පවතින මූල්‍ය වත්කම්, යෝග්‍ය පරිදි ලාභ හෝ පාඩු, ණය හා ලැබිය යුතු, කල් පිරීමට තබා ඇති ආයෝජන සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර, මූලික හඳුනාගැනීමේදී සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීම පිළිබඳව නිර්ණය කරයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර, ඊට අතිරේකව, ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට නොවන වත්කම් සම්බන්ධයෙන් සෘජුවම ගණුදෙණු පිරිවැයට අදාලව හඳුනාගැනේ.

සංස්ථාවේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන ස්ථාවර තැන්පතු, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු හා අනෙකුත් තැන්පතු ඇතුලත් වේ. ඉහත මූල්‍ය වත්කම් පහත සඳහන් ජංගම වත්කම් යටතේ පෙන්නුම් කරයි.

6.1.2 පසුකාලීන ගණනය කිරීම්

පසුකාලීනව මූල්‍ය වත්කම් ගණනය කිරීම පහත සඳහන් ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

6.1.2.1 ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් තුල අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් හා ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූලික වශයෙන් හඳුනාගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් අලෙවි කිරීමේ හෝ නුදුරු කාලයකදී නැවත මිලදීගැනීමේ අරමුණින් අත්පත්කරගන්නේ නම්, එකී වත්කම් අලෙවිය සඳහා තබාගන්නා ලද වත්කම් සේ වර්ගීකරණය කෙරේ. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල සංස්ථාව සතුව ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට ලද කිසිදු මූල්‍ය වත්කමක් නොවීය.

6.1.2.2 ණය හා ලැබිය යුතු

ණය හා ලැබිය යුතු යනු සක්‍රීය වෙළඳපොලක් තුල සඳහන් නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, පසුකාලීනව එවැනි මූල්‍ය වත්කම්, හායනය කිරීම් අඩු කර ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය (EIR) භාවිත කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ. යම් වට්ටමක් හෝ අත්පත්කරගැනීමක් මත රක්ෂණ වාරිකයක් හා EIRහි වැදගත් අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කෙරේ. මෙම EIR ක්‍රමක්ෂය කිරීම මූල්‍ය ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායම් තුල ඇතුලත් කෙරේ. හායනය මගින් හටගන්නා පාඩු මූල්‍ය ප්‍රකාශයේ සඳහන් මූල්‍ය පිරිවැය තුල හඳුනාගැනේ.

6.1.2.3 කල් පිරීමට තබා ඇති ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් හා ස්ථාවර කල්පිරීම් කල් පිරෙන තෙක් රඳවාගැනීමේ සද්භාවය සහ හැකියාව සංස්ථාව සතු වන විට, එවැනි වත්කම් කල් පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, කල් පිරීමට තබා ඇති ආයෝජන, භායනය අඩු කර, ඵලදායී පොලී ක්‍රමවේදය අනුගමනය කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. අත්පත්කරගැනීමක් මත යම් වට්ටමක් හෝ රක්ෂණ වාරිකයක් සහ EIRහි වැදගත් අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායම් තුල ඇතුලත් කෙරේ. භායනයෙන් ජනනය වන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනාගැනේ. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල සංස්ථාව සතුව කල් පිරීමට තබා ඇති කිසිදු ආයෝජනයක් නොමැත.

.

6.1.2.4 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යන්නට ස්කන්ධ හා ණය ඇපකර යනාදිය ඇතුලත් වේ. ස්ක්න්ධ ආයෝජන විකිණීමට ඇති සේ වර්ගීකරණය කරනුයේ, අලෙවිය සඳහා ඇති හෝ ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකම සඳහා යනුවෙන් වර්ගීකරණය කර නොමැති හෙයිනි. මෙම කාණ්ඩයේ ණය ඇපකර යනු අවිනිශ්චිත කාලසීමාවක් සඳහා තබා ගැනීමට අපේක්ෂා කරන, ද්‍රවශීලතා අවශ්‍යතාවලට සහ වෙළඳපොල තත්ත්වයන්හි වෙනස්කම්වලට ප්‍රතිචාරී ලෙස අලෙවි කළ හැකි ඇපකර වේ.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල සංස්ථාව සතුව විකිණීමට ඇති කිසිදු මූල්‍ය ආයෝජනයක් නොමැත.

6.1.2.5 හඳුනාගැනීමෙන් බැහැර කිරීම

යම් මූල්‍ය වත්කමක් (හෝ අදාල වන පරිදි, මූල්‍ය වත්කමක කොටසක් හෝ ඒ හා සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගැනීමෙන් තොරව බැහැර කරනුයේ,

i). එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වූ විට;
ii). සංස්ථාව මගින් එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිය පවරාදුන් විට හා 'pass-through' ක්‍රමය යටතේ යම් තෙවන පාර්ශ්වයක් වෙත කිසිදු ආකාරයක ප්‍රමාදයකින් තොරව ලද මුදල් ප්‍රවාහ ගෙවීමට යම් වගකීමක් භාර ගත් විට; සහ එමෙන්ම
(අ) සංස්ථාව විසින් සැලකිය යුතු ලෙස වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දී ඇති විට; හෝ
(ආ) සංස්ථාව විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පවරා දී හෝ රඳවා ගෙන නොමැති නමුත්, වත්කමේ පාලනය පවරා දී ඇති විට.

6.1.2.6 මූල්‍ය වත්කම් භායනය වීම

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් භායනය වී ඇති බවට යම් වාස්තවික සාක්ෂියක් පවතීද යන්න සංස්ථාව විසින් සෑම වාර්තා කිරීමේ දිනයකදීම අගයනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුව ඇති යම් සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක ප්‍රතිඵලයක් ලෙස භායනය සිදු ව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් හා සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ හැකි එම මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ

ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත එම පාඩු සිදු කරන ලද සිදුවීම මගින් බලපෑමක් සිදු කර ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් පමණක් එකී මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් කාණ්ඩය හායනය වී ඇතැයි සැලකිය යුතුය.

යම් ණයගැතියන් හෝ ණයගැතියන් කාණ්ඩයකට සුවිශේෂී මූල්‍ය දුෂ්කරතාවකට මුහුණ දෙමින් සිටින බව, පොලී හෝ ප්‍රධාන ගෙවීම් වංචා කිරීම හෝ පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට පත්වන බව හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානය කිරීමකට සූදානම් වන බව සහ වංචාවන් සමඟ සහසම්බන්ධ වන ගෙවුම් හිඟ හෝ ආර්ථික තත්ත්වයන්හි වෙනස්කම් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ තුල ගණනය කළ හැකි අඩුවීමක් ඇති බවට නිරීක්ෂණය කළ හැකි දත්ත මගින් පෙන්නුම් කරන විටෙක හායනය වීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ හැකිය. දැනට සංස්ථාව විසින් ලැබිය යුතු වෙළඳ සඳහා නිශ්චිත ප්‍රතිපාදනයක් හඳුනාගෙන ඇත.

6.1.2.7 ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සංස්ථාව විසින් පළමුව තනි තනි වශයෙන් වැදගත් හෝ එසේ තනි තනි වශයෙන් සුවිශේෂී නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් හායනය වීමක් ඇති බවට වාස්තවික සාක්ෂි පවතින්නේද යන්න අගයනු ලබයි. සුවිශේෂී වන හෝ නොවන යම් තනි තනි වශයෙන් අගයන මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් හායනය වීමක් පිළිබඳ කිසිදු වාස්තවික සාක්ෂියක් නොමැති බවට සංස්ථාව නිර්ණය කරන්නේ නම්, ඊට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් තුල එම වත්කම ඇතුලත් කර, හායනය වීම සම්බන්ධයෙන් සාමූහික ලෙස ඇගයේ. හායනය වීම සම්බන්ධයෙන් තනි තනි වශයෙන් අගයන ලද සහ හායනය වීමක් හඳුනාගත් හෝ එසේ අඛණ්ඩව සිදු වන බව හඳුනාගත් වත්කම් සාමූහික හායන ඇගයුමක් තුල ඇතුලත් නොකෙරේ.

යම් හායන පාඩුවක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම්, වත්කමේ ඉදිරියට ගෙන යන ශේෂය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල (දැනට සිදුව නොමැති අනාගතයේ අපේක්ෂා කරන ණය පාඩු හැර) වෙනස ලෙස එම පාඩුවේ ප්‍රමාණය ගණනය කෙරේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම සඳහා එම මූල්‍ය වත්කමේ මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් ලබා දෙයි.

6.2 මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම හා ගණනය කිරීම

ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වගකීම් හෝ ණය හා ණයගැනීම් හෝ යෝග්‍ය පරිදි ඵලදායී සීමාවක් තුල සීමාසහිත මූල්‍ය උපකරණ ලෙස හඳුනාගෙන ඇති ව්‍යුත්පන්න ලෙස ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39හි විෂයපථය තුල පවතින මූල්‍ය වගකීම් වර්ගීකරණය කෙරේ. සංස්ථාව විසින් මූලික හඳුනාගැනීම්වලදී සිය වගකීම් වර්ගීකරණය පිළිබඳව තීරණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබුවද, ණය හා ණයගැනීම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය පිරිවැය ඔස්සේ ඉදිරියට ගෙන යනු ලබයි. මීට සෘජුවම අදාල වන ගණුදෙණු පිරිවැය ඇතුලත් වේ. සංස්ථාවේ මූල්‍ය වගකීම් තුල වෙළඳ හා වෙනත් ගෙවිය යුතු සහ බැංකු අයිරා ඇතුලත් වේ.

පසුකාලීන ගණනය කිරීම්

මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ.

හඳුනාගැනීමෙන් බැහැර කිරීම

යම් වගකීමක් යටතේ පවතින මූල්‍ය වගකීමක් ඉටු කළ විට හෝ අවලංගු වූ විට හෝ කල් ඉකුත් වූ විට එම වගකීම හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

7. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පළමු වරට අදාළ කරගැනීම (SLFRS/LKAS)

2012 ජනවාරි මස 01 දිනට බලාත්මක වන පරිදි ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රමිතිකරණ ප්‍රමිතීන් හා ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පළමු වරට සංස්ථාව විසින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය ඇතුලු සහ ඒ දක්වා කාලසීමාවන් සඳහා සංස්ථාව විසින් මුල් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව සිය මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

8. දේපළ, පිරියත සහ උපකරණ

ශ්‍රී.ල.රු

ප්‍රධාන කාර්යාලය.	සින්නක්කර ඉඩම්	ගොඩනැගිලි	උපකරණ	ගෘහ භාණ්ඩ	මෝටර් වාහන	පරිගණක	එකතුව
පිරිවැය හෝ තක්සේරුව							
2019 ජනවාරි 1 දිනට	4,031,845	4,959,427	11,735,966	4,965,787	66,115,401	3,942,710	95,751,135
එකතුකිරීම්	-	-	312,900	267,077	-	477,300	1,057,277
බැහැර කිරීම්	-	-	-	-	-	-	-
මාරු කිරීම	-	-	-	-	-	-	-
2019 දෙසැම්බර් 31 දිනට	**4,031,845**	**4,959,427**	**12,048,866**	**5,232,864**	**66,115,401**	**4,420,010**	**96,808,412**
ක්ෂය වීම							
2019 ජනවාරි 1 දිනට	-	4,959,384	10,068,554	2,285,769	66,094,153	2,973,070	86,380,930
වර්ෂය සඳහා ක්ෂය ගැලපීම්	-	-	289,952	318,614	-	465,092	1,073,658
පෙර වසර ගැලපුම්	-	-	-	-	-	-	-
බැහැර කිරීම්	-	-	-	-	-	-	-
මාරු කිරීම			-	-	-	-	-
2019 දෙසැම්බර් 31 දිනට	**-**	**4,959,384**	**10,358,506**	**2,604,383**	**66,094,153**	**3,438,162**	**87,454,588**
ශුද්ධ පොත් අගය							-
2019 දෙසැම්බර් 31 දිනට	**4,031,845**	**43**	**1,690,360**	**2,628,481**	**21,247**	**981,848**	**9,353,825**

වතු	ඉඩම්	ගොඩනැගිලි	උපකරණ, ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	මෝටර් වාහන	වෙනත් නිහිත වත්කම්	යන්ත්‍ර සූත්‍ර	එකතුව
පිරිවැය හෝ තක්සේරුව							-
2019 ජනවාරි 1 දිනට	645,345,972	170,049,025	24,436,218	80,752,692	6,672,973	117,017,392	1,044,274,271
එකතුකිරීම්	-	3,554,269	346,365	-	32,286	-	3,932,920
පෙර වසර ගැලපුම්	-	-	-	-	-	-	-
මාරු කිරීම්	-	-	-	-	-	-	-
බැහැර කිරීම්	-	-	-	-	-	-	-
2019 දෙසැම්බර් 31 දිනට	**645,345,972**	**173,603,294**	**24,782,583**	**80,752,692**	**6,705,259**	**117,017,392**	**1,048,207,191**
ක්ෂයවීම් සහ අපහායන							
2019 ජනවාරි 1 දිනට	-	104,834,455	18,647,901	69,709,160	6,672,972	97,633,072	297,438,210
වර්ෂය සඳහා ක්ෂය ගැලපීම්	-	4,085,009	477,822	434,532	-	2,733,733	7,731,096
පෙර වසර ගැලපුම්	-	-	-	-	-	-	-
බැහැර කිරීම්	-	-	-	-	-	-	-
මාරු කිරීම්	-	-	-	-	-	-	-
2019 දෙසැම්බර් 31 දිනට	**-**	**108,919,463**	**19,125,722**	**70,143,692**	**6,672,972**	**100,366,805**	**305,169,306**
ශුද්ධ පොත් අගය							
2019 දෙසැම්බර් 31 දිනට	**645,345,972**	**64,683,831**	**5,656,860**	**10,609,000**	**32,287**	**16,650,588**	**743,037,886**
2019 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ සහ වතුවල ශුද්ධ පොත් අගය (ප්‍රධාන කාර්යාලය සහ වතු එකතුව)	**649,377,816**	**64,683,874**	**7,347,220**	**13,237,481**	**53,534**	**17,632,436**	**752,391,710**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

9 ජීවවිද්‍යාත්මක වත්කම්

9.1 පාරිභෝජ්‍ය ජීවවිද්‍යාත්මක වත්කම්

	2019.12.31 දිනට	2018.12.31 දිනට
	රු.	රු.
දැව	**3,314,581,133**	**3,314,581,133**

මෙම දැව ප්‍රදේශවලින් කොටසක් නාකල්ස් රක්ෂිතයට අයත්වීම හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සීමා නිර්ණය කිරීම අවසන් කර නොමැති බැවින් 2019 වර්ෂය තුළ කිසිදු තක්සේරුවක් සිදු කර නොමැත. එසේම තක්සේරුව සඳහා විශාල මුදල් ප්‍රමාණයක් පිටතට ගලායාමක් සිදුවන හෙයින් හා පවතින දුෂ්කර මුදල් ප්‍රවාහ තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවහට මෙම වියදම් දැරීමට මේ අවස්ථාවේ හැකියාවක් නොමැත.

9.2 **ධාරක ජීවවිද්‍යාත්මක වත්කම්**

ධාරක ජීව විද්‍යාත්මක වත්කම් සමුච්චිත ක්ෂයවීම් වලට වඩා අඩු වියදමකින් පවත්වාගෙන යනු ඇත.

පිරිවැය	තේ	පොල්	ගම්මිරිස්	රබර්	කෝපි	වෙනත්	ප්‍රතිවනරෝපණය	එකතුව
පිරිවැය හෝ තක්සේරුකිරීම්								
2019 ජනවාරි 1 දිනට	**470,852,820**	**3,809,207**	**3,238,219**	**15,270,484**	**1,501,242**	**4,485,155**	**24,505,428**	**523,662,555**
එකතුකිරීම්	14,147,029	-	303,874	-	-	582,224	5,807,917	**20,841,044**
පෙර වර්ෂයේ ගැළපීම්								
මාරුකිරීම්								
බැහැරකිරීම්								
2019 දෙසැම්බර් 31 දිනට	**484,999,849**	**3,809,207**	**3,542,092**	**15,270,484**	**1,501,242**	**5,067,379**	**30,313,346**	**544,503,598**

ක්ෂයවීම්	තේ	පොල්	ගම්මිරිස්	රබර්	කෝපි	වෙනත්	ප්‍රතිවනරෝපණය	එකතුව
2019 ජනවාරි 1 දිනට	**359,057,094**	**2,668,938**	**2,034,117**	**3,119,337**	**1,411,788**	**745,906**	**2,352,890**	**371,390,070**
වසරෙහි ක්ෂයවීම් සඳහා ගාස්තු	2,074,377	38,690	96,827	370,329	5,132	223,890	1,101,536	3,910,779
පෙර වර්ෂයේ ගැළපීම්								
බැහැරකිරීම්								
2019 දෙසැම්බර් 31 දිනට	**361,131,471**	**2,707,628**	**2,130,944**	**3,489,666**	**1,416,920**	**969,796**	**3,454,426**	**375,300,850**

ශුද්ධ පොත් අගය								
2019 දෙසැම්බර් 31 දිනට	**123,868,378**	**1,101,579**	**1,411,149**	**11,780,818**	**84,322**	**4,097,583**	**26,858,920**	**169,202,749**

මුළු ජීවවිද්‍යාත්මක වත්කම් (සටහන 9.1 + 9.2)								**3,483,783,882**

10 ආයෝජන දේපළ

	2019.12.31 දිනට	2018.12.31 දිනට
	රු.	රු.
රජය විසින් සපයා ඇති දේපළ	1,600,601,926	1,600,601,926
ප්‍රාග්ධන අගය වැඩිකිරීම් සඳහා ඉඩම්	10,918,715	10,918,715
	1,611,520,641	**1,611,520,641**

1982 පෙබරවාරි 27 දිනැති අංක 181/12 ගැසට් පත්‍රයට අනුව සමහර වතුවල අයිතිය ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා ඇත. මේවා 1992 දී දීර්ඝ කාලීන බදු පදනම මත ප්‍රාදේශීය වැවිලි සමාගම් දහනවයක් (19) වෙත හාර දෙන ලදී. කළමනාකාරිත්වයේ අදහස වන්නේ මෙම ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දුන් දිනට එම ඉඩම්වල පිරිවැය සාධාරණ ලෙස ඉඩම් පිරිවැය පිළිබිඹු කරන බවත් එවැනි මුදල් පොත්පත්වල ඉදිරියට ගෙන යන බවත්ය

ශ්‍රී.ලං.ගි.ප්‍ර 40 ට අනුව, ආයෝජන දේපලක් මුල් අවස්ථාවේදී (මාරු කිරීමේ ස්ථානයේ) එහි පිරිවැයෙන් මනිනු ලබන අතර පසුව සාධාරණ වටිනාකම් ආකෘතිය හෝ පිරිවැය ආකෘතිය භාවිතා කරයි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වෙත පරිවර්ථනය වන අවස්ථාවේ මාරුකිරීම සිදුකළ දිනයේ අධීක්ෂණ අගයන් ලබා ගැනීමට කළමනාකාරීත්වයට නොහැකි වූ අතර ඒ වෙනුවට ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දෙන අවස්ථාවේ වටිනාකම වතු වල සාධාරණ වටිනාකම ලෙස සැලකේ. එබැවින් 1992 වන විට ඉඩම් වටිනාකම ප්‍රාදේශීය වැවිලි සමාගම්වල ශේෂ පත්‍රවලින් සමානුපාතිකව උපුටා ගන්නා ලදී.

මෙම ආයෝජන දේපල මේ වසරේදී තක්සේරු නොකළේ, තක්සේරු කිරීම සඳහා විශාල මුදලක් අවශ්‍ය වන බැවින් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි වත්මන් මුදල් ප්‍රවාහ තත්ත්වය හේතුවෙන් විශාල ව්‍යවස්ථාපිත හිඟ මුදල් පවා මේ වනවිට පියවා නොගන්නා මොහොතක මෙවැනි විශාල වියදමක් දැරීමට ඉඩ නොදෙන බැවිනි..

11 තොග

	2019.12.31 දිනට	2018.12.31 දිනට
	Rs.	Rs.
නිමි නිෂ්පාදන	46,371,519	38,764,682
භාවිත කළ හැකි තොග	16,131,121	9,476,474
	62,502,640	**48,241,155**

ඉන්වෙන්ටරි අගය ගණනය කරනු ලැබුවේ පිරිවැයේ අඩු අගය සහ දළ තථ්‍ය අගය (NRV) සලකා බැලීමෙන් පසුවය..

12 වෙළඳ හා වෙනත් ලැබීම්

	2019.12.31 දිනට	2018.12.31 දිනට
	Rs.	Rs.
වෙළඳ ණයකරුවන් - ප්‍රධාන කාර්යාලය(අ)	37,326,686	49,756,365
අඩුවීම් : ප්‍රධාන කාර්යාලයේ විශේෂ අපහායනයන්	(15,404,568)	(15,404,568)
වෙළඳ ණයකරුවන් - සියලු වතුයායන් (ආ)	131,312,469	64,303,903
අඩුවීම් : වතු ණයකරුවන්ගේ විශේෂ අපහායනයන්	(49,128,420)	(49,128,420)
වෙනත් අයවීම් - ප්‍රධාන කාර්යාලය	22,173,326	21,822,783
වෙනත් අයවීම් - වෙනත් වතුයායන්	48,930,252	44,201,179
	175,209,745	**115,551,243**

a). වෙළඳ ණයකරුවන් - ප්‍රධාන කාර්යාලයට පහත දෑ ඇතුළත් වේ.

B.C.C. කම්පැනි	15,404,568	15,404,568
අඩුවීම් : ප්‍රධාන කාර්යාලයේ විශේෂ අපහායනයන්	(15,404,568)	(15,404,568)
අමු දළු මිලදී ගන්නන්ගෙන් ලැබී යුතු අයවීම්	13,720,320	25,899,588
ඇල්කඩුව වතුයාය	1,916,092	1,916,092
වුඩුසයිඩ් වතුයාය	992,125	992,125
ඩුක්වරි	2,500,000	2,500,000
සුළු සහ වෙනත් ණයකරුවන්	2,793,581	3,043,992
	21,922,118	**34,351,797**

b). වෙළඳ ණයකරුවන් - වතුයායට පහත දෑ ඇතුළත් වේ.

විවිධ ණයකරුවන්	28,869,877	7,754,648
පාරිභෝගික ණයකරුවන්	41,071,407	41,071,407
සුළු ආදායම් ණයකරුවන්	2,588,530	2,588,530
ජ.ව.සං.මි	1,668,269	1,668,269
නිෂ්පාදනය සඳහා ණයකරුවන්	726,644	752,520
අඩුවීම් : වතු ණයකරුවන්ගේ විශේෂ අපහායනයන්	(47,537,070)	(47,537,070)
අඩුවීම් : බොල් ණය සඳහා ප්‍රතිපාදන	(1,591,349)	(1,591,349)
අන්තර් වැවිලි ජංගම ගිණුම්	1,930,180	1,930,180
වෙනත් ණයකරුවන්	54,457,563	8,538,349
	82,184,050	**15,175,484**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

13	මුදල් හා ඒ හා සමාන දෑ	2018.12.31 දිනට	2018.12.31 දිනට
	වාසිදායක ශේෂය : :	රු.	රු
	අත ඇති හා බැංකුවේ ඇති මුදල්		
	- ප්‍රධාන කාර්යාලය	36,406,748	52,932,601
	- වතුයායන්	1,306,864	879,699
		37,713,613	**53,812,300**

14	දායක ප්‍රාග්ධනය	2019.12.31 දිනට	2018.12.31 දිනට
		රු.	රු
	රාජ්‍ය දායකත්වය	3,263,262,947	3,041,262,947
	ඉඩම් සඳහා රාජ්‍ය දායකත්වය	2,616,589,903	2,616,589,903
		5,879,852,850	**5,657,852,850**

1982 පෙබරවාරි 27 දිනැති අංක 181/12 ගැසට් පත්‍රයට අනුව සමහර වතුවල අයිතිය ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා ඇත. මේවා 1992 දී දීර්ඝ කාලීන බදු පදනම් මත ප්‍රාදේශීය වැවිලි සමාගම් දහනවයක් (19) වෙත භාර දෙන ලදී.
කළමනාකාරිත්වයේ අදහස වන්නේ මෙම ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දුන් දිනට එම ඉඩම්වල පිරිවැය සාධාරණ ලෙස ඉඩම් පිරිවැය පිළිබිඹු කරන බවත් එවැනි මුදල් පොත්පත්වල ඉදිරියට ගෙන යන බවත්ය.

15	සේවක ප්‍රතිලාභ වගකීම්	2019.12.31 දිනට	2018.12.31 දිනට
		රු.	රු.
	පටන්ගැන්මේ දී ශේෂය- වතුයාය	324,998,628	337,135,449
	ප්‍රධාන කාර්යාලය	14,599,498	15,067,921
	වසර සඳහා ප්‍රතිපාදන	33,828,923	25,853,232
	ඌන ප්‍රතිපාදන / අතිරික්ත ප්‍රතිපාදන ගැලපුම් (වතුයාය හා ප්‍රධාන කාර්යාල)	80,087,086	(10,612,275)
	ගෙවිය යුතු පාරිතෝෂික වෙත මාරු කිරීම්	(18,349,821)	(17,658,276)
	වසර තුළ ගෙවීම්	(14,384,929)	(9,024,774)
	වෙනත් ගනුදෙනු	(3,140,202)	(1,163,150)
		417,639,183	**339,598,127**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

16 වෙළඳ සහ අනෙකුත් ගෙවීම්

	2019.12.31 දිනට	**2018.12.31 දිනට**
	රු.	රු.
ප්‍රධාන කාර්යාලය (අ)	296,618,062	277,029,870
වතුයාය (ආ)	1,020,004,690	812,109,113
මෙහෙයුම් නොවන ශේෂය	1,933,044	1,933,044
	1,318,555,797	**1,091,072,027**

අ). ප්‍රධාන කාර්යාල සඳහා වෙළඳ සහ අනෙකුත් ගෙවීම්වලට පහත දැ ඇතුළත් වේ	**2019.12.31 දිනට**	**2018.12.31 දිනට**
අත්තිකාරම් - ඔපල්ගල (කල්බදු අත්තිකාරම්)	4,480,000	4,480,000
දැව අත්තිකාරම්	786,379	786,379
පොලි කෙමික්ස්	715,389	715,389
පර්ත් වතුයාය	6,932,399	6,932,399
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	97,709,342	97,709,342
බ්‍රෝකර්වරුන් - LCBL සහ CTB	16,030,780	8,968,682
ලැබුණු අත්තිකාරම් - අමු තේ දළු ගැනුම්කරුවන්	11,756,571	15,369,689
රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029	28,709,029
පොහොර සංස්ථාව	35,931,679	35,931,679
හලාවත වැවිලි සමාගම	34,810,959	33,210,959
ණය - ලංකා බණිජ වැලි	25,000,000	25,000,000
උපචිත වියදම්	5,576,019	2,903,924
සේ.අ.අ/ ව.සේ.අ.අ/වැ.අ.අ - ගෙවිය යුතු	6,340,558	1,099,708
සේ.භා.අ	157,034	123,447
ගෙවිය යුතු පාරිතෝෂික	-	290,420
වෙනත් ගෙවිය යුතු දෑ	18,880,925	11,997,826
ගස් අලෙවිය මත ණය	2,801,000	2,801,000
එකතුව	**296,618,062**	**277,029,870**

b). වතු සඳහා වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු දේවලට පහත දැ ඇතුළත් වේ	**2019.12.31 දිනට**	**2018.12.31 දිනට**
සුළු ණය දෙන්නන්	70,854,109	48,154,401
ඇල්කඩුව වතුයාය	172,137	172,137
නැවත ගෙවනු ලබන ටෙන්ඩර් ගාස්තුව	6,379,570	6,379,570
වෙනත් වගකීම්	21,325,404	19,646,826
වෘත්තිය සමිති	6,595,773	7,585,493
කාර්ය මණ්ඩලයට සහකම්කරුවන්ට ගෙවිය යුතු මුදල්	33,408,555	30,758,462
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	7,289,573	4,789,355
සේ.අ.අ. ගෙවිය යුතු	421,921,940	367,667,260
ව.සේ.අ.අ ගෙවිය යුතු	7,552,308	2,817,215
වැ.අ.අ ගෙවිය යුතු	128,830	104,263
සේ.භා.අ ගෙවිය යුතු	14,380,082	8,189,921
ගෙවිය යුතු පාරිතෝෂික	364,540,128	245,328,735
උපචිත වියදම්	1,489,328	3,718,286
ගෙවිය යුතු පැමිණීම් දීමනා	1,843,993	1,762,706
ගෙවිය යුතු සේ.අ.අ. අධිභාර	42,020,364	49,970,387
ගෙවිය යුතු සේ.නි.භා.අ. අධිභාර	1,195,465	292,830
ගෙවිය යුතු පාරිතෝෂික අධිභාර	14,525,548	7,832,287
වෙනත් ගෙවිය යුතු දෑ	4,381,580	6,938,979
ඒකතුව	**1,020,004,690**	**812,109,113**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

17	ආදායම	2019.12.31 දිනට	2018.12.31 දිනට
		රු	රු.
	තේ	233,893,034	211,586,544
	අමු තේ දළු	292,842,800	376,969,092
	සුළු බෝග	2,262,052	1,238,100
	රබර්	6,935,151	8,156,688
	මුළු ආදායම	**535,933,037**	**597,950,423**

තේ අලෙවියට කසල තේ විකිණීමෙන් ලැබෙන ආදායම ඇතුළත් වේ. අදාළ වියදම් / විකුණුම් පිරිවැය අඩු කිරීමෙන් පසුව කසළ තේ, සුළු බෝග සහ ගස් වලින් ලැබෙන ආදායම පෙන්වනු ලැබේ..

18	වෙනත් ආදායම්	2019.12.31 දිනට	2018.12.31 දිනට
		රු.	රු.
	ගස් ටෙන්ඩර්	55,499,615	55,095,950
	බදුකුලී	28,019,892	30,448,900
	කළමනාකරණ ගාස්තු	15,743,339	16,189,644
	පොලී ආදායම	2,324,060	3,197,413
	හුන්නස්ගිරි දියඇල්ලේ විවේක උද්‍යානයෙන් ලැබෙන ආදායම	1,332,494	3,451,097
	වෙනත් ආදායම් - වතු හා ප්‍රධාන කාර්යාලය	3,132,140	6,535,510
	සංචාරක බංගලා ආදායම	923,195	590,328
	වෙනත් ආදායම්හි එකතුව	**106,974,735**	**115,508,842**

19	පරිපාලන වියදම්	2019.12.31 දිනට	2018.12.31 දිනට
		රු.	රු.
	මානව සම්පත් පිරිවැය	46,850,831	41,954,687
	නිශ්චිත දායකත්ව -සේ.අ.අ , වැ.අ.අ සහ ව.සේ.අ.අ	4,500,999	3,149,081
	නිශ්චිත දායකත්ව - සේ.නි.භා.අ	1,125,250	788,778
	ක්ෂයවීම් - ප්‍රධාන කාර්යාලය	1,073,658	818,234
	පාරිතෝෂික වියදම් - ප්‍රධාන කාර්යාලය හා වතු	33,828,923	25,853,232
	විකුණුම් වියදම්	6,826,920	3,518,478
	වෙනත් පරිපාලන වියදම් - වතු හා ප්‍රධාන කාර්යාලය	71,267,271	52,583,757
	මුළු පරිපාලන වියදම්	**165,473,851**	**128,666,247**

20	මූල්‍ය වියදම්	2019.12.31 දිනට	2018.12.31 දිනට
		රු.	රු.
	මුදල් සහ කොමිස් - වතු	5,049,882	4,694,004
	තේ තැරැව්කරුවන්ගේ අත්තිකාරම් මත පොළිය	3,767,109	4,620,075
	බැංකු ගාස්තු	72,139	50,177
	බැංකු අයිරාපොළිය සහ මුදල් කොමිස්	10,221,274	1,126,160
	වෙනත් ණය පොළී - හලාවත වැවිලි සමාගම	1,600,000	1,600,000
	මුළු මූල්‍යමය වියදම්	**20,710,404**	**12,090,415**

21 ආදායම් බදු

ශ්‍රී.ලං.රා.වැ.ස හි පසුගිය වසර දහඅටක වාර්ෂික ගිණුම්වල ආදායම් බදු ගණනය කිරීම් දක්නට නොලැබේ. මේ හේතුව නිසා සහ අඛණ්ඩ පාඩු පැවතීමත් සමඟ අනාගතයේ දී බදු ගෙවිය හැකි මට්ටමේ ලාභ නොලැබෙනු ඇතැයි උපකල්පනය කරනු ලබන අතර ආදායම් බදු ගෙවීම ශ්‍රී.ලං.රා.වැ.ස මගින් නොකළ හැක්කකි. පසුගිය වසර විසි දෙක තුළ (1995 සිට 2016 දක්වා) ශ්‍රී.ලං.රා.වැ.ස ලාභ ලබා ඇත්තේ වසර හතරක් සඳහා පමණි..

22 ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

රජය සහ රාජ්‍ය පාලිත ආයතන සමඟ ගනුදෙනු

සාමාන්‍ය ක්‍රියාකාරිත්වයේ දී, සංස්ථාව ආශ්‍රිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනුවලට එළඹේ. ආශ්‍රිත පාර්ශ්වයන් අතරට; ශ්‍රී ලංකා රජය (සංස්ථාවේ අවසාන හිමිකරු ලෙස), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය පාලිත ආයතන ඇතුළත් වේ. තනි තනි වශයෙන් වැදගත් වන සහ සාමූහිකව ගත් කලෙක මිස තනිව ගත්කළ වැදගත් නොවන රාජ්‍ය සහ රාජ්‍ය පාලිත ආයතන සමඟ සංස්ථාව විසින් සිදු කරන ලද ගනුදෙනු පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

	2019	2018
	රු.	රු.
හිඟ ශේෂයන්:		
ගෙවිය යුත්තේ		
රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029	28,709,029
පොහොර සංස්ථාව	35,931,679	35,931,679
හලාවත වැවිලි සමාගම	34,810,959	31,610,959
ලංකා මිනරල් සෑන්ඩස් සමාගම	25,000,000	25,000,000
ඇල්කඩුව වතුයාය	172,137	172,137
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	97,709,342	97,709,342
පර්ත් වතුයාය	6,932,399	6,932,399
ලැබිය යුතු		
ඇල්කඩුව වතුයාය	1,916,092	1,916,092
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	41,071,407	41,071,407
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	1,668,269	1,668,269

23 බැඳීම් හා අවිනිශ්චිතතාවයන්

සේවක අර්ථසාධක මුදල්, සේවක භාරකාර මුදල් හා පාරිතෝෂික නොගෙවීම යනාදී කාරණා සම්බන්ධයෙන් ඇතුළුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකාරීත්වයට එරෙහිව මේ වන විට නඩු කටයුතු 516 කට වැඩි ප්‍රමාණයක් ගොනුකර ඇත. සංස්ථාවේ නීතීඥයින් විසින් නඩු කටයුත්ත සාර්ථකවිය හැකි නමුත් එහි සාර්ථකවීමේ සම්භාවිතාවය ඉතා අඩුබවට සංස්ථාව දැනුවත් කරනු ලැබ ඇත.ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශනවලින් කිසිදු අවිනිශ්චිත වගකීමක් සඳහා ප්‍රතිපාදන සපයා නොමැත. කෙසේ වෙතත්, 2019 වර්ෂයේදී ද, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා විසින් 2019 වසරේ භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල්වලින් ව්‍යවස්ථාපිත වගකීම්වලින් කොටසක් ගෙවීමට කටයුතු ඇත. ඊට සමගාමීව 2017.01.01 දින සිට මෙම වගකීම් මාසිකව ගෙවීමට පියවර ගන්නා ලද අතර සේ.අ.අ සහ සේ.නි.භා.අ කිසිදු ප්‍රමාදයකින් තොරව 2019 ජූලි මාසය දක්වා නියමිත වේලාවට ගෙවන ලදී..

24 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති සියලුම වැදගත් සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් සහ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

25 පෙර වර්ෂයේ ගැළපීම්

පූර්ව මුදල් වර්ෂයන්ට අදාළව පෙර වර්ෂයේ ගැළපීම් අතරට පහත ගනුදෙනු ඇතුළත් වන අතර මෙම ගැලපීම් මෙම වර්ෂය තුළ සිදු කරන ලදී.

විස්තර	2019	2018
	රු.	රු.
හිඟ වැටුප්	-	641,567
සේඅඅ/ සේනිභාඅ අධිභාර	-	439,572
පාරිතෝෂික (අධිභාර, ඌන/අධි ප්‍රතිපාදන)	163,532,580	-
වෙනත් වියදම්/ගැලපුම්	10,158,950	-
එකතුව	**173,691,530**	**1,081,138**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAL/C/SLSPC/01/2019/18 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 ජූලි 01 දින

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. අභිතකර මතය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රසිද්ධ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම්

(අ) ප්‍රමිති අංක 13 හි 37 ඡේදය ප්‍රකාරව සංස්ථාව සතු සින්නක්කර ඉඩම් සහ වතු 14 කට අයත් හෙක්ටයාර් 10,917 ක් වූ ඉඩම්වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ප්‍රමිති අංක 16 හි 37 ඡේදය ප්‍රකාරව එක සමාන ස්වභාවයක් හා භාවිතයක් පවතින වත්කම් පමණක් බාණ්ඩ කර ගිණුම්ගත කළ යුතු බව දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංස්ථාවට අයත් වතුයායන්හි පවතින පරිගණක, උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් යන ස්ථාවර වත්කම් වර්ග සියල්ලම උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් යන තනි අයිතමය යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඇ) ප්‍රමිති අංක 40 හි 75 (අ) ඡේදය ප්‍රකාරව ආයෝජිත දේපළ මිණුම් කිරීමට භාවිතා කරන ආකෘතිය මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව හෙළිදරව් කර ඇති ආයෝජිත දේපළ පිරිවැය හෝ සාධාරණ වටිනාකම යන ආකෘති දෙකෙන් කුමන ආකෘතිය භාවිතා කර තිබේද යන්න අනාවරණය කර නොතිබුණු අතර, 1992 වර්ෂයේ ප්‍රාදේශීය වතු සමාගම් ශේෂ පත්‍රවල රු.මිලියන 1,612 ක් ලෙස දක්වා තිබුණු අගයම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආයෝජිත දේපළ යටතේ දක්වා තිබුණි.

(ඈ) ප්‍රමිති අංක 40 හි 75 (ඌ) සහ 78 ඡේද ප්‍රකාරව රු.මිලියන 1,612 ක ආයෝජිත දේපළක (බදු දෙන ලද වතු) ගැණුම්, ඉදිකිරීම් හෝ සංවර්ධනය වන හෝ අලුත්වැඩියා, නඩත්තු හෝ වැඩිදියුණු කිරීම්වලට වන ගිවිසුම්මය බැඳීම් සහ ආයෝජන දේපළෙහි විස්තරයක්,සාධාරණ වටිනාකම විශ්වාසදායී ලෙස නිර්ණය කර හෙළිදරව් කළ යුතු වුවත් සංස්ථාව විසින් 1982 පෙබරවාරි 27 දිනැති අංක 181/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ලබා දී ඇති දේපළ පිළිබඳ කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

(ඉ) ප්‍රමිති අංක 16 හි 37 ඡේදය අනුව කෘෂිකාර්මික කටයුතු වලට අදාළ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දේපළ පිරියත හා උපකරණ යටතේ වෙනම අයිතමයක් ලෙස ඉදිරිපත් කළයුතු වුවද, ජීව විද්‍යාත්මක වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඊ) ප්‍රමිති අංක 41 හි 43 , 44 හා 45 ඡේද ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් පරිනත හා පරිනත නොවූ වගාවන් ලෙස වෙන වෙනම ඉදිරිපත්කළ යුතු වුවත් , සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ අනාවරණය කර තිබුණු රු. 169,202,749 ක ජීව විද්‍යාත්මක වත්කම් එසේ වර්ගීකරණය කර ඉදිරිපත් කර නොතිබුණි.

(උ) ප්‍රමිති අංක 41 හි 4 වන ඡේදය ප්‍රකාරව වන වගාව, පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු වුවත්, පිරිවැය රු.30,313,346 ක් වූ වන වගාව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඌ) ප්‍රමිති අංක 07 හි (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති) ඡේද අංක 07 (අ) සහ (ආ) ප්‍රකාරව ඇප තැබූ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් හෙළිදරවු කිරීමක් සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ බැංකු අයිරා සඳහා ඇප ලෙස තැබූ ස්ථාවර තැන්පතුවලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

(එ) ප්‍රමිති අංක 19 හි 57 වගන්තිය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගැනීම සිදුකළ යුතු නමුත්, සංස්ථාව විසින් සිය ප්‍රතිලාභ ගණනයේදී ආයුගණන ක්‍රමයක් භාවිතා කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවල අංක 3.1.4.2 දරන සටහනෙහි දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගයකට හෙළිදරවු කර ඇති බව දක්වා තිබුණද, 2012 වර්ෂයේදී පැවති රු.3,312,160,200 ක ජීව විද්‍යාත්මක වත්කම් හා 2018 වර්ෂයේදී ප්‍රාග්ධනිත කරන ලද රු.2,420,933 ක ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගයකට තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. තවද, මෙසේ සාධාරණ අගයකට තක්සේරු කර ගිණුම් ගත කිරීම වෙනුවට සංස්ථාව සතු වතු 11 ක හෙක්ටයාර් 726.73 ක් පුරා විහිදුනු වන වගාවන් සමාලෝචිත වර්ෂය අවසානයට සියයට 4 කින් එනම් රු.1,101,536 කින් ක්‍රමක්ෂය කර ගිණුම්ගත කිරීම නිසා සංස්ථාවේ අලාභයද එම වටිනාකමින් අධි ගණනය වී තිබුණි.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාව විසින් රු. 6,189,400 ක ලැබිය යුතු බදු කුලී ආදායමක් හඳුනා නොගැනිම මත එම වටිනාකමින් සංස්ථාවේ අලාභය අධි ගණනය වී ජංගම වත්කම් අඩු වී තිබුණි.

(ආ) සංස්ථාවේ මුළු තොග වටිනාකමින් සියයට 72ක් නියෝජනය කරනු ලබන කැලැබොක්ක , රංගල සහ මිඩිලන්ඩ් වතුයායන්හි සහ තැරැව්කරුවන් සතුව පවතින රු.45,238,955 වටිනා නිමි තේ තොග සහ රු.1,609,054 ක මදුරු කුරු තොගයක් භෞතිකව සත්‍යාපනය නොකර 2017 වර්ෂයේ වූ පොත් අගයක් පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ණය ගැනි ශේෂයට වතුයායන් 06 ක රු.8,051,222 ක් වටිනා පැළ තවාන් ඇතුළත්ව තිබුණි. එහෙත් එම පැළ තවාන් භෞතිකව නොමැතිවීම හෝ යල් පැනීම නිසා ඒවායේ වටිනාකම ශූන්‍ය අගයක් ගෙන තිබුණි.

(ඇ) සංස්ථාවේ වතුයායන් 04 ක සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් සම්බන්ධයෙන් අධිකරණයේ දී ගෙවන ලද රු.61,393,076 සහ රු.5,098,723 ක මුදල් වසර 05 කට වැඩි කාලයක සිට සදොස් ලෙස වර්ගීකරණය කර අරමුදල් තැන්පතු ලෙස වෙළඳ ලැබිය යුතු දෑ තුළ ඇතුළත් කර ඇති අතර එය ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් වලින් ඉවත් නොකිරීම හේතුවෙන් එම වටිනාකම්වල ජංගම වත්කම් සහ ජංගම වගකීම් වැඩි වී තිබුණි. තවද එම ගෙවන ලද අධිභාර ප්‍රමාණය, ගෙවිය යුතු සේවක අර්ථසාධක අධිභාර ගිණුමෙන් සහ ගෙවිය යුතු සේවක භාරකාර අධිභාර ගිණුමෙන් ඉවත් කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඉ) සංස්ථාවේ රු.80,087,086 ක පාරිතෝෂික සඳහා වෙන්කිරීම් වසරේ වියදමක් ලෙස හඳුනාගැනීමකින් තොරව පෙර වර්ෂයන්ගේ ලාභයන්ට ගැලපීමෙන්, එම වටිනාකම්වල සමාලෝචිත වර්ෂයේ අලාභය ඌන ගණනය වී තිබුණි.

(ඊ) ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් රු.32,201,293 ක තේ විකුණුම් අදායමක් ජාතිය ගොඩනැගීමේ බදු ගණනයේදී සැලකිල්ලට නොගැනීම හේතුවෙන් රු.644,025 කින් ජාතිය ගොඩනැගීමේ බදු වියදම් අඩුවී තිබුණි.

1.2.4 නොසැසඳුණු පාලන ගිණුම්

(අ) අන්තර් වතු පාලන ගිණුම්වල හර සහ බැර ශේෂයන් අතර රු.1,930,180 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ප්‍රධාන කාර්යාලයේ සහ වතුයායන් අතර සිදුවන භාණ්ඩ සහ මුදල් හුවමාරු කර ගැනීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් තුළ එකිනෙකට හිලව් නොවන රු.11,837,880 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති, ධාරක ජීව විද්‍යාත්මක සහ දේපළ පිරියත උපකරණ යන වත්කම්වල, ස්ථාවර වත්කම් ලේඛන සහ අදාළ ලෙජර් ගිණුම් අතර, පිළිවෙලින් රු. 12,147,223ක් සහ රු.105,876,078 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ ලෙජර ගිණුම් අනුව සහ මූල්‍ය ප්‍රකාශනය අනුව ප්‍රධාන කාර්යාලයෙහි ඉඩම්වල වටිනාකමෙහි රු.1,645,340 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට වෙනත් අතුරු භෝග සඳහා එකතු කර ඇති වටිනාකම ලෙජරය අනුව හා ජීව විද්‍යාත්මක වත්කම් ලේඛනය අනුව රු. 884,517 ක් වුවද , මූල්‍ය ප්‍රකාශනය අනුව එම ශේෂය රු. 582,224 ක් වූයෙන් මෙම ශේෂ අතර රු. 302,293 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ලෙජර ගිණුම් අනුව ප්‍රාග්ධනිත කරන ලද වනවගා ශේෂය සහ ජීව විද්‍යාත්මක වත්කම් ලේඛනය අනුව ශේෂය අතර රු.192,299 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) සංස්ථාවේ පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සහ ගෙවිය යුතු පාරිතෝෂික ගණනය කිරීම මූල්‍ය ප්‍රකාශන අනුව සහ විගණනකගේ ගණනය කිරීම් අතර පිළිවෙළින් රු.142,418,900 සහ රු.75,436,147 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව පාරිතෝෂික සඳහා ගෙවූ මුදල් ශේෂය සහ විගණනය සඳහා ප්‍රධාන කාර්යාලයෙන් ඉදිරිපත් කළ උපලේඛනවල හා සටහන් අනුව එම ශේෂයන් අතර රු.3,489,937 ක වෙනසක් පැවතිණි.

1.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා ඇති රු.169,015,969 ක ණයගැති ශේෂයන්ගෙන්, වර්ෂ 03 ත් 04 ත් අතර ශේෂය රු.1,199,583 ක් හෙවත් සියයට 0.7 ක් වූ අතර, වර්ෂ 05 ක් ඉක්මවා ඇති ශේෂය රු.83,908,608 ක් හෙවත් සියයට 50 ක් ලෙස වූ අතර මෙම ණය ශේෂ අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේද ඵලදායී ක්‍රියාමර්ග නොතිබීම මත අයකරගැනිමේ අවිනිශ්චිතායක් පැවතිණි.

(ආ) 2014 ඔක්තෝබර් 15 දින සංස්ථාව විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව රු.මිලියන 6 ක ණය මුදලක් ඇල්කඩුව වැවිලි සමාගමට ලබා දී තිබුණු අතර, 2015 වර්ෂයේ සිට සමාගම විසින් ණය මුදල ගෙවීම පැහැර හැරීම හේතුවෙන් අයවිමට නියමිත ඉතිරි ශේෂයවන රු.1,916,092 ක මුදල සඳහා අඩමාණ ණය වෙන්කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 හා 2011 වර්ෂ වලට අදාළව ඕපල්ගල වතුයායේ එකතුව රු.786,379 ක ගස් ටෙන්ඩර් තැන්පතු, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් නොකිරීම මත සංස්ථාවේ වගකීම් අධි තක්සේරු වීමේ අවදානමක් පැවතිණි.

1.2.7 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.1,016,872,943 ක් වූ දේපළ පිරියත හා උපකරණ යටතේ පවතින රු.649,377,817 ක් වූ ඉඩම්, රු.178,562,721 ක් වූ ගොඩනැගිලි වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඔප්පු/බලපත්‍ර , තක්සේරු වාර්තා , වරිපනම් ගාස්තු ගෙවීම් වාර්තා සහ , රු.146,868,093 ක් වූ වාහන වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා වාහන ලියාපදිංචි සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දේපළ පිරියත හා උපකරණ යටතේ පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙනවිත් ඇති රු.1,645,340 ක වන කළමනාකරණ වියදම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයෙහි පැවති රු. 15,906,831 ක් වටිනා ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර තිබුණද එසේ ඉවත් කිරීමට හේතු වූ කරුණු ස්ථාවර වත්කම් ලේඛනයෙහි සඳහන් කර නොතිබුණි.

(ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.3,314,581,133 ක පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සහ රු.169,202,749 ක ධාරක ජීව විද්‍යාත්මක වත්කම් ශේෂයන් සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ලේඛන සහ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ අනාවරණය කර ඇති රු.46,610,451 ක ණයගැති ශේෂ සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි සංස්ථාව සතුව නොතිබුණි.

(ඊ) සංස්ථාවේ රු.58,904,418 ක ණය හිමි ශේෂයන් සහ එකතුව රු.121,684,524 ක ණය ගැනි ශේෂ 21 ක් සඳහා ශේෂ සනාථන සහ පසුකාලින ශේෂ නිරවුල් කිරීම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) 2012 වර්ෂයටත් පෙර සිට පැවත එන සමාලෝචිත වර්ෂයේදීද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ණයගැති ශේෂයෙන් අඩු කර පෙන්වා ඇති රු. 47,537,070 ක විශේෂ හානිකරණය සඳහා වෙන් කිරීම් සහ රු.1,591,349 ක අඩමාණ ණය වෙන්කිරීම් ගණනය සඳහා භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය පැහැදිලි කර නොතිබීම නිසා එහි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඌ) 2012 වර්ෂයටත් පෙර සිට පැවත එන රු.1,933,043 ක අක්‍රීය ශේෂයක් සමාලෝචිත වර්ෂයේදී ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් තුළ අනෙකුත් ගෙවිය යුතු දෑ ලෙස දක්වා තිබුණු අතර, මෙම ශේෂය පිළිබඳ පැහැදිලි කිරිමක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(එ) 2006 වසරේ සිට වතුයායන් 12 කට අයත් රු.6,379,570 ක ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ලෙස ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ සමාලෝචිත වර්ෂයේදී ද පෙන්වා තිබුණු අතර, මෙම ශේෂ සනාථ කර ගැනීම සඳහා ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ශේෂය ගණනය කිරීමේදී වෙනත් ගනුදෙනු ලෙස අඩුකර ඇති රු.3,140,202 ක් සහ රු. 14,525,548 ක පාරිතෝෂික සඳහා ගෙවිය යුතු අධිභාර මුදල හඳුනා ගැනීමට අදාළ ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඔ) වෙළඳ ලැබිය යුතු දෑ හි ඇතුළත් රු.3,567,597 ක බැර ශේෂ පැවතීමට හේතු වූ කරුණු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වෙළඳ ලැබිය යුතු දෑ ශේෂයෙහි නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේදී සැහීමකට පත්විය නොහැකිව තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රඥප්තිය ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද ලද 1.2.1 (ඇ)(ඈ)(ඊ)(උ)(ඌ)(එ), 1.2.2, 1.2.3(ඇ)(ඈ), 1.2.4, 1.2.5.(අ)(ආ), 1.2.6.(ආ)(ඇ)(ඈ) සහ 1.2.7.(අ)(ඇ) (ඈ) (ඊ)(උ)(ඌ)(එ)(ඒ) යන නිර්දේශයන් හැර, අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ)	2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 2 (අ) ඡේදය සහ අංක 02/2015 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය	සංස්ථාව සතු වර්තමානය වන විට භාවිතයට ගත නොහැකි අපහරණය කළ යුතු තත්වයේ පවතින ලොරි රථ 13 ක්, ට්‍රැක්ටර් හා ට්‍රෙලර් 25 ක්, කාර් රථ 07 ක්, ජීප් රථ 03 ක් හා ගිලන් රථ 04 ක් , ත්‍රීවිල් රථ 01 ක් හා මෝටර් බයිසිකල් 43 ක් 2021 ජූලි 09 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය	සංස්ථාව සතු තේ කර්මාන්තශාලා 07 ක් වර්ෂ 5 සිට වර්ෂ 40 කට අධික කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණු අතර, මෙම වසා දමා ඇති කර්මාන්තශාලාවන්හි පවතින ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර, මෙවලම් හා උපකරණ එම වසා දමා ඇති කාලපරිච්ඡේදය තුළම උපයෝජනය කළ නොහැකිව ඇතත් එම වත්කම් අපහරණය කිරීමට හෝ සංස්ථාවට වඩා ලාභදායී ආයෝජන ක්‍රියාවකට යෙදවීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	2009 අංක 09 දරන ජාතිය ගොඩනැගිමේ බදු පනතේ 02 හා 03 වන වගන්තිය	බද්දට යටත් පිරිවැටුම රු.මී. 3 ඉක්මවන සෑම ආයතනයක්ම බද්ද සඳහා ස්වේච්ඡාවෙන් ලියාපදිංචි විය යුතු වුවත් සංස්ථාව එසේ කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඈ)	ජාතිය ගොඩනැගිමේ බදු පනතේ 2 (ඇ) වගන්තිය	වෙනත් ආදායම් ශීර්ෂ යටතේ ලබන ආදායම් බද්දට යටත් විය යුතු නමුත් රු. 106,974,735 ක වෙනත් ආදායම් සම්පූර්ණයෙන්ම ජාතිය ගොඩනැගීමේ බදු ගණනය සඳහා සැලකිල්ලට නොගැනීමෙන් රු.2,139,494 ක බදු ගෙවීම් පැහැර හැර තිබුණි.
(ඉ)	2006 අංක 10 දරන දේශීය ආදායම් බදු (සංශෝධිත) පනතේ 113	පුද්ගලයෙකු හෝ හවුල් ව්‍යාපාරයක් ස්වයං තක්සේරු පදනම මත කාර්තුවක් අවසානයේ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	වගන්තිය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පිළිවෙලින් අගෝස්තු 15, නොවැම්බර් 15, පෙබරවාරි 15 හා ඊළඟ වර්ෂයේ මැයි 15 යන දින හෝ ඊට පෙර ද ඉතිරි බදු මුදලක් වෙතොත් එය ඊළඟ වර්ෂයේ සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර ගෙවිය යුතු නමුත් සංස්ථාව 2019/2020 තක්සේරුවට අදාළ ආදායම් බදු 2021 අප්‍රේල් 22 දින වන විටත් ගෙවා නොමැති අතර ආදායම් බදු වගකීමද ගණනය කර නොතිබුණි.
(ඊ)	2006 අංක 10 දරන දේශීය ආදායම් බදු (සංශෝධිත) පනතේ 106 වගන්තිය	ආදායම් බදු වාර්තාව ඊළඟ වර්ෂයේ නොවැම්බර් 30 හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දිය යුතු නමුත් සංස්ථාව 2019/2020 තක්සේරු වර්ෂයට අදාළ ආදායම් බදු වාර්තාව 2021 අප්‍රේල් 22 දින වන විටත් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට භාර දී නොතිබුණි.
(උ)	2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 02 සහ 06 වන වගන්තිය	කාර්තුවක ආදායම රු.මිලියන 10 ඉක්මවන සෑම ආයතනයක්ම බද්දට යටත් විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව රු.1,339,832ක ආර්ථික සේවා ගාස්තු ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර කාර්තුවක් අවසන් වී එළඹෙන මාසයේ 20 වන දින හෝ ඊට පෙර ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වුවත් සංස්ථාව 2012 වර්ෂයේ සිට 2019 මූල්‍ය වර්ෂය දක්වා වාර්තා භාර දීම හෝ ගාස්තු ගෙවීමක් සිදු කොට නොතිබුණි.

(ඌ)	2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 5 (2) ඡේදය සහ 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5.1.3 වගන්තිය	මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට කලින් ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ව්‍යාපාරික සැලැස්මක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු රේඛීය අමාත්‍යාංශය , රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත් සංස්ථාව විසින් එවැනි වාර්තාවක් පිළියෙළ කර නොතිබුණි.
(එ)	2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ	
	(i) 5.1.3 වගන්තිය	මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට කලින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු රේඛීය අමාත්‍යාංශය වන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන හා මහනුවර නගර සංවර්ධන, රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත් සංස්ථාව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
	(ii) 4.2.3 හා 4.2.6 වගන්ති	කාර්ය සාධන වාර්තා/ ප්‍රගති වාර්තා පිළියෙල කර කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික වශයෙන් ඉදිරිපත්කළ යුතු නමුත් සංස්ථාව එම වාර්තා පිළියෙල කර නොතිබුණි.
	(iii) 5.2.5 වගන්තිය	වාර්ෂික අයවැය මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට කලින් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු රේඛීය අමාත්‍යාංශය වන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන හා මහනුවර නගර සංවර්ධන, රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත් 2019 වර්ෂය වෙනුවෙන්

		පිළියෙල කරන ලද ප්‍රාග්ධන අයවැය ලේඛනය 2019 පෙබරවාරි 14 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණු නමුත් විගණනයට ඉදිරිපත් කරනු ලැබුවේ 2021 පෙබරවාරි 08 වන දින දීය.
	(iv) 6.5.1 වගන්තිය	මූල්‍ය වර්ෂයක් අවසාන වී දින 60 ක් ඇතුළත අස්ථිත්වයට අදාළ වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2020 පෙබරවාරි 25 දින වන අතර, ඒ වන විට ගිණුම් ඉදිරිපත් කළ යුතු කාලය වර්ෂයක් ඉක්ම ගොස් තිබුණි.
(ඒ)	2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනය	තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා ගෙන අදාළ කාර්යය නිම වී දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද, 2019 වර්ෂයේදී නිලධාරීන් 14 දෙනෙකු අවස්ථා 50ක දී ලබාගත් එකතුව රු.342,540 ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 11 සිට දින 321 ක කාල පරාසයක් දක්වා ප්‍රමාද කර තිබුණි.
(ඔ)	1995 ජූලි 25 දින ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද අංක එස්ඒඅයි /ඒ /01/34 දරන රජයේ ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශයේ 9 (ආ) වගන්තිය	වසර 5 කට වරක් කලින් නියම කරන ලද බදු මුදලින් සියයට 150 කට අඩු නොවන පරිදි බදුකුලිය ප්‍රතිශෝධනය නොකිරීම සහ රජයේ තක්සේරු වටිනාකමට වඩා අඩු වටිනාකමක් වාර්ෂික බදු කුලි ලෙස සැලකීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඕපල්ගල වතුයායේ පර්චස් 39.07 ක් ඩයලෝග් බ්‍රෝඩ්බැන්ඩ් පුද්ගලික සමාගමට සහ හුන්නස්ගිරිය රාජ්‍ය වතුයායේ සහ ගම්මඩුව රාජ්‍ය වතුයායේ ස්වාධීන රූපවාහිනී ආයතනයට බදු පදනමට ලබා දුන් ඉඩම් වලින් රු. 18,482,000 ක බදු මුදලක්ද , මාර්ග නඩත්තු මුදල ලෙස ලැබිය යුතු රු.2,484,000 ක්ද

		සංස්ථාවට අහිමි වී තිබුණි.
(ඹ)	2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	MM -1 බාණ්ඩයට අයත් නිලධාරීන්හට වාහන දීමනාව හිමිනොවන නමුත් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් තිදෙනෙකුහට රු.1,350,000 ක නිල වාහන දීමනා හා රු.224,760 ක ඉන්ධන දීමනා ලබාදී තිබුණි.
(ක)	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 හි 3.2.1 වගන්තිය	සභාපතිගේ මාසික ඉන්ධන දීමනාව ලීටර් 170 ක් වුවද එම සීමාවන් ඉක්මවා වර්ෂය තුලදී ඉන්ධන ලීටර් 679ක් ලබා ගෙන තිබූ නමුත් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශ සහිතව අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ග)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වන වගන්තිය හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ ii කොටසේ 16(i) වගන්තිය	2006 වර්ෂයේ සිට රු.421,921,940 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් දායකය සහ රු.14,380,082 ක සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් දායකය සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර, මේ නිසා 2019 වර්ෂය වන විට සංස්ථාවට එකතුව රු.43,215,912 ක අධිභාර පනවා තිබුණි.
(ජ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ ii වන කොටසේ (5) (1) උපවන්තිය	සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත් සංස්ථාව විසින් ඒ පරිද්දෙන් පාරිතෝෂික මුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් 2019 වර්ෂය අවසාන වන විට රු.14,525,548 ක අධිභාර පනවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී

ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව .

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රසම්පාදන සැලැස්මක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මිල ගණන් කැඳවීමකින් තොරව සභාපතිවරයාගේ ප්‍රයෝජනය සඳහා රු.890,680 ක මුදලක් ගෙවා 2019 පෙබරවාරි 23 දින සිට සිට 2019 දෙසැම්බර් 06 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වාහනයක් ලබාගෙන තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2 (අ) ප්‍රකාරව ලංසු එකක් පමණක් ලැබුණහොත් වෙළඳපල වටිනාකම් සමඟ සසඳා ලංසු මිල සාධාරණ නම් ,එම ලංසුව වලංගු බවට සලකනු ලැබිය හැකි බව දක්වා තිබුණද, සංස්ථාවේ රසායනික ද්‍රව්‍ය ලීටර 120ක් මිලදී ගැනීම සඳහා එක් සැපයුම්කරුවකු පමණක් රු.207,000 ක ලංසු ඉදිරිපත් කර ඇති අවස්ථාවක වෙළඳපොළ වටිනාකම් සමඟ එම මිල සැසඳීමකින් තොරව එම සැපයුම්කරු තෝරාගෙන තිබුණි.

(ඈ) 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයා සඳහා ලබාගෙන ඇති වාහන 03 ක් සඳහා රු.2,740,890 ක මුදලක් කුලිය ලෙස ගෙවා තිබුණු අතර එහි ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව පහත සඳහන් අඩුපාඩු හා විෂමතා නිරීක්ෂණය වී තිබේ.මිල ගණන් කැඳවීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් හෝ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.4 මාර්ගෝපදේශය පරිදි Yellow pages හෝ Rainbow pages මඟින් , විනිවිදභාවයකින් යුතුව සැපයුම්කරුවන් තෝරාගෙන නොතිබුණු අතර ලංසු ලේඛනයක් පිළියෙලකර නොමැති අතර තෝරා ගත් සැපයුම්කරු වෙත 3.4.2 (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි අදාළ සේවා ලබාගැනීමේදී තිබිය යුතු කොන්දේසි පිළිබඳව කිසිදු සඳහනක් නොතිබුණ, මිල ගණන් කැඳවීමේ ලිපි ලියාපදිංචි තැපෑලෙන් හෝ 6.3.1 (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි වෙනත් පිළිගත හැකි මාර්ගයකින් යොමුකර නොතිබුණ අතර ඉල්ලා ඇති ආයතන හෝ පුද්ගලයින්ගෙන් ලැබුණු මිල ගණන් ලියාපදිංචි තැපෑලෙන් එවා නොතිබුණු බවත් 6.3 (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව මුද්‍රා තබන ලද ටෙන්ඩර් පෙට්ටියකට බහාලීමක්ද සිදුකර නොමැති අතර, 6.3.3. ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි ලංසු ප්‍රසිද්ධියේ විවෘත කිරීමට කටයුතු කර නොමැති බවත්, තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙනුවට , තාක්ෂණික ඇගයීම් කමිටුව ලෙස ප්‍රසම්පාදන කමිටුව කටයුතු කර තිබුණි. KH 1932 වාහනය කුලියට ගැනීමේදී තෝරාගත් ලංසු කරු ඉදිරිපත් කළ මිල ගණන් හැර සෙසු මිල ගණන් දෙකම ව්‍යාජ මිල ගණන් බව විගණනයට තහවුරු වී ඇත. අවස්ථා දෙකෙහිදී ඉදිරිපත්කර ඇති මිල

ගණන් වල එකම පුද්ගලයාගේ අත්සන් වල සැළකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වී තිබුණි. දුරකථන අංක ඇතුළත් කර නොමැති මෙම මිල ගණන් වල දක්වා ඇති ලිපිනයද ව්‍යාජ ලිපිනයක් බව අනාවරණය කර ගෙන ඇත. මෙම මිල ගණන්වල දක්වා ඇති වාහන අංක පරීක්ෂා කිරීමේදී අනාවරණය වූයේ එම අංක සහිත වාහන මෙම මිල ගණන් ඉදිරිපත් කළ පුද්ගලයන්ට නොව වෙනත් පුද්ගලයින් හෝ ආයතන වලට අයිති වාහන බවයි.

(ඉ) සංස්ථාවේ ස්ථාවර වත්කම් තක්සේරු කිරීම සඳහා ජාතික තරගකාරී ලංසු ක්‍රමය අනුගමනය කර තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 21 ක් වුවද, කොන්ත්‍රාත්කරුවන්ට දින 14 ක කාලයක් පමණක් ලබා දී තිබුණු අතර , තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම සඳහා නිලධාරීන් තිදෙනෙකු සහභාගී වී ඇති නමුත් එම නිලධාරීන් තිදෙනාගෙන් එක් නිලධාරියෙකු අත්සන් කළ දිනයක් දක්වා නොමැති අතර තෝරාගත් තක්සේරුකරු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 ප්‍රකාරව ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ප්‍රකාරව දෙපාර්ශවය අතර කොන්ත්‍රාත් ගිවිසුමකට ද එළඹ නොතිබුණි.

(ඊ) කළුතර දිස්ත්‍රික්කයේ ඉඩම් කැබලි කිරීමට ලංසු කැඳවීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු ක්‍රමයේ ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 21 ක් වුවද, ඒ සඳහා ලංසු ඉදිරිපත් කිරීමට දින 07 ක කාලයක් පමණක් ලබා දී තිබුණු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 (අ) ප්‍රකාරව ලංසුකරුවන් විසින් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණු බවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ප්‍රකාරව දෙපාර්ශවය අතර කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබූ බවත් නිරීක්ෂණය විය. තවද තෝරාගත් ලංසුකරු විසින් අදාළ මැණුම් කටයුතු අවසන්ව ඇතිබව දක්වා එකඟ වූ මුදල ලබාදෙන ලෙස ඉල්ලා ඇති නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.4 අනුව සේවා සම්බන්ධයෙන් කොන්ත්‍රාත්තුවේ සලසා ඇති ප්‍රතිපාදන වලට අනුකූලව සේවා ඉටුකර ඇති බවට වූ විධිමත් සහතිකයක් ස්ථානභාර නිලධාරියා විසින් නිකුත් කර නොතිබුණි.

(උ) ගෝමර වතුයායේ ජල සැපයුම් පද්ධතිය නවීකරණය කිරීම සඳහා මිලගණන් කැඳවීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 වගන්තියේ සඳහන් ආකෘතින්ට අනුව ලංසු විවෘත කිරීමේ කටයුතු වාර්තා නොකිරීම , ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 හි සඳහන් ආකෘතියට ලංසු ඇගයීමේ වාර්තා පිළියෙල නොකිරීම සහ වැඩ අවසන් කරන ලද ප්‍රසම්පාදනයන්හි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 අනුව වැඩ අවසන් කිරීමේ අදාළ ලිපි ගොනුවල නොතිබීම නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3 අනෙකුත් විගණන නිරීක්ෂණ

3.1 කාර්යසාධනය

(අ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්තයන්ට අනුව, 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ හෙක්ටයාරයක සම්මත වාර්ෂික නිමි තේ ඵලදාව කිලෝග්‍රෑම් 1482 ක් වුවද, සංස්ථාව විසින් පාලනය කරනු ලබන වතු 13 හි එම ඵලදාව කිලෝග්‍රෑම් 174 ත් 727ත් අතර ඉතා පහළ පරාසයක පැවතුණි.

(ආ) සංස්ථාව සතුව හෙක්ටයාර 4222 ක තේ වගාවක් පවතින නමුත් ඒ අතරින් හෙක්ටයාර 2883 ක් වර්ෂ 100 කට වඩා පැරණි තේ වගාවක් වන අතර හෙක්ටයාර 135 ක පමණක් නැවත තේ වගාව සඳහා යොමු වී තිබුණි.

(ඇ) සංස්ථාවේ වාර්ෂික කාර්යසාධන වාර්තා අනුව 2017 සිට 2018 වර්ෂය වන විට සංස්ථාව විසින් පාලනය කරනු ලබන වතු 13 න් වතු 11 ක තේ දළු නිෂ්පාදනය ඉහළ යන විට අලකොල්ල, ගල්පිල්ල, ගෝමර, හුන්නස්ගිරිය හා කැලැබොක්ක යන වතු පහේ දළු නිෂ්පාදනය පිළිවෙලින් සියයට 1 කින් හා සියයට 9 ක පරාසයකින් අඩු වී තිබුණු අතර 2018 - 2019 කාලයේදී සංස්ථාව සතු සියලුම වතුයායන්හි නිෂ්පාදනය සියයට 2 සිට සියයට 33 පරාසයකින් පහළ ගොස් තිබුණි. සමස්ත නිෂ්පාදනය කිලෝග්‍රෑම් 170,627 ක් එනම් සියයට 11.58 කින් පහළ ගොස් තිබුණි.

(ඈ) බාහිර වැවිලිකරුවන්ට ලබා තිබුණු හෙක්ටයාර් 1391 කින් නිෂ්පාදනය කර තිබුණු සමස්ත නිමි තේ නිෂ්පාදනය 2018 වර්ෂයේදී කිලෝග්‍රෑම් 102,507 වූ අතර එය 2019 වර්ෂයේදී කිලෝග්‍රෑම් 99,850 වූ අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර තිබුණු තේ කර්මාන්තයේ දත්තයන්ට අනුව උක්ත භූමි ප්‍රමාණයේ වාර්ෂික සම්මත නිමි තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 2,061,462 ක් වුවත් බාහිර වැවිලිකරුවන් විසින් නිෂ්පාදනය කර තිබුනේ සමස්ත ඵලදාවෙන් සියයට 5 ක ප්‍රමාණයක් වීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(ඉ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2018/2019 වර්ෂයට අදාළව නිකුත්කර තිබුණු දත්තයන්ට අනුව ශ්‍රී ලංකාවේ තේ කිලෝග්‍රෑම් එකක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය රු.484 ක් විය යුතු වුවත් සංස්ථාව පාලනය කරනු ලබන වතු 11 ක තේ කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය රු. 416 – 783 ක පරාසයක පැවතුණි. තවද අයවැය වාර්තාවන්ට අනුව තේ කිලෝග්‍රෑම් එකක ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය රු.461 වන අතර සත්‍ය නිෂ්පාදන පිරිවැය රු.605 ක්ව තිබුණි.

(ඊ) තේ අපනයන සංගමය විසින් 2019 වර්ෂයට අදාළව අන්තර්ජාලය වෙත නිකුත්කර තිබුණු දත්තයන්ට අනුව තේ කිලෝග්‍රෑම් එකක සම්මත සාමාන්‍ය විකුණුම් වටිනාකම රු.550 ක් විය යුතු වුවත් සංස්ථාවේ එම අගය රු.340 ත් රු.415 ත් අතර පහළ පරාසයක පැවතුණි.

(උ) සංස්ථාවේ වතුයායන් 13 කට අදාළව සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 11,132 ක් වුවද, ඉන් තේ සඳහා හෙක්ටයාර් 4,223 ක් සහ රබර් සඳහා හෙක්ටයාර් 2577 ක් යොදාගෙන තිබුණි. ඉතිරි

ඉඩම් හෙක්ටයාර් 4332 එනම් සියයට 39 ක් කිසිදු ආදායමක් ඉපයීමට දායක කර නොගෙන නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(උ) සංස්ථාවේ තේ නිෂ්පාදිත භූමි ප්‍රමාණය වන හෙක්ටයාර් 4233 ක් මඟින් වාර්ෂිකව නිෂ්පාදනය කළ යුතු සම්මත නිමි තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් 6,273,306 විය යුතු වුවත් සංස්ථාව විසින් නිෂ්පාදනය කර තිබුණු නිමි තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් 1,402,979 කි. එනම් සම්මත ඵලදාවෙන් සියයට 22 ක් තරම් ඉතා අසතුටුදායක ඵලදාවක් විය.

(එ) සමාලෝචිත වර්ෂය සඳහා එක් එක් වතුයායන් වෙත ලබා දී තිබුණු නිෂ්පාදන ඉලක්ක අතුරින් ගෝමර හා ගල්පිල්ල වතුයායන් හැර ඉතිරි සියලුම වතුයායන්වල කාර්යසාධනය සියයට 75 ට අඩු මට්ටමේ පැවතී තිබුණු අතර හෙයාර්පාර්ක් හා වෛයිතලාව යන වතුයායන් සියයට 45 ට වඩා අඩු කාර්යසාධනයක් පෙන්නුම් කොට තිබුණි. අනිකුත් වතුයායන් නවය සියයට 50 ත් සියයට 68 ත් අතර අඩු කාර්යසාධන මට්ටමක පැවතුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ පොහොර මිලදී ගැනීම සඳහා අයවැයෙන් රු.මිලියන 60 ක් වෙන්කර තිබුණු නමුත් සත්‍ය වශයෙන් රු.මිලි.3.56 ක් පමණක් වැය කර තිබුණි. එය අයවැයගත ප්‍රමාණයෙන් සියයට 6 ක් පමණක් විය.

(ඔ) 2013 වර්ෂයේ රු.852,397ක්ව පැවති ලාභය 2014 වර්ෂයේදී රු.3,177,798 ක අලාභයක් දක්වා පරිවර්තනය වී තිබුණු අතර 2019 වර්ෂයේදී එම අලාභය රු.7,817,916 ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ඕ) කර්මාන්තයේ සම්මතයන්ට අනුව වලහන්දුව වතුයායේ හෙක්ටයාර් 65 ක භූමි ප්‍රමාණයක පැවතිය යුතු සාමාන්‍ය රබර් පැළ සංඛ්‍යාව 32,500 ක් වුවත් පැවති රබර් පැළ සංඛ්‍යාව 18,634 කි. එය තිබිය යුතු ප්‍රමාණයෙන් සියයට 57 ක් වන අතර 2019 වර්ෂය තුළ හෙක්ටයාරයක සාමාන්‍ය රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 667ක් වුවත් වලහන්දුව වතුයායේ හෙක්ටයාරයක සාමාන්‍ය රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 432 ක එනම් සියයට 65 ක තරම් පහළ අගයක් ගෙන තිබුණි.

3.2 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙහි 2017 ජූලි 25 දිනැති, 2017 සැප්තැම්බර් 13 දිනැති, 2018 දෙසැම්බර් 21 දිනැති සහ 2019 ඔක්තෝම්බර් 09 දිනැති ලිපි ප්‍රකාරව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයෙහි 2019 දෙසැම්බර් 31 දින වන විට ස්ථීර තනතුරු 15ක ඌනතාවයක් ද , තනතුරු 2ක අනුමත තනතුරු ඉක්මවා පත්කිරීමක්ද, කොන්ත්‍රාත් තනතුරු 11ක අනුමත තනතුරු ඉක්මවා පත් කිරීමක්ද, තනතුරු 2ක ඌනතාවයක් ද සහ තාවකාලික තනතුරු 2ක ඌනතාවයක්ද තිබුණි. ඊට අමතරව කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය 03 ක් වුවද, කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු

09 ක් සඳහා ක් වුවද රු.2,736,095 ක් සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 5.2 වගන්තිය ප්‍රකාරව යම් තනතුරක පුරප්පාඩුවක් ඇති වූ වහාම එම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කළ යුතු වුවත්, 2008 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින කළමණාකරු නීති සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වැවිලි යන තනතුරු සඳහා ස්ථිර නිලධාරියෙකු පත් නොකොට කොන්ත්‍රාත් පදනම මත පත්කළ නිලධාරීන් සඳහා 2019 වර්ෂය සඳහා පිළිවෙළින් රු.350,373 ක සහ රු.377,735 ක වැටුප් ගෙවා තිබුණි.

(ඇ) 2018 ජූලි 18 දිනැති අංක 3/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II පරිච්ඡේදය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, ක්‍රියාකාරී අධ්‍යක්ෂක, උපදේශක, ලිපිකරු, කම්කරු වැනි තනතුරු 12ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත හා ස්ථිර පදනම මත නිලධාරීන් 12 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර, එම නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.4,321,049 ක වැටුප් ගෙවා තිබුණි.

(ඈ) අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියකින් තොරව ප්‍රධාන කාර්යාලයේ නව බඳවා ගැනීම් 07ක් සහ සේවය උසස් කිරීම් 02ක් සිදුකර තිබුණු අතර ඒ සඳහා රු.2,934,690 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඉ) 2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛනයේ 9.3.1 ඡේදය ප්‍රකාරව කිසියම් තනතුරකට බඳවා ගැනීම සඳහා තිබිය යුතු අධ්‍යාපන සහ අනෙකුත් සුදුසුකම් ඇතුළත් අනුමත බඳවා ගැනීම් හා උසස්කිරීමේ කාර්ය පරිපාටියක් සංස්ථාව සතුව නොතිබුණි.

(ඊ) ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 10.2 උපවගන්තිය ප්‍රකාරව වැටුප් වර්ධක ගෙවීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවේදී හැර අන් සෑම අවස්ථාවකම 10.1 උප වගන්තිය ප්‍රකාරව වැටුප් වර්ධක දිනට අදාළ වර්ෂයේ වැටුප් වර්ධකය උපයාගත යුතු බව දක්වා ඇත. නමුත් මීට පටහැනිව කළමණාකාරීත්වය විසින් කිසිදු ඇගයීමකින් තොරව 2017, 2018 සහ 2019 වර්ෂ වලදී වැටුප් වර්ධක 01කට වඩා වැඩි වැටුප් වර්ධක ප්‍රමාණයක් ලබාදී තිබුණු බව විගණනයේදී සිදුකළ නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් 2019 වර්ෂයේදී සංස්ථාව කාර්යමණ්ඩලයේ 27 දෙනෙකුට රු.1,253,223 ක වැටුප් වර්ධකයක් ගෙවා තිබුණි.

(උ) ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 3 උපවගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවයේ සියලුම පුරප්පාඩු සඳහා පත්කිරීම් බලධාරියා විසින් බඳවා ගැනීම් පරිපාටියට අනුකූලව ප්‍රසිද්ධ දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවීම් සිදුකළ යුතු වුවත් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේ සිදුකළ නව බඳවා ගැනීම් 23 ක් ප්‍රසිද්ධ දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවීම් වලින් පරිබාහිරව සිදුකර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.3 කළමණාකරණ ක්‍රියාකාරකම්

(අ) වතුයායන් 09 ක පර්චස් 782 ක් වූ භූමි ප්‍රමාණයක් හා නිල නිවාස 5 ක් වර්ෂ 50 කට ආසන්න කාලයක සිට අනවසර පදිංචිකරුවන් භුක්ති විඳින බව නිරීක්ෂණය විය.

(ආ) ඕපල්ගල වතුයායේ පර්චස් 39.07 ක් ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් පුද්ගලික සමාගම වෙත රජයේ තක්සේරුගත වටිනාකමට වඩා අඩුවෙන් ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.712,500 ක පාඩුවක් ද, උපබඳු පදනමට ලබා දීමෙන් ලැබිය යුතු රු.427,500 ක මුදලක්ද අහිමි වී තිබුණි.

(ඇ) 1996 වසරේ සිට ස්වාධීන රූපවාහිනිය වෙත ලබාදී ඇති හුන්නස්ගිරිය රාජ්‍ය වතුයායේ රූඩ්.02 පර්චස් 01ක භූමිය සහ ගම්මඩුව රාජ්‍ය වතුයායේ රූඩ්.02 පර්චස් 2.87 ක් සඳහා ගිවිසුම් ඇතිකරගෙන නොතිබුණි.

(ඇ) ගමන්වාරය අවසානයේදී ගමන්ගත් නිලධාරීන් වාහන ධාවන සටහන් අත්සන් තබා නොතිබුණු අතර දෛනික ධාවන සටහන තුළ දෛනිකව ඉන්ධන තුළනය කළ යුතු වුවත් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද වාහන 04 ට අදාළ ධාවන සටහන් තුළ ඉන්ධන තුළනයක් සිදු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

<u>ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ආයතනය ගත් ක්‍රියාමාර්ග</u>

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

(අ) 2019.12.31 දිනට වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සින්නක්කර ඉඩම් යටතේ දක්වා ඇති රු. 649,377,816.36 වටිනාකම සැකසී ඇති ආකාරය පහත දක්වා ඇත.

වතුයාය/ප්‍රධාන කාර්යාලය	විස්තරය	ගිණුම්වලට එක්කල වර්ෂය	වටිනාකම රු. ශ.
වලහන්දුව	ඉඩමේ වටිනාකම	2012	620,000,000.00
අලකොල	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	1,782,168.12
කොටගඟ	,,	1996	1,439,934.95
ගල්පිහිල්ල	,,	1996	1,247,732.90
ගෝමර	,,	1996	2,562,873.16
භාගල	,,	1996	2,291,138.59
හෙයාපාර්ක්	,,	1996	1,436,449.45
හුන්නස්ගිරිය	,,	1996	903,048.77
කැලැබොක්ක	,,	1996	6,621,281.82
මිඩ්ලන්ඩ්	,,	1996	3,062,644.36
ඕපල්ගල	,,	1996	1,772,601.24
රංගල	,,	1996	2,226,098.34
ප්‍රධාන කාර්යාලය	ඉඩමේ වටිනාකම	1996	4,031,845.00
මුළු වටිනාකම			<u>649,377,816.36</u>

ඉහත විස්තර අනුව වලහන්දුව වතුයාය 2012 වර්ෂයේදී රු. මි. 620 කට තක්සේරු කර ඇති අතර වසර ගණනාවක සිට ආයතනය මුහුණ දෙන මූල්‍ය අර්බුදය හේතුවෙන් අනෙකුත් ඉඩම් තක්සේරු කිරීමට නොහැකි වී ඇත. මෙම ඉඩම් තක්සේරු කිරීමට අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීම සඳහා අදාළ ලිපි වැවිලි අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර අදාළ මුදල් ලද වහාම මෙම කාර්ය ආරම්භ කරන බව දන්වනු කැමැත්තෙමු.

(ආ) අතීතයේ සිට වතු සඳහා මිලදී ගෙන ඇති පරිගණක, උපකරණ හා ගෘහ භාණ්ඩ එක් වටිනාකමක් ලෙස ගිණුම් ගත වී ඇති බැවින් මෙම ගැටලුව පැන නැගී ඇත. මෙම වත්කම් වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට අදාළ මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර ඒ අනුව 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එය නිවරදි කිරීමට කටයුතු කරන්නෙමු.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු ඉඩම් ප්‍රාදේශිය වැවිලි සමාගම් වෙත බදු දීමේදි සිදු කර ඇති තක්සේරු කිරීම් අනුව, එම සමාගම් වල ශේෂ පත්‍රවල අදාළ දේපල සම්බන්ධයෙන් වටිනාකම් දක්වා ඇති අතර, එම වටිනාකම් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන දේපල යටතේ දක්වා ඇත.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පැවරී ඇති ඉඩම් හා ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත බදුදෙන ලද ඉඩම් පිළිබඳ විස්තර 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඉ) කෘෂිකාර්මික කටයුතුවලට අදාළ ධාරක ජීව විද්‍යාත්මක වත්කම්වල අගය 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දේපල පිරියත හා උපකරණ යටතේ වෙනම අයිතමයක් ලෙස ඉදිරිපත් කරන බව දන්වනු කැමැත්තෙමු.

(ඊ) 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී තේ නැවත වගාවට අදාළව 2021 වර්ෂයේ දරන ලද වියදම් නොමේරූ තේ වගාව (Immature Plantation) යටතේ දක්වා ඇති අතර 2022 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී 2020 සහ 2020 ට පෙර වර්ෂයන්ට අදාළව තේ නැවත වගා කිරීම සඳහා දරා ඇති වියදම් අදාළ පරිදි වර්ග කර පෙන්වීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

(උ) 2022 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වන වගාව පාරිභෝගික ජීව විද්‍යාත්මක වත්කම් යටතේ පෙන්වීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

(ඌ) 2021.12.31 දින දක්වා ආයතනය විසින් ලබාගෙන ඇති බැංකු අයිරා සහ බැංකු ණය සඳහා ඇප තැබූ වත්කම් පිළිබඳ විස්තර 2021 මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර ඇත.

(එ) 2022 වර්ෂයට අදාළව ආයතනයේ සේවා ප්‍රතිලාභ ගණනය කිරීමේදී ආයු ගණන ක්‍රමය යොදා ගැනීමට කටයුතු කරන බව දන්වමු.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

2022 වර්ෂයේදී ආයතනය සතු පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු. එසේම 2019 වර්ෂය සඳහා පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් ගිණුම්ගත කර ඇති ක්ෂය වටිනාකම 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නැවත ගැලපීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) බදු කුලී ආදායම් ගිණුම්ගත කිරීමේදී සිදු වී ඇති අඩුපාඩු පිලිබඳ පරීක්ෂාකර බලා, ඒ අනුව ආයතනයේ සමුච්චිත ශුද්ධ අලාභයට සිදුවී ඇති බලපෑම ගණනය කර, අදාල ගැලපීම් 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදු කරන බව දන්වමු.

(ආ) වතුවල ඇති තේ, පොහොර හා රසායන ද්‍රව්‍ය වැනි සියලුම තොග භෞතිකව සත්‍යාපනය කර එම වටිනාකම් අනුව 2021 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

(ඇ) 2022 වර්ෂයේදී අසාර්ථක වී ඇති තේ පැළ තවාන් සම්බන්ධව පරීක්ෂාකර බලා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අදාළ ගිණුම් ගැලපීම් සිදුකිරීමට කටයුතු කරන බව දන්වමු.

(ඈ) 2020 හා 2021 වර්ෂවලට අදාළ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම ගිණුම්කරණ වරද නිවැරදි කර ඇත.

(ඉ) 2019 වර්ෂයේදී වතුවල කම්කරු වැටුප් ගෙවීමට අදාල සාමූහික ගිවිසුම් සංශෝධනය වීම නිසා වතු කම්කරුවන්ගේ මූලික වැටුප රු.500 සිට රු. 700 දක්වා වැඩිවූ හෙයින්, ඒ අනුව පෙර වර්ෂයන්ට අදාළ පාරිතෝෂික වෙන්කිරීම් සම්බන්ධයෙන් ගැලපීම් සිදුකරන ලදි. ඒ අනුව එම ගිණුම් ගත කිරීම් නිවැරදි බව දන්වා සිටිමු.

(ඊ) ආයතනය කාලයක සිට මුහුණ දෙන මූල්‍යමය ගැටළු හේතුවෙන් තේ විකුණුම් ආදායම් මත ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු මුදල් නිරවුල් කිරීමට නොහැකි වී ඇති බව දන්වනු කැමැත්තෙමු.

1.2.4 නොසැසඳුණු පාලන ගිණුම්

(අ) අන්තර් වතු පාලන ගිණුම්වල හර හා බැර ශේෂයන් හි ඇති මෙම වෙනස්කම් පරික්ෂාකර බලා අවශ්‍ය ගිණුම් ගැලපීම් 2022 වර්ෂය තුල දී සිදු කිරීමට කටයුතු කරන බව දන්වමු.

(ආ) ප්‍රධාන කාර්යාලයේ හා වතුයායන් අතර ජංගම ගිණුම්වල පවතින වෙනස්කම් පරික්ෂාකර බලා අවශ්‍ය ගිණුම් ගැලපීම් 2022 වර්ෂය තුල දී සිදු කිරීමට කටයුතු කරන බව දන්වමු.

1.2.5 පැහැදිලි නොකල වෙනස්කම්

(අ) 2021.12.31 දිනට ලෙජර් ශේෂ අනුව එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කර ඇති අතර ඊට ගැලපෙන පරිදි ස්ථාවර වත්කම් උපලේඛනද පිළියෙල කර ඇති බව දන්වමු.

(ආ) මෙම ගිණුම්කරණ වරද 2021 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි නිවැරදි කර ඇත.

(ඇ) මෙම ගිණුම්කරණ වරද 2021 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි නිවැරදි කර ඇත.

(ඈ) මෙම ගිණුම්කරණ වරද 2021 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි නිවැරදි කර ඇත.

(ඉ) සංස්ථාවේ පාරිතෝෂික වෙන්කිරීම් සහ ගෙවිය යුතු පාරිතෝෂික ගණනය කිරීම් සම්බන්ධයෙන් සිදුවී ඇති වරද 2021 මුල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේදි නිවැරදි කර ඇති බව දන්වමු .

(ඊ) පාරිතෝෂිත ගෙවීම් සම්බන්ධයෙන් 2019 මුල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මුදල නිවැරදි වන අතර උපලේඛනවල පැවති මෙවැනි අඩුපාඩු සැලකිය යුතු ප්‍රමාණයක් 2021 වර්ෂයේදී නිවැරදිකර ඇත.

1.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) අය නොවන ණයගැතියන් සම්බන්ධව විස්තර සොයා ගැනීම සඳහා මේ වන විට නිළධාරි කමිටුවක් පත්කර ඇති අතර එම විස්තර ලද පසු එම මුදල් අයකර ගැනීම හෝ පොත්වලින් කපා හැරීම සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා තවත් කමිටුවක් පත්කිරීමට තීරණය වී ඇත. එම කමිටු නිර්දේශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි කටයුතු කරන බව දන්වමු.

(ආ) 2014.10.15 දින වන විට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා සී/ස ඇල්කඩුව වැවිලි සමාගම යන ආයතන දෙකම එක් සභාපතිවරයෙක් යටතේ පැවති අතර, ඒ වන විට සී/ස ඇල්කඩුව වැවිලි සමාගමේ ඇතිවූ මූල්‍යමය අර්බුදය හේතුවෙන් සභාපතිගේ අනුමැතිය මත රු.මි. 6 ක් ඇල්කඩුව වැවිලි සමාගම වෙත ගෙවන ලදි. එම මුදලින් රු.මි. 4.5 ක් එම වසර තුලදීම පියවන ලද අතර, ඉතිරි රු.මි. 1.5 ක මුදල මේ දක්වා ගෙවා නොමැත. එසේම, 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ රියදුරු මහතෙකු සී/ස ඇල්කඩුව වැවිලි සමාගම වෙත අනුයුක්ත කරන

ලද අතර ඒ වෙනුවෙන් සී/ස ඇල්කඩුව වැවිලි සමාගම වෙතින් ලබිය යුතු මුදල රු. 416,092.00 කි. ඒ අනුව සී/ස ඇල්කඩුව වැවිලි සමාගම වෙතින් ලැබිය යුතු මුළු මුදල රු. 1,916,092.00 වන අතර එම මුදල අයකර ගැනීම සඳහා සහාය වන ලෙස රේඛිය අමාත්‍යාංශය වෙතින්ද ඉල්ලීමක් කර ඇත.

(ඇ) අංක SLSPC/PL/TB/T-88/2010 සහ අංක SLSPC/PL/TB/T-88/2011 යන ගස් විකිණීමට අදාළ ටෙන්ඩර් සඳහා ලබාගත් මුදල් (ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල්) නැවත ගෙවීමක් සිදු නොකරන ලද්දේ එම ගනුදෙනුකරුවන් සහ සංස්ථාව අතර ඇතිවූ යම් ගැටලුකාරී තත්ත්වයක් හේතුවෙනි. මෙම ගැටලුව විසඳුණු පසු අදාල ගෙවීම් කටයුතු කිරීමට හෝ එම මුදල් සංස්ථාවේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වමු.

1.2.7. විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

(අ) ආයතනය සතු සියලුම ඉඩම්, ගොඩනැගිලි හා වාහනවල අයිතිය තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන සහිත ගොණු මේ වන විට සකස් කරමින් පවතින බව දන්වමු.

(ආ) වන කළමනාකරණ සැලැස්ම සකස් කිරීම සඳහා දරන ලද වියදමක් වැරදීමකින් දේපල පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇති අතර මෙම වරද 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වමු.

(ඇ) මෙම වරද මුද්‍රණ දෝෂයක් හේතුවෙන් සිදු වූවකි. ස්ථාවර වත්කම් වලට අදාළ ලෙජර් ශේෂයන් සහ එම වත්කම් වලට අදාළ උපලේඛන වල ඇති ශේෂයන් අතර, පවතින වෙනස්කම් පිළිබඳ පරීක්ෂාකර 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරන බව දන්වමු.

(ඈ) ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් හා ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම් සැකසී ඇති ආකාරය පරීක්ෂාකර බලා එම වත්කම් භෞතිකව හඳුනාගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට සැලසුම් කර ඇති බව දන්වමු.

(ඉ) 2019.12.31 දිනට පැවැති ණයගැතියන් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් එවන ලෙස සියලුම ණයගැතියන් වෙත දන්වා යැවූ අතර ඒ සඳහා පිලිතුරු නොලද හෙයින් ආයතනයේ ලෙජර් ශේෂ නිවැරදි යැයි සලකා මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කරන ලදි.

(ඊ) වාර්තාවේ සඳහන් රු. 86,511,769.00 ක ණය හිමි ශේෂය සැකසී ඇති ආකාරය පහත පරිදි වේ.

	Rs.
අත්තිකාරම් - ඕපල්ගල	4,480,000.00
පොලි කෙමික්ස්	715,389.00
තැරැව්කරුවන්- LCBL/CTB	16,030,780.00
දළු මිලට ගන්නන්ගෙන් ලැබුනු අත්තිකාරම්	11,576,571.00
රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029.00
ලංකා බණිජ වැලි ආයතනය -ණය	25,000,000.00
එකතුව	**86,511,769.00**

වාර්තාවේ සඳහන් ණයහිමි ශේෂයන් තුල ඇතුලත් තේ තැරැව්කරුවන්ගෙන් ලබා ගත් ණය / අත්තිකාරම් රු. 16,030,780.00 තේ දලු මිලදී ගන්නන්ගෙන් ලබා ගෙන ඇති අත්තිකාරම් රු.11,756,571.00 හා ලංකා බණිජ වැලි ආයතනයෙන් ලබා ගත් ණය ඇතුලත් වන ණය ශේෂයන් සම්බන්ධයෙන් අදාල පැහැදිලි කිරීම් පහත දක්වා ඇත.

තේ තැරැව්කරුවන් විසින් ලබා ගත් ණය හා අත්තිකාරම් රු. 16,030,780.00

තේ තැරැව්කරුවන් වෙත ගෙවිය යුතුව තිබූ රු. 16,030,780.00 ක මුදල සැකසී ඇති ආකාරය පහත දැක්වේ.

	Rs.
සිලෝන් ටී බ්‍රෝකර්ස් සමාගම	62,731.11
මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස් සමාගම.	3,361,735.93
ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස් ටී බ්‍රෝකර්ස් සමාගම	6,183,715.99
ලංකා කොමොඩිටි බ්‍රෝකර්ස් සමාගම.	6,422,595.79
එකතුව	**16,030,779.82**

ඉහත සඳහන් තේ තැරැව්කරුවන් සමඟ දැනටමත් ගණුදෙනු සිදුවන අතර 2019.12.31 දිනට පැවැති ඉහත ශේෂයන් 2020 වර්ෂය තුල නිරවුල් වී ඇත. ඉහත තේ තැරැව්කරුවන්ට අදාළ සංස්ථාවේ ලෙජර් ගිණුම් පිටපත් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 01, 02 03 හා 04)

තේ දළු මිලදී ගන්නන්ගෙන් ලබා ගෙන ඇති අත්තිකාරම් රු. 11,756,571.00

අමු දළු ගැණුම්කරුවන් වෙතින් ලබා ගෙන තිබූ රු. 11,576,571.00 ක මුදල සැකසී ඇති ආකාරය පහත දක්වා ඇත.

	Rs
ඇබෝස්ට්ලි වත්ත	2,823,996.00
කැරොලිනා වත්ත	1,086,015.40
ගැටගහවෙල තේ කම්හල	337,883.00
ස්ට්‍රැතඩන් වත්ත	4,264,036.20
වෝල්ටර්ස් බේ තේ කම්හල	3,244,640.67
එකතුව	**11,756,671.27**

ඉහත වගුවේ සඳහන් ගැටගහවෙල තේ කම්හල යටතේ සඳහන් රු.337,883.00 ක ශේෂය 2016 වර්ෂයේ සිට ඉදිරියට රැගෙන ආ මුදලක් වන අතර එය මේ දක්වා නිරවුල් වී නොමැත. එසේම වෝල්ටර්ස් බේ තේ කම්හල යටතේ දක්වා ඇති රු. 3,244,640.67 ක ශේෂය 2015 වර්ෂයේ සිට ඉදිරියට රැගෙන ආ ශේෂයක් වන අතර එය මේ දක්වා නිරවුල් වී නොමැත. ඉහත වගුවේ ඇති අනෙකුත් ශේෂයන් 2020 වර්ෂය තුල නිරවුල් වී ඇත.

ලංකා බණිජ වැලි ආයතනය වෙතින් ලබා ගෙන ඇති රු. මි.25 කට අදාල ණය මුදල වෙනුවෙන්, 2019.12.31 දිනට ශේෂ තහවුරු කිරීමේ ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 10)

ඉතිරි සියලු ණය හිමි ශේෂයන් 2016 වර්ෂය හා ඊට පෙර සිට ඉදිරියට ගෙන ආ ශේෂයන් වේ. එම ශේෂ මේ දක්වා නිරවුල් කර නොමැත. සියලු ණය හිමියන් හා ණය ගැතියන් වෙතින් ශේෂ සනාථ කිරීම් ලබා ගැනීම සඳහා ලිපි යවා ඇතත් ඒ සඳහා පිලිතුරු නොලැබීම හේතුවෙන්, ආයතනයේ ලෙජර් ශේෂයන් නිවැරදි යැයි සලකා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. 2021 මූල්ය ප්‍රකාශන වල ඇතුලත් ණයගැති හා ණය හිමි ශේෂයන්ට අදාළ පසු ශේෂ නිරවුල් කිරීම් පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි මේ වන විට සකස් කරමින් පවතින බව දන්වමු.

(උ) මෙම ශේෂයන් 2012 වර්ෂයට පෙර සිට ඉදිරියට රැගෙන ආ ඒවා බැවින් එම වටිනාකම් සැකසී ඇති ආකාරය පිළිබඳව පරීක්ෂාකර බලා 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල හෙළිදරව් කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වමු.

(ඌ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් තුළ ඇතුලත් රු. 1,933,043.00 ක අක්‍රීය ගිණුම් ශේෂය 2012 වර්ෂයට පෙර සිට ඉදිරියට රැගෙන ආ ශේෂයක් බැවින් මේ පිළිබඳව පරීක්ෂා අදාළ ගිණුම් ගැලපීම් 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදුකරන බව දන්වමු.

(එ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ආපසු ගෙවිය යුතු රු. 6,379,370.00 ක ටෙන්ඩර් තැන්පතු මුදල 2006 වර්ෂයටත් පෙර සිට ඉදිරියට රැගෙන ආ ශේෂයකි. මෙම මුදල් කුමන ටෙන්ඩරයක් සඳහා කවුරුන් විසින් කෙදිනක තැන්පත් කරන ලද්දක්ද යන්න විස්තර ආයතනය සතුව නොමැත. දැනට මෙම ශේෂයන් පොත්වලින් ලියා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2021/01/25 දින යොමු කර ඇති අතර 2021 දෙසැම්බර් මස පැවති විගණන කමිටු රැස්වීමේදී මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට කමිටුවක් පත් කරන ලෙස උපදෙස් ලබා දුන් හෙයින්, ඒ අනුව කටයුතු කිරීමට නියමිතය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1.1 2019 වර්ෂය සඳහා ආයතනය විසින් නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් ඇත.

2.2.2. නීතිරීති/ විධානයට යොමුව

(අ) ආයතනය සතු සියලු වාහන හදුනා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇති අතර එම වාර්තා අනුව යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ සාමාජිකත්වය දරන කමිටුවක් විසින් අපහරණය කලයුතු වාහන හදුනාගැනීම හා තක්සේරු කිරීම සිදුකිරීමට නියමිතය. එම කටයුතු අවසන් වීමෙන් පසු අදාළ චක්‍රලේඛ උපදෙස් අනුව වාහන අපහරණ කටයුතු සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

(ආ) සංස්ථාව සතු කර්මාන්තශාලාවල භාවිතයට නොගන්නා යන්ත්‍රෝපකරණ හදුනා ගැනීම 2022 වර්ෂය තුල ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව දන්වා සිටින්නෙමු.

(ඇ,ඈ,ඉ,ඊ,උ)

ආයතනය බොහෝ කලක සිට මුහුණ දෙන මූල්‍ය අර්බුදය හේතුවෙන් ආයතනය විසින් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව තිබූ බදු පිළිබඳව අවධානයක් යොමු වී නොමැත. එබැවින් මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඒ සම්බන්ධව ලැබෙන උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

(ඌ) ආයතනය අතීතයේ සිට ක්‍රියාත්මක වූ ව්‍යාපාරික කටයුතු ඒ ආකාරයෙන්ම මේ වනවිටත් ක්‍රියාත්මක වන අතර එම කාර්යයන්ද සැලකිල්ලට ගෙන 2022 වර්ෂය සඳහා ව්‍යාපාරික සැලැස්මක් සකස් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. එම කටයුතු මේ වසරේ මැයි 31 දිනට පෙර අවසන් කිරීමට අපේක්ෂා කරන අතර ඉන්පසුව එම ව්‍යාපාරික සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉන් පිටපතක් විගණකාධිපති වෙතද එවීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඒ)

(i) ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් අංශය වන වැවිලි අංශය සඳහා සෑම වසරක් වෙනුවෙන්ම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනිමද සිදු කෙරේ. ඒ අනුව, 2022 වර්ෂය සඳහා වැවිලි අංශය වෙනුවෙන් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම 2021 දෙසැම්බර් මස පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇත. ආයතනයේ සියලුම අංශ ආවරණය වන පරිදි 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර එම කාර්යන් මැයි 31 දිනට පෙර නිම කිරීමට අපේක්ෂා කෙරේ. ඉන්පසුව එම ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනිමෙන් පසුව, ඉන් පිටපතක් විගණකාධිපති වෙතද එවිමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ii) ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් අංශය වන වැවිලි අංශය සඳහා පමණක් ප්‍රගති වාර්තා පිළියෙල කර ඇත. ආයතනයේ සියලු කාර්යයන් ආවරණය වන පරිදි 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරිමෙන් පසුව, එම ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් එක් එක් කාර්යයන් ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය පිළිබඳ වාර්තා සකස් කිරිමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(iii). 2021 හා 2022 වර්ෂයන්ට අදාළ අයවැය ලේඛන සකස්කර නියමිත පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇත.

(iv). 2020 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති අතර, 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2022.02.25 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කර ඇත.

(ඒ) 2019 වර්ෂයට අදාළ අතුරු අග්‍රීම පියවීමේදී ප්‍රමාදයන් සිදුව ඇත. එසේ වුවද 2022 වර්ෂය ආරම්භයේ සිට එවැනි ප්‍රමාදයන් අවම කර ගැනිමට හැකි වී ඇත.

(ඔ) ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් පුද්ගලික සමාගම වෙත ඕපල්ගල වතුයායෙන් රූඩ් 01 පර්.39.07 ප්‍රමාණයක් 2000.01.01 දින සිට වසර 30 ක කාලයක් සඳහා බදු දී ඇත. එම සමාගම සමග අත්සන් කර ඇති බදු ගිවිසුම අනුව මූලික වාර්ෂික බදු මුදල රු.240,000.00 ක් වන අතර මාර්ග නඩත්තුව සඳහා වාර්ෂිකව අය කරන මුදල රු.72,000.00 කි. 1995 ජූලි 25 දින ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද අංක එස්ඒඅයි/ඒ/01/34 දරන රජයේ ඉඩම් පැවරීම පිළාබඳව මාර්ගෝපදේශ හා බදු ගිවිසුමේ සඳහන් කොන්දේසි අනුව වසර 5 කට වරක් එම මුදල් ප්‍රමාණයන් 50% කින් වැඩි කල යුතු අතර, ඒ අනුව එක් එක් කාලපරිච්ඡේද සඳහා අයකර ඇති මුදල් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

කාලපරිච්ඡේදය	වාර්ෂික බදු කුළිය රු. ශ.	මාර්ග නඩත්තුව සඳහා අය කරන මුදල රු. ශ.
2000.01.01-2004.12.31	240,000.00	72,000.00
2005.01.01-2009.12.31	360,000.00	108,000.00
2010.01.01-2014.12.31	540,000.00	162,000.00
2015.01.01-2019.12.31	810,000.00	243,000.00
2020.01.01-2024.12.31	1,215,000.00	364,500.00

සටහන : 2022 වර්ෂයට අදාළ මුදල් මේ වන විට ලබා ගෙන ඇත.

සංස්ථාවට අයත් ගම්මඩුව වතුයායෙන් රූඩ්.2 පර්.2.87 ක් හා හුන්නස්ගිරිය වතුයායෙන් රූඩ්.2 පර්.2.01 ක් ස්වාධීන රූපවාහිනී ආයතනය වෙත 1996 වර්ෂයේදී බදු දී ඇති අතර මේ සම්බන්ධයෙන් බදු ගිවිසුමක් අත්සන් කර නොමැත. එම ආයතනය බදු ගිවිසුමක් අත්සන් කර ගැනීම සඳහා එකඟ කර ගැනීම වෙනුවෙන් එම ආයතනය වෙත 2020.12.23 හා 2021.10.22 දිනැතිව ලිපි යවා ඇති අතර ඒ සම්බන්ධයෙන් මේ දක්වා යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. එබැවින් වැවිලි අමාත්‍යාංශයේ සහාය ඇතිව මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට අපේක්ෂා කරන බව දන්වා සිටින්නෙමු. ස්වාධීන රූපවාහිනී ආයතනයට යවන ලද ලිපි වල පිටපත් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 18 හා 19)

(ඕ) ආයතනයේ MM කාණ්ඩයට අයත් සියලු නිලධාරින්ගේ ප්‍රවාහන දීමනා හා ඉන්ධන දීමනා මේ වන විට නතර කර ඇත.

(ක) කෙටුම්පත් වාර්තාවේ සඳහන් පරිදි ආයතනයේ සභාපති විසින් ලබා ගෙන ඇති අතිරේක ඉන්ධන සඳහා අදාළ අනුමැතීන් ලබා ගෙන නොමැත.

(ග) (ජ)

ආයතනය බොහෝ කලක සිට මුහුණ දෙන මූල්‍ය අර්බුදය හේතුවෙන් සේවක අර්ථසාධක දායක මුදල්, සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ දායක මුදල් සහ සේවක පාරිතෝෂික මුදල් නියමිත පරිදි ගෙවීමට නොහැකිවීමෙන් මෙම අධිභාර මුදල් ගෙවීමට සිදුව ඇත. මෙම හිඟ මුදල් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබීමෙන් පසුව අදාල ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

2.2.3 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමට අදාළ 1958 අංක 4 දරන පනතේ සඳහන් සංස්ථාවේ බලතල හා කර්තව්‍යයන්ට අනුකූල වන පරිදි ආයතනයේ කටයුතු පවත්වාගෙන ගොස් ඇති බව දන්වා සිටින්නෙමු.

2.2.4

(අ) ආයතනය වසර ගණනක සිට මුහුණ දී තිබෙන මූල්‍ය අර්බුදය හේතුවෙන් ඉදිරි වසර 03 ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට අපහසු වී ඇත.

(ආ) 2019 වර්ෂයේදී එවකට සිටි සභාපති වෙනුවෙන් වාහනයක් කුළියට ගැනීමේදි මිල ගණන් කැඳවීමක් සිදු කර ඇති අතර, ඒ අනුව ප්‍රසම්පාදන කමිටු තීරණ මත අදාළ සැපයුම්කරු තෝරා ගෙන ඇත. එසේ වුවද අදාළ ප්‍රසම්පාදන ලිපිගොණුව නිසි අයුරින් පවත්වාගෙන ගොස් නොතිබුන බව පිළිගන්නෙමු.

(ඇ) 2019 වර්ෂයේ වතුයායන් සඳහා වල්නාශක රසායන පොහොර (Hexaconzole) ලීටර් 120 ක් මිලදී ගැනීම සඳහා ආයතන 03 කින් මිල කැඳවූ අතර හේලීස් ආයතනය පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.අනෙක් ආයතන දෙක ඔවුන් සතුව තොග නොමැති බව දන්වා ඇත. හේලීස් ආයතනය වෙතින් ලබා දී තිබූ මිල රු.207,000.00 වන අතර එම මිල ගණන් සාමාන්‍ය වෙළඳපල මිල ගණන් සමග සැසඳීමෙන් පසුව සැපයුම්කරු තෝරාගෙන ඇති අතර එසේ වුවද ඒ පිළිබඳ විස්තර ගොණුවල සටහන් නොකිරීම අඩුපාඩුවක් බව පිළිගන්නෙමු.

(ඈ) මෙම සිදුවීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන් වෙතින් නිදහසට කරුණු විමසීමක් සිදු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් එම නිලධාරීන් විසින් දෙනු ලබන පිලිතුරු අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටින්නෙමු.

(ඉ) 2019 වර්ෂයේ සංස්ථාවේ ස්ථාවර වත්කම් තක්සේරු කිරීමට අදාල මූලික ප්‍රසම්පාදන කටයුතුවලදී අඩුපාඩුවක් සිදු වී ඇති බව පිළිගන්නෙමු. එසේ වුවද අරමුදල් සම්පාදනය කර ගැනීමේ ගැටලුවක් නිසා මෙම කාර්යය අතරමඟ අත්හිටුවන ලදී.

(ඊ) 2019 වර්ෂයේ කළුතර දිස්ත්‍රික්කයේ නිව්වැටිල් වතුයායේ අක්කර 83 ක මැනුම් කටයුතු සිදු කිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතුවලදී අඩුපාඩු සිදු වී ඇති බව පිළිගන්නෙමු. මින් ඉදිරියට එසේ සිදු නොවීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

(උ) 2019 වර්ෂයේ ගෝමර වතුයායේ ජල සැපයුම් පද්ධතිය නවීකරණය කිරීම සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු වලදී අඩුපාඩු සිදු වී ඇති බව පිළිගන්නෙමු. මින් ඉදිරියට එසේ නොවීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

3 අනෙකුත් විගණන නිරීක්ෂණ

3.1 කාර්යසාධනය

(අ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්තයන්ට අනුව 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ හෙක්ටයාරයක සම්මත නිමි තේ ඵලදාව කි.ග්‍රෑ.1,595 බව කෙටුම්පත් වාර්තාවේ දක්වා තිබුණද, එම අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛන අනුව 2019 වර්ෂයට අදාළව හෙක්ටයාරයක සම්මත නිමි තේ ඵලදාව කි.ග්‍රෑ 1,481.8 ක් බව දන්වා සිටින්නෙමු. එසේ වුවද 2019 වර්ෂයේ සංස්ථාවට අයත් වතුවල නිමි තේ ඵලදාව කි.ග්‍රෑ. 174-727 ත් අතර පරාසයක පැවති බව පිළඟන්නෙමු.

(ආ) කෙටුම්පත් වාර්තාවේ වර්ෂ 100 කට වඩා පැරණි තේ වගාව හෙක්ටයාර 4,086 ක් ලෙස දක්වා තිබුණද ආයතනයේ ලිපිගොණු අනුව එම ප්‍රමාණය හෙක්ටයාර 2,883.31 ක් බව දන්වා සිටින්නෙමු.

ආයතනය මුහුණ දෙන මුල්‍ය අර්බුදය හේතුවෙන් පැරණි තේ වගාව ඉවත් කර නැවත වගාවන් ආරම්භ කිරීමට නොහැකි වී ඇත. කෙසේ වුවත් 2022 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයේ අරමුදල් යටතේ හෙක්ටයාර 180 ක තේ නැවත වගාවන් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව දන්වමු.

(ඇ) 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී අලකොල, ගල්පිහිල්ල, ගෝමර, හුන්නස්ගිරිය හා කැලෑබොක්ක යන වතුවල තේ දළු නිෂ්පාදනය අඩුවීමක් සිදුවී ඇති බව පිළිගන්නෙමු.

එසේ වුවද 2018, වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී සංස්ථාවේ සමස්ත නිමි තේ නිෂ්පාදනය 11% කින්ද, 2021 වර්ෂයේදී 14% කින්ද ඉහළ ගොස් ඇති අතර ඒ පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

වර්ෂය	2018	2019	2020	2021
තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ)	1,576,432.00	1,402,979.00	1,742,360.00	1,803,226.00

(ඈ) 2019 වර්ෂය අවසන් වනවිට බාහිර වැවිලිකරුවන්හට ලබා දී තිබූ තේ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 1391 කි. 2018 වර්ෂයේ බාහිර වැවිලිකරුවන්ගේ තේ දළු වලට අදල නිමි තේ නිෂ්පාදනය කි.ග්‍රෑ. 102,507 ක් වන අතර 2019 වර්ෂයේදී එම ප්‍රමාණය කි.ග්‍රෑ. 99,850 බව පිළිගන්නෙමු.

බාහිර වැවිලිකරුවන් වෙත ලබා දී ඇත්තේ අඩු ඵලදාවක් සහිත තේ ඉඩම් වීම හේතුවෙන් සම්මත නිමි තේ ඵලදාව ලබා ගැනීමට නොහැකි වී ඇත. (වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ සංඛ්‍යා ලේඛන අනුව හෙක්ටයරක නිමි තේ ඵලදාව 1,481.8 කි.) එසේ වුවද බාහිර වැවිලිකරුවන්ගේ නිමි තේ නිෂ්පාදනය 2018 වර්ෂයට සාපේක්ෂව, 2020 වර්ෂයේදී 54% කින්ද, 2021 වර්ෂයේදී 66% කින්ද ඉහළ ගොස් ඇති අතර ඒ පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

වර්ෂය	2018	2019	2020	2021
තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ)	102,507.00	99,850.00	157,987.00	170,645.00

(ඉ) කෙටුම්පත් වාර්තාවේ සඳහන් දත්තයන් නිවැරදි බව පිළිගන්නෙමු.

(ඊ) කෙටුම්පත් වාර්තාවේ සඳහන් දත්තයන් නිවැරදි බව පිළිගන්නෙමු.

(උ) සංස්ථාවේ වතුයායන් 13 කට අදාල සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙක්ටයාර 11,132 කි. එයින් හෙක්ටයාර් 4,223 ක තේ වගාව පවතින අතර රබර් හා අනිකුත් වගාවන් සඳහා වෙන්වී ඇති ප්‍රමාණය හෙක්ටයාර් 2,577 කි.

ඉතිරි ප්‍රමාණය වන හෙක්ටයාර් 4,332 ක භූමි ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් පිහිටා ඇත්තේ නකල්ස් රක්ෂිත කලාපයේ වන අතර, ඉතිරි භූමි ප්‍රමාණය මාර්ග, ගොඩනැගිලි හා ගල් පර්වත සහිත භූමියකි.

(ඌ) සංස්ථාවේ තේ වගාව සඳහා වෙන් වී ඇති භූමි ප්‍රමාණය හෙක්ටයාර් 4,223 ක් වන අතර වැවිලි අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛන අනුව 2019 වර්ෂයට අදාල සම්මත නිමි තේ එලදාව හෙක්ටයාරයකට කි.ග්‍රෑ.1,481.8 කි. ඒ අනුව 2019 වර්ෂයට අදාල සම්මත නිමි තේ නිෂ්පාදනය කි.ග්‍රෑ 6,257,641 ක් වන අතර සංස්ථාවේ සත්‍ය නිෂ්පාදනය කි.ග්‍රෑ. 1,402,979 කි. එම ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස ගත්විට සම්මත නිෂ්පාදනයෙන් 22.42% කි.

2020 සහ 2021 වර්ෂවලට අදාල තේ ඉඩම් භූමි ප්‍රමාණයන් පිළිවෙලින් හෙක්ටයාර් 4,189ක් හා 4,199 කි. වැවිලි අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛනවලට අනුව 2019 වර්ෂයට අදාල සම්මත නිමි තේ එලදාව කි.ග්‍රෑ. 1481.8 ක් වන අතර, ඒ අනුව 2020 හා 2021 වර්ෂවලට අදාල සංස්ථාවේ සම්මත නිමි තේ නිෂ්පාදනය පිළිවෙලින් කි.ග්‍රෑ 6,207,260 ක් හා 6,222,078 කි. සංස්ථාවේ 2020 හා 2021 වර්ෂවලට අදාළ නිමි තේ නිෂ්පාදනය පිළිවෙලින් කි.ග්‍රෑ. 1,742,360 ක් හා කි.ග්‍රෑ 1,803,226 වන අතර, ඒ අනුව 2020 හා 2021 වර්ෂවලදී සංස්ථා සමස්ථ නිමි තේ නිෂ්පාදනය, සම්මත නිමි තේ නිෂ්පාදනයෙන් ප්‍රතිශතයක් ලෙස 28.07% හා 28.98% ක් දක්වා ඉහළ නංවා ගැනිමට හැකි වී ඇත.

(එ) කෙටුම්පත් වාර්තාවේ සඳහන් දත්තයන් නිවැරදි බව පිළිගන්නෙමු.

(ඒ) 2019 වර්ෂය සඳහා අපේක්ෂිත පරිදි ආදායම් නොලැබීම හේතුවෙන් පොහොර මිලදී ගැනීම් ප්‍රමාණවත් පරිදි සිදුකිරීමට නොහැකි විය.

(ඔ) බොහෝ කලක සිට ආයතනයේ ආදායම් ප්‍රමාණවත් පරිදි නොලැබීම නිසා මෙවැනි තත්ත්වයක් පැන නැගී ඇත.

(ඕ) ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ දත්ත අනුව හෙක්ටයාරයකට සම්මත රබර් පැල සංඛ්‍යාව 516 ක් වන අතර අසාර්ථක වන පැල සංඛ්‍යාවද සැලකිල්ලට ගත්විට හෙක්ටයාරයකට පවතින රබර් ගස් ගණන 300-500 අතර ප්‍රමාණයක් වේ. කෙසේ වෙතත් සංස්ථාව මුහුණ දී ඇති මුල්‍ය අර්බුදය හේතුවෙන් රබර් වගාවේ නඩත්තු කටයුතු නිසිපරිදි සිදුකිරීමට නොහැකි වී ඇති අතර එම නිසා රබර් නිෂ්පාදනය පහල ගොස් ඇත.

3.2 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) සංස්ථාවේ සමස්ත අනුමත කාර්ය මණ්ඩලය තුල, එක් එක් තනතුරු කාණ්ඩය යටතේ අනුමත වී ඇති තනතුරු සංඛ්‍යාව (ස්ථිර හෝ කොන්ත්‍රාත්) නොඉක්මවන පරිදි කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කර ඇත. කිසියම් තනතුරක් වෙනුවෙන් ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමකින් තොරව එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවා ගැනිමෙන් අවශ්‍ය විටක අදාල නිලධාරියාගේ කොන්ත්‍රාත් සේවා කාලය අවසන් කිරිමට හැකි වීම නිස එය ආයතනයට වඩා වාසිදායක වේ. ඒ අනුව, ආයතනය මුහුණ දෙන මුල්‍ය අර්බුදය හේතුවෙන් සීමිත කාර්ය මණ්ඩලයක් මගින් සංස්ථාවේ කටයුතු පවත්වාගෙන යාමට සිදුව ඇති බව දන්වා සිටින්නෙමු.

(ආ) කළමනාකරු - නීති යන තනතුර සඳහා 2022.01.03 දින ස්ථිර පදනම යටතේ නිලධාරිනියක බඳවා ගන්නා ලද අතර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වැවිලි යන තනතුරු සඳහා 2021.01.06 දින එවකට ගල්පිහිල්ල වතුයායේ වතු අධිකාරි වශයෙන් සිටි නිලධාරියා නියමිත පටිපාටි අනුගමනය කරමින් පත් කර ඇත.

(ඇ) 2019 වර්ෂයේදී ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස පත් කිරීමක් සිදු කර ඇත්තේ එවකට සිටි විෂය භාර අමාත්‍යවරයා විසිනි. අනෙකුත් බඳවා ගැනීම් සිදුකර ඇත්තේ සේවයේ අවශ්‍යතාව පරිදි වන අතර එම බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොමැත.

(ඈ) කෙටුම්පත් විගණන වාර්තාවේ සඳහන් පරිදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සිදු කර ඇති පත්වීම් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

i ආර්.කේ.එච් අයි කලුදරගේ මහතා - කළමනාකරණ සහකාර

අදාළ පත් කිරීම සිදු කර ඇත්තේ කොන්ත්‍රාත් පදනම මත වන අතර අදාළ නිලධාරියා දින 03 ක් සේවය කිරීමෙන් පසු සේවයෙන් ඉල්ලා අස් වී ඇත. එම නිලධාරියා සඳහා වැටුප් ගෙවීමක් සිදු කර නැත.

ii එස්.රාජරත්නම් මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ

අදාළ පත්කිරීම සිදු කර ඇත්තේ එවකට සිටි විෂය භාර අමාත්‍යවරයා විසින් වන අතර මේ වන විට එම නිලධාරියා සේවයේ නොමැත.

iii එස්.එස් අනුරාධනායක මිය - නීති නිලධාරිනී

අදාළ නිලධාරියා මේ වන විට සේවයේ නොමැත.

iv විරාත් යෝගේෂ්වරන් මහතා - පුද්ගලික රියදුරු

ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාගේ රියදුරු ලෙස තාවකාලික පදනම මත මෙම පත් කිරීම සිදු කර ඇති අතර මේ වන විට එම රියදුරු මහතා සේවයේ නොමැත.

v ආර්.ජී.එන් සම්පත් මහතා- කම්කරු
vi ආර්. ලෝගනාදන් මහතා - කම්කරු

මෙම පත්වීම් කොන්ත්‍රාත් පදනම මත සිදු කර ඇති අතර 2009 09.18 නැති අංක 29/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2019.09.30 දිනැති EC/EDR/PRE/INQ දරන මැතිවරණ කොමිෂන් සභා චක්‍රලේඛය අනුව අභ්‍යන්තර විගණකගේද නිර්දේශය මත අදාළ අයගේ සේවය ස්ථිර කර ඇත. ආර් ලෝගනාදන් යන අය මේ වන විට සේවයේ නොමැත.

vii ජී.කේ.ආර්.බී කිරිඇල්ල මහතා - වතු අධිකාරි

ඉහත නම් සඳහන් අයගේ සේවය ස්ථිර කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත.

2020 පෙබරවාරි 28 දිනෙන් පසුව ආයතනයේ සියලුම පත්කිරීම් හා උසස් කිරීම් විධිමත් පටිපාටි අනුගමනය කරමින් හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සිදු කර ඇත.

(ඉ) ආයතනය විසින් සකස් කරන ලද කෙටුම්පත් බඳවා ගැනීමේ පටිපාටිය වැවිලි අමාතත්‍යාංශයේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් මත අවස්ථා 03 කදී සංශෝධනය කරන ලදි. ඒ අනුව සංශෝධිත

බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යැවීම සඳහා 2021.12.14 දිනැති ලිපිය මඟින් වැවිලි අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අතර එය වැවිලි අමාත්‍යාංශය විසින් 2022.01.28 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සංස්ථා නිලධාරීන් මේ වන විට මෙම කෙටුම්පත් බඳවාගැනීම පටිපාටිය පිළිබඳ සාකච්ඡා කිහිපයක්ම පවත්වා ඇති අතර ඒ අනුව මෙම බඳවා ගැනීම් පටිපාටිය අනුමත කිරීමේ අවසන් අවස්ථාවට පැමිණ ඇති බව දන්වා සිටින්නෙමු.

(ඊ) 2017 මැයි මස වන විට සංස්ථාව ලාභ ලබා තිබූ බවට වාර්තා කර තිබීම හේතුවෙන් සේවක දිරිගැන්වීමක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත උක්ත වැටුප් වර්ධක ලබා දී ඇත. 2018 හා 2019 වර්ෂවලදී අමතර වැටුප් වර්ධක ලබාදීමක් සිදුවී නොමැති අතර මේ වන විට කාර්ය මණ්ඩල වැටුප් වර්ධක ලබා දීම විධිමත් පරිදි සිදුකරන බව දන්වා සිටින්නෙමු.

(උ) වතුවල සේවා අවශ්‍යතාවය අනුව මෙම පත්කිරීම් සිදුකර ඇත.

3.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) වතුයායන් 12 ක අනවසර පදිංචිකරුවන් ලෙස පදිංචිව සිටින අය අතරින් ගෝමර රාජ්‍ය වතුයායේ එම්.එච් සහබන්දුගේ වයලට්නෝනා යන අය භුක්ති විඳිමන් සිටි භූමිය නැවත භාර ගැනීම සිදු කර ඇත. වලහන්දුව වතුයායේ ඩී.වී ධර්මසිරි යන අය විසින් අනවසරයෙන් පදිංචිව සිටි ඉඩම් සම්බන්ධයෙන් ගාල්ල සිවිල් අභියාචනාධිකරණ ලබා දුන් තීන්දුවට එරෙහිව එම පාර්ශවය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඇපෑලක් ගොනුකර ඇත. අනෙක් සියලු වතුයායන්හි අනවසර පදිංචිකරුවන් නෙරපීම සඳහා අදාළ අධිකරණවල නඩු පවරා ඇත.

(ආ) ආයතනය විසින් බදු දී ඇති ඉඩම් හා එම බදු ගිවිසුම් සම්බන්ධයෙන් නැවත පරීක්ෂාවක් මේ වන ආරම්භ කර ඇති අතර එම පරීක්ෂණයේදී අනාවරණය වන කරුණු අනුව ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරන්නෙමු.

(ඇ) සංස්ථාවට අයත් ගම්මඩුව වතුයායෙන් රූඩ්.2 පර්.2.87 ක් හා හුන්නස්ගිරිය වතුයායෙන් රූඩ්.2 පර්.2.01 ක් ස්වාධීන රූපවාහිනී ආයතනය වෙත 1996 වර්ෂයේදී බදු දී ඇති අතර මේ සම්බන්ධයෙන් බදු ගිවිසුමක් අත්සන් කර නොමැත. එම ආයතනය බදු ගිවිසුමක් අත්සන් කර ගැනීම සඳහා එකඟ කර ගැනීම වෙනුවෙන් එම ආයතනය වෙත 2020.12.23 හා 2021.10.22 දිනැතිව ලිපි යවා ඇති අතර ඒ සම්බන්ධයෙන් මේ දක්වා යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. එබැවින් වැවිලි අමාත්‍යාංශයේ සහාය ඇතිව මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට අපේක්ෂා කරන බව දන්වා සිටින්නෙමු.

(ඈ) ආයතනයේ වාහන ධාවනයේ යෙදෙන අවස්ථාවල එක් එක් ගමන්වාර අවසානයේදී ගමනේ යෙදුන නිලධාරියා විසින් වාහන ධාවන සටහන් අත්සන් නොකර තිබූ අවස්ථාවන් පැවතීම හේතුවෙන් එම තත්වයන් වළක්වා ගැනීම සඳහා කටයුතු කරන ලෙස රියදුරු මහතුන් කැඳවා අවවාද කරන ලදි.

සංස්ථාව විසින් භාවිතා කරනු ලබන බොහෝ වාහන වසර 35 ක් පමණ පැරණි ඒවා වන අතර එම වාහනවල මයිලෝමීටර නිසි පරිදි ක්‍රියා නොකරයි. එබැවින් එම වාහනවල මයිලෝමීටර නිසි පරිදි අලුත්වැඩියා කර ඒ අනුව ඉන්ධන තුලනය කිරීම් සිදු කරන ලෙස සියළු රියදුරු මහතුන් දැනුවත් කර ඇති අතර, මෙම කාර්යයන් නිසි ලෙස සිදුවේද යන්න පිළිබඳව ප්‍රවාහන අංශයේ නිලධාරි විසින් අධික්ෂණය කරන බව දන්වා සිටින්නෙමු.